

# අභියෝග ජයගනිමින් සෞභාග්‍යය කරා

**සංවර්ධන ලොතරැයි මණ්ඩලය**

වාර්ෂික වාර්තාව 2022

# අභියෝග ජයගනිමින් සෞභාග්‍යය කරා

සංවර්ධන ලොතරැයි මණ්ඩලය පරිවර්තනීය වර්ධනයේ 39 වැනි වසර සමරයි. මෙසේ, අපගේ ගමන්මඟ සැලකිය යුතු ජයග්‍රහණ සනිටුහන් කරයි.
මෙහෙයුම් පරිසරය තුළ පෙර නොවූ විරූ අභියෝග හමුවේ අපගේ ආයතනික ඉතිහාසය තුළ ඉහළම ලාභදායි මට්ටම වාර්තා කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය සාර්ථක විය.

අපගේ ගනුදෙනුකරුවන්ගේ අපේක්ෂාවන් සමඟ වෙනස් වෙමින්, නවමාන සහ ලොතරැයිවලට වටිනාකම නිර්මාණය කරමින් සමස්ථ පාරිභෝගික අත්දැකීම නැවත සකස් කිරීම තුළ අපි සාර්ථක වී ඇත.

# අන්තර්ගතය


ආයතනික තොරතුරු | 04

අපගේ දැක්ම සහ මෙහෙවර | 05

අපගේ ඉතිහාසය සැකෙවින් | 06

වැදගත් සංධිස්ථාන | 08

මූල්‍යමය වැදගත් සිදුවීම් | 10

සභාපතිතුමාගේ පණිවුඩය සහ ප්‍රගති වාර්තාව 2022 | 12

අධ්‍යක්ෂ මණ්ඩලයේ සමාලෝචනය | 14

අධ්‍යක්ෂ මණ්ඩලය – 2022 | 15

වර්තමාන අධ්‍යක්ෂ මණ්ඩලය | 16

සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩලයේ විස්තර | 17

කළමනාකරණ කණ්ඩායම | 18

කණිෂ්ඨ කළමනාකරුවන් | 19

මෙහෙයුම් සමාලෝචනය | 20

නිෂ්පාදන කළඹ පිළිබඳ විශ්ලේෂණය | 24

තිරසාරභාවය පිළිබඳ වාර්තාව | 30

2022 ·12 · 31 දිනට අනුමත සේවක සංඛ්‍යාව | 33

ආයතනික පාලනය | 35

අවදානම් කළමනාකරණ වාර්තාව | 39

විගණන සහ කළමනාකරණ කමිටු වාර්තාව | 40

**මූල්‍ය වාර්තා**

ස්වාධීන විගණකවරුන්ගේ වාර්තාව | 42

විගණක වාර්තාව 2022 සහ කළමනාකාරීත්වය විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග | 53

විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය | 59

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය | 60

මුදල් ප්‍රවාහ ප්‍රකාශනය | 61

හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය | 62

ගිණුම්කරණ ප්‍රතිපත්ති | 63

අංශමය වාර්තාව | 68

අවසන් ගිණුම් පිළිබඳ සටහන් | 70

දස වසරක සාරාංශය | 80


ඩිජිටල් පිටපත

*This Annual Report can be accessed through our website*

# ආයතනික තොරතුරු

**මණ්ඩලයේ නම**

සංවර්ධන ලොතරැයි මණ්ඩලය

**නීතිමය ස්වරූපය**

මෙම මණ්ඩලය 1997 අංක 20 දරණ සංවර්ධන ලොතරැයි මණ්ඩල පනත නැමති පාර්ලිමේන්තු පනත යටතේ සංස්ථාගත කර ඇත.

**ආරම්භ කළ දිනය**

1983 ජනවාරි 19 දින

**ලියාපදිංචි කාර්යාලය**

අංක 356, ආචාර්ය කොල්වින් ආර් ද සිල්වා මාවත, යුනියන් පෙදෙස, කොළඹ 02.

**දුරකථනය**

0112 333 546-8, 0114 824 824

**ෆැක්ස්**

0112 333 545

**විද්‍යුත් තැපෑල**

info@dlb.lk

**වෙබ් අඩවිය**

www.dlb.lk

**බදු හඳුනා ගැනීමේ අංකය**

409089844

**වර්තමාන අධ්‍යක්ෂ මණ්ඩලය**

අජිත් ගුණරත්න නාරගල මහතා - සභාපති/ප්‍රධාන විධායක නිලධාරී

ඩබ්ලිව්. ඒ. සරත් කුමාර මහතා
භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්, මුදල් අමාත්‍යංශය
ජනාධිපති ජ්‍යෙෂ්ඨ අතිරේක ලේකම්
ලේකම්, ජනාධිපති අරමුදල
අධ්‍යක්ෂ, සංවර්ධන ලොතරැයි මණ්ඩලය

කේ. ඒ. එච්. සී. පුබුදුසිරි මෙනවිය
අධ්‍යක්ෂ, විදේශ සම්පත් දෙපාර්තමේන්තුව, මුදල් අමාත්‍යංශය
අධ්‍යක්ෂ, සංවර්ධන ලොතරැයි මණ්ඩලය

ජෙනට් ජයවර්ධන මහත්මිය - නීතිඥ
අධ්‍යක්ෂ, සංවර්ධන ලොතරැයි මණ්ඩලය

**විගණක**

විගණකාධිපති

**බැංකුරුවන්**

මහජන බැංකුව
ලංකා බැංකුව
සම්පත් බැංකුව
හැටන් නැෂනල් බැංකුව

# අපගේ දැක්ම සහ මෙහෙවර

## දැක්ම

"ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම වාසනාව උදා කිරීමේ රාජ්‍ය ආයතනයක් බවට පත්වීම."

## මෙහෙවර

"නවීන තාක්ෂණය යොදා ගනිමින්, නව්‍යතාවයෙන් යුතු ආකර්ශනීය ලොතරැයිපත් ඉදිරිපත් කරමින් විශ්වාසය තහවුරු කරන අතරතුර සෑම කල්හිම පාර්ශවකරුවන්ගේ අපේක්ෂාවන් සපුරාලීම."

## ඉලක්ක

| | | | |
|---|---|---|---|
| වෙළෙඳපොළ කොටස වැඩි කර ගැනීම. | ජනාධිපති අරමුදලට ලබා දෙනු ලබන දායකත්වය උපරිම කිරීම. | නවීන තාක්ෂණය අත්කර ගැනීම සහ ඵලදායී ලෙස උපයෝගී කර ගැනීම. | පාර්ශවකරුවන්ගේ අපේක්ෂාවන් ඉටු කිරීම. |

## අපගේ මූලික සාරධර්ම

| | |
|---|---|
| **සුපිලිපන්බව** | අප විසින් ඉදිරිපත් කරන ලොතරැයි හා අප ව්‍යාපාරික කටයුතුවල නිරත වන ආකාරය සාධාරණ, අවංක සහ විශ්වාසනීය වේ. |
| **සුභවාදී ආකල්පය** | ලොතරැයි ව්‍යාපාරය පවත්වාගෙන යාමේදී ඔවුන් හට මුහුණපෑමට සිදුවන සෑම අභියෝගයකටම සුභවාදී එළඹුමක් සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ සේවකයින් තුළ පවතී. |
| **ප්‍රතිඵලදායක බව** | ස්වකීය කාර්යභාරයන් පිළිබඳව සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ සේවකයන් තුළ මනා විශ්වාසයක් පවතින අතර ඔවුන් දෙන ලද ඉලක්ක කාර්යක්ෂමව (Effective Manner) අත්පත් කර ගැනීම සඳහා නිසි අවධානයකින් යුතුව කටයුතු කරති. |
| **නව්‍යතාවය** | සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ සේවකයින් ව්‍යාපාරික සංවර්ධනය සඳහා වන අදහස් සොයා යමින් තරඟකාරී වෙළඳපොළ වෙනස්වීම් හමුවේ කඩිනමින් ප්‍රතිචාර දක්වති. |
| **කණ්ඩායම් හැඟීම** | සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ සේවකයින් විවෘතභාවය එකිනෙකා කෙරෙහි ගෞරවය සහ පුද්ගල සංවර්ධනය ඔස්සේ ආයතනික ඉලක්ක සපුරාගැනීමෙහිලා එකාවන්ව කටයුතු කරති. |
| **විශිෂ්ඨත්වය කරා නැඹුරුවීම** | සංවර්ධන ලොතරැයි මණ්ඩල සේවකයන් අඛණ්ඩවම සිය සේවා තත්ත්වයන් උපරිම මට්ටම කරා රැගෙන ඒම සඳහා කැපවීමෙන් ක්‍රියා කරති. |

# අපගේ ඉතිහාසය සැකෙවින්

අද දැයක ජීවිත එළිය කරන සංවර්ධන ලොතරැයි මණ්ඩලය එදා 1983 වර්ෂයේදී ස්ථාපිත කරනු ලබන්නේ සංවර්ධන ලොතරැයි මධ්‍යස්ථානය ලෙසයි. මෙරට සුවහසක් ජන ජීවිත සඳහා ශක්තියක් වන ජනාධිපති අරමුදලත් දුෂ්කරතාවයන් මධ්‍යයේ උසස් අධ්‍යාපනයට යොමුවන සිසු දරුදැරියන්ට අස්වැසිල්ලක් වන මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදලත් සඳහා අරමුදල් සැපයීම එය පිහිටුවීමේ මුඛ්‍ය අරමුණු විය.

එම මුඛ්‍ය ධාරණාවන්ට අමතරව විවිධ මූල්‍ය හා සමාජ සංවර්ධන වැඩසටහන් රැසක් සඳහා අරමුදල් යෙදවීම පිණිස අඛණ්ඩ ආදායම් උත්පාදන යෝජනා ක්‍රමයක් ස්ථාපනය කිරීමට අපේක්ෂා කළ ආචාර්ය වික්‍රම වීරසූරිය මහතා, ක්ෂණික ලොතරැයි යෝජනා ක්‍රමයක් හඳුන්වා දීම සඳහා පෞද්ගලික හා රාජ්‍ය ආයතන ගණනාවක සහාය ඉල්ලා සිටියේය.

එම ඉල්ලීම වෙත යහපත් ප්‍රතිචාර දක්වමින් එවකට ජනාධිපතිව සිටි අතිගරු ජේ.ආර්.ජයවර්ධන මහතා විසින් රුපියල් මිලියන 2.2 ක මුදලක් ලබාදීමට කටයුතු කළ අතර අමාත්‍ය ලලිත් ඇතුලත්මුදලි මහතා විසින්ද ඒ හා සමාන මුදලක් මහපොළ උසස් අධ්‍යාපන අරමුදලෙන් ආයෝජනය කිරීමට එකඟ විය.

ඒ අනුව, අරමුදලෙහි ස්ථිරසාරභාවය උදෙසා අලෙවි කරන ලද මුල්ම ලොතරැයිය "සංවර්ධන ලොතරැයි" යනුවෙන් නම් කරන ලද අතර එම උත්සාහයන් සියල්ල අවසානයේ ජනාධිපති අරමුදලටත්, මහපොළ භාරකාර අරමුදලටත්, අරමුදල් සැපයීම අරමුණු කර ගනිමින් සංවර්ධන ලොතරැයි මධ්‍යස්ථානය ස්ථාපනය කරන ලදී.

1993 වර්ෂයේදී සංවර්ධන ලොතරැයි මධ්‍යස්ථානය "සංවර්ධන ලොතරැයි භාරය" ලෙස නාමකරණය කළ අතර 1997 අගෝස්තු 12 වැනි දින වර්තමානයේදී අප භාවිතා කරන "සංවර්ධන ලොතරැයි මණ්ඩලය" ලෙස පාර්ලිමේන්තු පනතක් මගින් යලි ස්ථාපනය කරන ලදී.

"සංවර්ධන ලොතරැයිය" නමින් හැඳින්වූ පළමු ක්ෂණික ලොතරැයිපත රු.10/= බැගින් වූ මුදලකට දිවයින පුරා අලෙවි කරන ලද අතර, පැය 24ක් ඇතුළත සුපිරි ජයමලු ජයග්‍රාහකයින් දෙදෙනෙකු බිහිකරන්නට සමත්වීම අද දක්වාම අපගේ ක්ෂණික ලොතරැයිපත් කෙරෙහි ජනප්‍රියත්වය වැඩි කිරීමට මග පෑදුවේය.

ලොතරැයි කර්මාන්ත ඉතිහාසය තුළ පළමු වරට, ශනිදා වාසනාව නමින් ලොතරැයි වැඩසටහනක් රූපවාහිනිය විකාශනය කරන ලදී. එය ආරම්භයේදී සෙනසුරාදා දිනවල පමණක් පවත්වන ලදී. කෙසේවෙතත්, එහි ජනප්‍රියතාවය ලැබීමෙන් පසු, එය සතියේ දින හතේදීම විකාශනය කරන ලදී. තවද, ක්ෂණික ලොතරැයි වලින් ජයග්‍රහණය හිමි නොවූ ටිකට්පත් සඳහාම විශේෂයෙන් සකස් කරන 1998 ජනවාරි 25 වන දින ආරම්භ කරන ලද වාසනා චක්‍රය ලොතරැයි වැඩසටහන ඉරිදා දිනවල රූපවාහිනිය ඔස්සේ විකාශනය කරන ලදී.

සංවර්ධන ලොතරැයි මධ්‍යස්ථානය ක්ෂේත්‍රය තුළ එහි ගමන්මග ආරම්භ කිරීම මත, එහි පළමු වසර තුළ ආර්ථික ඉලක්ක කරා සාර්ථකව දායක වූ අතර පසුගිය කාලසීමාව තුළ සැලකිය යුතු ජයග්‍රහණයක් අත්කරගෙන ඇති සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ ශුද්ධ ලාභය ජනාධිපති අරමුදලට සහ මහපොළ ශිෂ්‍යත්ව අරමුදලට ප්‍රේෂණය කරන ලදී. එතැන් සිට, සංවර්ධන ලොතරැයි මණ්ඩලය එහි ලාභයෙන් විශාලතම කොටස ජනාධිපති අරමුදලට ප්‍රේෂණය කර ඇති අතර ඒ අනුව ජනාධිපති අරමුදල ඉන් 50%ක් මහපොළ ශිෂ්‍යත්ව අරමුදලට වෙන් කර ඇත.

මෙම වැඩසටහන සඳහා ඉතා ඉහළ ප්‍රතිචාරයක් ලැබීම හේතුවෙන් සංවර්ධන ලොතරැයි මණ්ඩලය 1998 වසරේදී තවත් පියවරක් ගනිමින් සංවර්ධන වාසනාව නමින් රූපවාහිනිය ඔස්සේ දිනුම් අදින දෙවන ලොතරැයිය හඳුන්වා දුන් අතර එය අඟහරුවාදා හා සිකුරාදා දිනවල විකාශය කරන ලදී. එහි අලෙවිය සැලකිල්ලට ගනිමින්, 2015 වර්ෂයේදී සුවිශේෂ ලග්න අංගය හේතුකරගෙන එය ලග්න වාසනා නමින් නැවත නම් කරන ලදි. මේ වන විට එම ලොතරැයිය සතියේ දින හතේම දිනුම් අදිනු ලබන ආකර්ෂණීය ලොතරැයියකි.

නියමිත සුපිරි ජයමල්ල ත්‍යාග සහ සාමාන්‍ය මුදල් ත්‍යාග ලොතරැයි වලට අමතරව සංවර්ධන ලොතරැයි මණ්ඩලය 2004 ජනවාරි 26 වන දින ජයෝදා නමින් දිනුම් ඇදීමක් දියත් කළ අතර එය සඳුදා සහ බ්‍රහස්පතින්දා දිනවල රූපවාහිනිය ඔස්සේ විකාශනය විය. එහි සුපිරි ජයමල්ල රුපියල් මිලියන 10 ක ආරම්භක මුදලකින් ආරම්භ විය. ශ්‍රී ලංකා ලොතරැයි ඉතිහාසයේ සුවිශේෂී පියවරක් තබමින් සංවර්ධන ලොතරැයි මණ්ඩලය ජයෝදා සුපිරි ජයමල්ල ජයග්‍රාහකයින්ට රුපියල් මිලියන 10ක ත්‍යාගය හෝ රුපියල් මිලියන 10කට අධික වටිනාකමකින් යුතු නිවසක් තෝරා ගැනීමට අවස්ථා හිමිකර දුන්නේය.

සංවර්ධන ලොතරැයි මණ්ඩලය 2009 අප්‍රේල් 10 වැනි දින "ජන ජය" ලොතරැයිය එළිදැක්වූ අතර, එය බ්‍රහස්පතින්දා සහ ඉරිදා දිනවල විකාශනය කරන ලදී. වාසනාවන්තයින් සුපිරි ත්‍යාගය දිනා ගැනීම සඳහා අංක 64 අතරින් තෝරා ගනු ලබන ජයග්‍රාහී අංක 04 සමග තවත් යන්ත්‍රයකින් තෝරා ගනු ලබන සුපිරි අංකය ගැලපිය යුතුය. මෙහි මූලික සුපිරි ත්‍යාග මුදල රුපියල් මිලියන 2.5 කි.

2012 ජූලි 11 වන දින "සුපර් බෝල්" ලොතරැයිය හඳුන්වා දීම මෙරට ලොතරැයි ඉතිහාසයේ පෙරළිකාර සන්ධිස්ථානයක් සනිටුහන් කළේය. රුපියල් කෝටි 03ක සුපිරි ජයමල්ලකින් ආරම්භ වූ මෙම සුවිශේෂී ලොතරැයිය එම කාල සීමාවේ මෙරට විශාලතම සුපිරි ත්‍යාග මුදල තිළිණ කළ ලොතරැයිය විය. අද එය දිනපතාම දිනුම් අදින ලොතරැයියක් ලෙස වෙළෙඳපොල තුළ ඉතා ජනප්‍රිය වී ඇත.

2016 වර්ෂයේදී සංවර්ධන ලොතරැයි මණ්ඩලය විසින් නව ලොතරැයි වර්ග ගණනාවක් වෙළෙඳපොලට හඳුන්වා දුන්නේය. මේ සමඟම, සංවර්ධන ලොතරැයි මණ්ඩලය 2016 මැයි 14 වැනි දින ලක්ෂපති ලොතරැයිය දියත් කළ අතර එය මිලියන 5.6 ක සුවිශේෂී අලෙවියක් වාර්තා කළේය.

එමෙන්ම රුපියල් මිලියන 75ක සුපිරි ජයමල්ලක් සමගින් 2016 අප්‍රේල් 08 වැනි දින දියත් කරන ලද "කෝටිපති ශනිදා" ලොතරැයියෙහි ආරම්භක විකුණුම් වටයේදීම ලොතරැයිපත් මිලියන 4.4 ක් වාර්තා කළේය. නව බලාපොරොත්තු සහ මුදල් ත්‍යාග තුනක් සමඟින් හඳුන්වා දෙන ලද "සංවර්ධන වාසනාව" රූපවාහිනී ලොතරැයි දිනුම් ඇදීම 2016 දෙසැම්බර් 12 වැනි දින නැවත දියත් කරන ලදී. ඊට අමතරව, ශ්‍රී ලාංකික

ලොතරැයි ඉතිහාසයේ සතියේ දින හතේදීම දිනුම් අදිනු ලබන පළමු ලොතරැයිය ලෙස 2017 අගෝස්තු 31 වැනි දින “අද කෝටිපති” ලොතරැයිය හඳුන්වා දෙන ලදී.

තවද සංවර්ධන ලොතරැයි මණ්ඩලය එහි කාර්යයන් යාවත්කාලීන කරමින් සහ ලොතරැයි ව්‍යාපාරයේ උන්නතිය උදෙසා නව තාක්ෂණය භාවිතා කරමින්, 2020 වර්ෂයේදී තම පාරිභෝගිකයින් වෙත ඔවුන්ගේ ස්මාර්ට් දුරකථනය හරහා ලොතරැයිපතක් මිලදී ගැනීමේ ඉඩ හසර විවෘත කර දී ඇත. මෙම අරමුණ සඳහා "DLB Sweep App" යෙදුම හඳුන්වා දී ඇත. එම හඳුන්වා දීමත් සමග සංවර්ධන ලොතරැයි මණ්ඩලය විසින් මෙරට නව වෙළෙඳපොලක් ඉලක්ක කර ගනිමින් දකුණු ආසියාවේ ප්‍රථම ඩිජිටල් ලොතරැයිය වන ''සසිරි'' ලොතරැයිය හඳුන්වා දීම සිදුකරන ලදී.

ලොතරැයි නව්‍යකරණයේ තවත් මානයන් සොයා යන්නට යුහුසුළු වූ සංවර්ධන ලොතරැයි මණ්ඩලය 2021 වර්ෂයේදී ලොතරැයි දිනුම් ඇදීමේ වැඩසටහනටද නව මුහුණුවරක් හා රිද්මයක් එකතු කරන්නේ පැරණි දිනුම් ඇදීමේ වැඩසටහන් ආකෘතියට නිමා තබමිනි. 2021 මාර්තු 1 දින, මෙම පරිණාමයේ කොටසක් ලෙස ඉතා කෙටි කාලසීමාවක් තුළ එක පෙළට දිනුම් ඇදීම් වැඩසටහන් සියල්ලම විකාශනය වන පරිදි “DLB Lottery Show” වැඩසටහන හඳුන්වාදෙන ලදී. මෙම වෙනසට සමගාමීව DLB Lottery Show නමින් You Tube නාලිකාවක් ද ආරම්භ කරන ලදී.

තවද කෝටිපති කප්රුක ලොතරැයිය රුපියල් මිලියන 120 ක ආරම්භක සුපිරි ජයමල්ලක් සහ අතිශය ආකර්ෂණීය නව ත්‍යාග රටාවක් සමඟ “කප්රුක” ලෙස නව මුහුණවරකින් සතියේ දින හතේම දිනුම් අදින ලොතරැයියක් ලෙස වෙළෙඳපොලට නිකුත් කිරීම 2021 දෙසැම්බර් මස 02 වනදා සිදුකරන ලද අතර ඒ අනුව දිනකට දිනුම් අදිනු ලැබූ ලොතරැයිපත් සංඛ්‍යාව හයක් විය.

එමෙන්ම උතුරු හා නැගෙනහිර පළාත්වල පාරිභෝගිකයින් ඉලක්ක කරමින් 2022 සැප්තැම්බර් 9 (සිකුරාදා) දින වාසනාවේ සංකේතයක් වන “වාලම්පුරි” නාමය යටතේ නව ලොතරැයිපතක් වෙළෙඳපොලට හඳුන්වා දෙන ලදී. කෙසේවෙතත්, එහි ජනප්‍රියතාව හේතුවෙන් සමස්ත දිවයිනටම “වාලම්පුරි” හඳුන්වාදීමට කළමනාකාරිත්වය විසින් පසුකාලීනව තීරණය කරන ලදී.

සංවර්ධන ලොතරැයි මණ්ඩලය පිහිටුවනු ලබන්නේ උත්තරීතර අරමුණු ද්විත්වයක් පෙරදැරි කර ගනිමිනි. ඒ ජනාධිපති අරමුදලටත්, මහපොළ භාරකාර අරමුදලටත් අරමුදල් සැපයීම අරමුණු කර ගනිමිනි. එබැවින් සංවර්ධන ලොතරැයි මණ්ඩලය තම සියලු ලාභයන් බැර කරන්නේ ජනාධිපති අරමුදල වෙතයි. මෙරට ජනතාව ලොතරැයියක් වෙනුවෙන් වැය කරනු ලබන රුපියල් විස්ස නැවතත් වාසනාවක් බවට පත් කරමින් දිනුම් අවස්ථාද, රට වෙනුවෙන් යුතුකමද ඉටුකරන සංවර්ධන ලොතරැයි මණ්ඩලය පසුකළ අවුරුදු 39 ක කාලය තුළ ජනධිපති අරමුදලට රුපියල් බිලියන 36කට අධික මුදලක් ප්‍රේෂණය කර ඇත.

# වැදගත් සංධිස්ථාන

**1983**

**ශ්‍රී ලංකාවේ ප්‍රථම වරට ක්ෂණික දිනුම් ලොතරැයියක් හඳුන්වා දෙන ලදී.**

**1987**

මෙරට පළමු රූපවාහිනී දිනුම් ඇදීම වන '**ශනිදා වාසනාව ලොතරැයිය**' හඳුන්වාදීම.

**1993**

'සංවර්ධන ලොතරැයි මධ්‍යස්ථානය' 'සංවර්ධන ලොතරැයි භාරය' බවට පරිවර්තනය වීම.

**1997**

'සංවර්ධන ලොතරැයි භාරය' 1997 අංක 20 දරණ සංවර්ධන ලොතරැයි මණ්ඩල පනත යටතේ රජයට හිමි සංස්ථාපිත ආයතනයක් ලෙස 'සංවර්ධන ලොතරැයි මණ්ඩලය' නමින් ස්ථාපනය කිරීම.

**රුපියල් බිලියන 2 ක සමස්ත පිරිවැටුම් මට්ටමක් ලඟා කර ගන්නා ලදී.**

**1998**

ජයග්‍රහණ හිමි නොවූ ක්ෂණික/සුරන ලොතරැයිපත් සඳහා 'වාසනා චක්‍රය' රූපවාහිනී දිනුම් ඇදීම නැවත දියත් කිරීම

**ප්‍රථම ත්‍යාගය ලෙස සුපිරි සුඛෝපභෝගී මෝටර් රථයක් පිරිනමමින් රු. 10 ක මුදලකට අලෙවි කරන 'වින්ඩෝස්' සහ රු. 100 ක මුදලකට 'යුරේකා' ක්ෂණික ලොතරැයි සමග 'සංවර්ධන වාසනා ලොතරැයිය' හඳුන්වා දෙන ලදී.**

**1999**

වර්ෂ 2000 දී එල්ල වන තාක්ෂණික අභියෝගයන්ට මුහුණ දීම පිණිස ලෝක බැංකුවේ සහාය ඇතිව පරිගණක පද්ධතිය යාවත්කාලීන කරන ලදී.

**2004**

සංවර්ධන ලොතරැයි මණ්ඩලය විසින් හඳුන්වා දෙන ලද පුරෝගාමී අංගයක් වන මුදල් ත්‍යාගයක් හෝ නිවසක් යන විකල්ප සහිතව '**ජයෝදා**' ලොතරැයිය දියත් කරන ලදී.

**රුපියල් බිලියන 3 ක සමස්ත පිරිවැටුමක් අත් කරගන්නා ලදී.**

**2008**

අංක 356, ආචාර්ය කොල්වින් ආර් ද සිල්වා මාවත, කොළඹ 02 හි පිහිටි සංවර්ධන ලොතරැයි මණ්ඩලයට ම අයත් ගොඩනැගිල්ල වෙත මණ්ඩලය රැගෙන යන ලදී.

**රුපියල් බිලියන 5 ක සමස්ත පිරිවැටුමක් අත්කර ගන්නා ලදී.**

**2010**

**සුපිරි ජයමල්ලක්** සමග '**ජන ජය**' දිනුම් අදින ලොතරැයිය හඳුන්වාදීම.

**2011**

'**නියත ජය**' දිනුම් අදින ලොතරැයිය ආරම්භ කිරීම.

**2012**

**රුපියල් මිලියන 30 ක** සුපිරි ජයමල්ලක් සමග '**සුපර් බෝල්**' දිනුම් අදින ලොතරැයිය' හඳුන්වා දීම.

**2013**

ඉහළම වටිනාකම සහිත ජයමල්ලක් සමග **'හයිවේ ඩ්‍රීම්'** ලොතරැයිය හඳුන්වා දීම.

**2014**

**කෙටි පණිවුඩ සේවාව ඔස්සේ ලොතරැයි අලෙවි කිරීමේ ක්‍රමය දියත් කරන ලදි.**

**2016**

'**සංවර්ධන ලක්ෂපති**' '**කෝටිපති ශනිදා**' සහ '**සංවර්ධන වාසනාව**' යන ලොතරැයි ආරම්භ කිරීම.

**2017**

**'අද කෝටිපති'** ලොතරැයිය හඳුන්වා දීම.

**2018**

IVR සහ **කෙටි පණිවුඩ සේවාව** ඔස්සේ ප්‍රතිඵල දැනුම්දීමේ ක්‍රමවේදය දියත් කරන ලදි.

**2019**

**DLB Sweep App** යෙදවුම දියත් කිරීම.

**2020**

**'සසිරි' ඊ-ලොතරැයිය** හඳුන්වා දීම.

**2021**


ශ්‍රී ලංකාවේ ලොතරැයි ව්‍යාපාරයේ රු.මි. 120 ක් වූ ඉහළම වටිනාකම සහිත සුපිරි ජයමල්ල පිරිනමමින් '**කප්රුක**' ලොතරැයිය නැවත හඳුන්වා දීම.

**2022**


**'වාලම්පුරි'** ලොතරැයිය හඳුන්වා දීම.

# මූලයමය වැදගත් සිදුවීම්


**ආදායම (රු. මිලියන)**





**බදු පෙර ලාභය (රු. මිලියන)**





**ජනාධිපති අරමුදලට ලබා දුන් දායකත්වය (රු. මිලියන)**





**ආදායම් බදු (රු. මිලියන)**




**රජය වෙත ලබා දුන් මුළු ප්‍රේෂණ (රු. මිලියන)**




**මුළු වත්කම් (රු. මිලියන)**



| | 2022<br>රු. | 2021<br>රු. |
|---|---|---|
| **මෙහෙයුම් ප්‍රතිඵල** | | |
| ආදායම | 19,071,456,751 | 15,364,398,498 |
| දළ ලාභය | 7,591,995,984 | 6,523,212,978 |
| බදු පෙර ලාභය | 3,266,591,501 | 2,953,528,558 |
| බදු වියදම් | 55,904,459 | 83,440,185 |
| ශුද්ධ ලාභය | 3,225,653,361 | 2,875,951,381 |
| ජනාධිපති අරමුදලට ලබාදුන් දායකත්වය | 3,210,687,041 | 2,870,088,373 |
| | | |
| **මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය** | | |
| **වත්කම්** | | |
| දේපල, පිරියත හා උපකරණ | 1,095,292,917 | 1,158,675,958 |
| සේවක ප්‍රතිලාභ වත්කම් | - | - |
| ස්ථාවර තැන්පතු | 1,742,324,887 | 1,142,259,436 |
| තොග | 45,970,611 | 43,102,269 |
| වෙළෙඳ ණයගැතියෝ සහ ලැබියයුතු වෙනත් | 163,480,972 | 150,441,764 |
| පෙර ගෙවීම් සහ තැන්පතු | 6,223,428 | 11,141,943 |
| අතැති සහ බැංකුවේ ඇති මුදල් | 557,240,367 | 900,006,350 |
| **මුළු වත්කම්** | 3,610,533,182 | 3,405,627,719 |
| | | |
| **වගකීම්** | | |
| සේවක ප්‍රතිලාභ වගකීම් | (4,438,730) | (9,372) |
| අලෙවි නියෝජිත සහ බෙදාහැරීමේ අලෙවි නියෝජිත ගෙවිය යුතු තැන්පතු | 38,718,881 | 37,664,881 |
| ගෙවිය යුතු ණය වවුචර් | 123,353,560 | 130,268,260 |
| වෙළෙඳ සහ වෙනත් ගෙවියයුතු | 771,026,177 | 640,706,596 |
| ජනාධිපති අරමුදලට ගෙවිය යුතු | 315,791,041 | 564,219,473 |
| ගෙවිය යුතු ත්‍යාග | 1,003,306,515 | 962,793,104 |
| | | |
| **හිමිකම්** | | |
| ජනාධිපති අරමුදල | 2,200,000 | 2,200,000 |
| මහපොළ භාරකාර අරමුදල | 2,200,000 | 2,200,000 |
| ත්‍යාග සංචිත ගිණුම | 725,956,289 | 448,131,648 |
| ප්‍රත්‍යාගණන අතිරික්තය | 620,583,095 | 614,729,237 |
| සේවක ප්‍රතිලාභ සැලැස්ම නැවත මිනුම් කිරීමේ ලාභය/(අලාභය) | 11,836,354 | 2,723,891 |
| **මුළු හිමිකම් සහ වගකීම්** | 3,610,533,182 | 3,405,627,719 |
| | | |
| **ලාභදායිත්ව අනුපාත** | | |
| ශුද්ධ ලාභ අනුපාතය | 17% | 19% |
| දළ ලාභ අනුපාතය | 40% | 42% |
| | | |
| **ද්‍රවශීලතා අනුපාත** | | |
| ජංගම වත්කම් අනුපාතය | 1 : 1.33 | 1 : 1.30 |
| ක්ෂණික (ද්‍රවශීලීතාවයෙන් යුත්) වත්කම් අනුපාතය | 1 : 1.30 | 1 : 1.27 |

# සභාපතිතුමාගේ පණිවුඩය සහ ප්‍රගති වාර්තාව 2022

පෙර නොවූ විරූ ආර්ථික අර්බුදයක් මධ්‍යයෙහි වුවද සංවර්ධන ලොතරැයි මණ්ඩලය ස්වකීය ක්‍රියාශීලී වැඩ පිළිවෙල ක්‍රියාත්මක කිරීම තුළින් තම ඉලක්ක වෙත සමීප වීමට හැකි වී තිබේ.

## වර්තමාන මූල්‍ය සමාලෝචනය - 2022

2022 වසර තුළ, රුපියල් මිලියන 19,755ක පිරිවැටුමක් අත්කර ගෙන ඇති බවත් එය පසුගිය වසරට සාපේක්ෂව 26%ට වැඩි ජයග්‍රහණයක් බවත් වාර්තා කිරීමට ලැබීම සම්බන්ධව අධ්‍යක්ෂ මණ්ඩලය සතුටට පත්වේ. කොවිඩ්-19 වසංගතය ආරම්භ වූ අවස්ථාවේ සිට, මූල්‍ය ජයග්‍රහණ සම්බන්ධයෙන් විශාල අවිනිශ්චිතතාවයක් පැවතුණි. කෙසේ වෙතත්, සංවර්ධන ලොතරැයි මණ්ඩලය අඛණ්ඩව සිය ගනුදෙනුකරුවන්ගේ විශ්වාසය දිනා ගෙන ඇති අතර, අභියෝගාත්මක තත්ත්වයන් හේතුවෙන් විකුණුම් ද ඉහළ ගොස් තිබේ. විකුණුම් අයවැය ආදායම රු.මි.19,212 ක් වුවද, තථ්‍ය ආදායම රු.මි.19,755 ක් වේ. අනෙක් අතට ජනාධිපති අරමුදලට ලබා දුන් තථ්‍ය දායකත්වය රු.මි.3,211 ක් වූ අතර, රජයට ලබා දුන් තථ්‍ය බදු දායකත්වය රු.මි.842 ක් විය.

| | 2021 | 2022 | විචලනය | % |
|---|---|---|---|---|
| ආදායම (රු.මි) | 15,730 | **19,755** | 4,025 | 26 |
| ජනාධිපති අරමුදලට ලබාදුන් දායකත්වය (රු.මි) | 2,870 | **3,211** | 341 | 12 |
| ජයග්‍රාහකයින්ට ලබා දුන් ත්‍යාග මුදල් (රු.මි.) | 7,866 | **9,884** | 2,018 | 26 |

## අපගේ ජයග්‍රහණ

විදේශ විනිමය අර්බුදය රට බරපතල ලෙස පීඩාවට පත්කර ඇති අවස්ථාවක, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ සහයෝගය අපි අපේක්ෂාවෙන් සිටින කාලයක, රජයේ වියදම සහ ආදායම් දැඩිව කළමනාකරණය වෙමින් පවතින අවස්ථාවක, සහ එමෙන්ම කොවිඩ් 19 වැනි බොහෝ අර්බුද හමුවේ, සංවර්ධන ලොතරැයි මණ්ඩලය සේවාවන් අඛණ්ඩව පවත්වාගෙන ඇති අතර පසුගිය වසරේ ආදායම් ඉලක්ක අත්කරගෙන ඇත.

එමෙන්ම. නිෂ්පාදන පිරිවැය සහ සමස්ථ පිරිවැය ඉහළ ගොස් ඇති අවස්ථාවක, සංවර්ධන ලොතරැයි මණ්ඩලය සුවිශේෂී ඉහළ කාර්ය සාධනයක් අත්කර ගැනීමට හැකි වී ඇත. වෙළෙඳපොල සැලසුම් සහ මූල්‍ය උපායමාර්ග ස්ථිරව යාවත් කිරීම මගින්, අපට අර්බුදය හමුවේ ඉදිරියට යාමට හැකි වූ අතර සතුටුදායක ප්‍රතිඵල අත්කරගෙන ඇත.

සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ ඉතිහාසය තුළ පළමු වරට, අපි රුපියල් බිලියන 3.2ක ලාභයක් උපයන ලද අතර එය මණ්ඩලයේ ඉතිහාසය තුළ මේ දක්වා ඉහළම දායකත්වය වන අතර එය තවත් එක් සංධිස්ථානයක් සනිටුහන් කළේය.

## අපගේ කණ්ඩායම

සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ උද්‍යෝගිමත් සහ ශක්තිමත් කණ්ඩායම අපගේ සාර්ථකත්වයේ ප්‍රධානතම අංගය වේ. අපගේ අලෙවි, මූල්‍ය, තොරතුරු තාක්ෂණ, ප්‍රසම්පාදන, විකුණුම්, පරිපාලන සහ අභ්‍යන්තර විගණන යන අංශවල කණ්ඩායම් අපගේ මෙම ගමනට සවිය ලබා දෙන පිරිස වේ. ඔවුන්ගේ නව්‍ය චින්තනය අපගේ නිෂ්පාදන ප්‍රමුඛ මට්ටමකට රැගෙන යමින්, ලොතරැයි අත්දැකීමට නව මානයන් එක්කරමින්, මණ්ඩලය ඉහළ තලයකට ඔසවා තබා ඇත.

## ආයතනික සමාජ වගකීම් ක්‍රියාකාරකම්

- සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ අලෙවි නියෝජිතයින්ගේ විශ්ව විද්‍යාල සඳහා තෝරාගෙන ඇති දරුවන්ට ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම සඳහා 2022 වර්ෂයේ දී රු. 565,500 ක් වැය කරන ලදී.

- එමෙන්ම. සංවර්ධන ලොතරැයි මණ්ඩලය විවිධ සෞඛ්‍ය ගැටලු වලින් පෙළෙන සහ කොවිඩ් වයිරසය ආසාදනය වූ මණ්ඩලයේ ලොතරැයි අලෙවි නියෝජිතයින් සහ අලෙවි සහායකයින් සඳහා සහ කොවිඩ් වසංගතය හේතුවෙන් මියගිය අයගේ පවුල්වල සාමාජිකයින් සඳහා 2022 වර්ෂයේදී රු. 6,072,130 ක් ලබා දී ඇත.

- සංවර්ධන ලොතරැයි මණ්ඩලය විසින් මහනුවර මහනගර සභාවේ නගරය අලංකරණය කරන සේවකයින් වෙත ඔවුන්ගේ සමාජ මෙහෙවර පිළිගනිමින් ටී-ෂර්ට් 100ක් බෙදාදෙන ලදී.

## අනුග්‍රහයන් සඳහා දායකත්වය සැපයීම්

වසර තුළ, සංවර්ධන ලොතරැයි මණ්ඩලය රුහුණු කතරගම මහා දේවාලයේ ඇසළ පෙරහැර සඳහා 2021 වර්ෂයේ දී රු.500,000ක්, මහනුවර ශ්‍රී දළදා පෙරහැර සඳහා රු.මි. 2ක්, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ රජ මහා විහාරයේ වාර්ෂික ශ්‍රී දළදා මහා පෙරහැර සඳහා රු.200,000ක් සහ බෙල්ලන්විල රජ මහා විහාරයේ 72වැනි වාර්ෂික ඇසළ පෙරහැර සඳහා රු.200,000ක් වශයෙන් අනුග්‍රාහකත්ව ලබා දුන්නේය.

## ඉදිරි දැක්ම

මණ්ඩලයේ 40 වැනි සංවත්සරය සැමරීම සඳහා නව ව්‍යාපාර ලාංඡනයක් හඳුන්වා දී ඇත.

උතුරු හා නැගෙනහිර පළාත්වල පාරිභෝගිකයින් ඉලක්ක කරමින් 2022 සැප්තැම්බර් 9 (සිකුරාදා) දින වාසනාවේ සංකේතයක් වන ''වාලම්පුරි'' නාමය යටතේ නව ලොතරැයි ටිකට් පතක් වෙළෙඳපොලට හඳුන්වා දෙන ලදී. කෙසේවෙතත්, එහි

ජනප්‍රියතාව හේතුවෙන් සමස්ත දිවයිනටම "වාලම්පුරි" හඳුන්වාදීමට කළමනාකාරිත්වය විසින් පසුකාලීනව තීරණය කරන ලද අතර මෙම දියත් කිරීම ඉදිරි වසරේදී සිදු කරනු ලැබේ. මෙය උතුරු නැගෙනහිර දෙමළ ජනතාව වෙනුවෙන් හඳුන්වා දී ඇත.

තවද, පොදු කාර්ය පිරිවැය, මුද්‍රණ වියදම සහ බදු වැඩිවීම හේතුවෙන් 2023 වසරේ සිට ක්‍රියාත්මක වන පරිදි ටිකට්වල මිල වැඩි කිරීමට උපායමාර්ගික තීරණයක් ගෙන ඇත.


## සමාප්ති සටහන

අප වෙත ලබා දුන් සහයෝගය සහ මගපෙන්වීම වෙනුවෙන් අතිගරු ජනාධිපතිතුමාටත්, ගරු අග්‍රාමාත්‍යතුමාටත්, ගරු මුදල් අමාත්‍යතුමාටත්, ගරු මුදල් රාජ්‍ය ඇමතිතුමාටත්, භාණ්ඩාගාර ලේකම්තුමාටත්, මාගේ කෘතඥතාවය පුද කර සිටිමි. පසුගිය වර්ෂවල මෙන්ම වර්තමානයේ ද ඉතා දක්ෂ හා කැපවීමෙන් යුතු අපගේ කාර්ය මණ්ඩලයේ සහාය ඇතිව, දැනුම ලබා ගනිමින් සහ බෙදා ගනිමින් අපගේ විවිධ පාර්ශ්වකරුවන් සමග එක්ව කටයුතු කිරීමට ලැබීම මහඟු අත්දැකීමක් විය.

අප කණ්ඩායම එකට එක්වී අපගේ ප්‍රජාවන්ට සහාය වන අතරම අපගේ ගනුදෙනුකරුවන්ට ද සුවිශේෂී සේවාවක් සපයා දී ඇත.

සියලු දිනුම් ඇදීම් අධීක්ෂණ මණ්ඩල සාමාජිකයන්ට, ජනාධිපති අරමුදලේ කාර්ය මණ්ඩලයට, මහපොළ උසස් අධ්‍යාපන භාර අරමුදලේ කාර්ය මණ්ඩලයට, බෙදාහැරීමේ අලෙවි නියෝජිතයන්ට, අලෙවි නියෝජිතයින්ට, අලෙවි සහායකයින්ට, ජනමාධ්‍ය වලට, බැංකුකරුවන්ට, සියලුම සේවා සපයන්නන්ට සහ සාමාන්‍යාධිකාරී, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීවරුන් සහ සහකාර සාමාන්‍යාධිකාරීවරුන් ඇතුළු අපගේ විධායක කාර්ය මණ්ඩලයේ සියලු දෙනාටත් මම මාගේ විශේෂ ස්තූතිය පුද කරමි. එමෙන් ම, අපි අමතර උත්සාහයන් දරමින් කැපවීමෙන් යුතුව කටයුතු කර, තම කාර්යභාරය මැනවින් ඉටු කරමින් අපගේ සාර්ථකත්වය උදෙසා දායකත්වය ලබා දෙන, සෑම කාණ්ඩයකටම අයත් අනෙකුත් සියලුම කාර්ය මණ්ඩල සාමාජිකයින්ව ද අමතක නොකරන්නෙමු. අපි සංවර්ධන ලොතරැයි මණ්ඩලයෙහි සිටීම අර්ථාන්විත කිරීමට ඔවුන් අපට සැබවින්ම සහාය වී ඇත. තවද අපගේ සේවාවන්ට අනුග්‍රහය දැක්වූ සියලුම පාරිභෝගිකයින්ට ද අපගේ ස්තූතිය පිරිනමන අතර, ඔවුන්ගේ අනුග්‍රහය නොලැබෙන්නට අපිට මෙම ජයග්‍රහණ ලබා ගැනීමට නොහැකි වනු ඇති බව ද සඳහන් කිරීමට කැමැත්තෙමු. එමෙන්ම, අප වෙත ලබා දුන් වටිනා දායකත්වය වෙනුවෙන් විගණන අධිකාරීවරයාට සහ විගණකාධිපති දෙපාර්තමේන්තුවට ද අපගේ ස්තූතිය පිරිනමන්නෙමු.

අවසාන වශයෙන්, මෙම ආයතනය කෙරෙහි තබා ඇති විශ්වාසය හා බලාපොරොත්තුව වෙනුවෙන් අපගේ සියලුම පාර්ශවකරුවන්ට ස්තූතිවන්ත වන අතර ඉදිරි වර්ෂවලදී ද ඔබගේ අඛණ්ඩ සහයෝගය මම අපේක්ෂා කරමි.



**අජිත් ගුණරත්න නාරගල**
සභාපති / ප්‍රධාන විධායක නිලධාරී

# අධ්‍යක්ෂ මණ්ඩලයේ සමාලෝචනය

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා විගණනය කළ මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කිරීමට ලැබීම පිළිබඳ සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩලය සතුටට පත් වේ.

## ප්‍රධාන කාර්යයන්

මණ්ඩලයේ ප්‍රධාන කාර්යය වන්නේ ජනාධිපති අරමුදලට සහ මහපොළ උසස් අධ්‍යාපන භාරකාර අරමුදලට ආදායම් උත්පාදනය කිරීමයි.

## වසරේ කාර්යසාධනය පිළිබඳ සමාලෝචනය

පෙර නොවූ විරූ ආර්ථික අර්බුදයක් මධ්‍යයෙහි වුවද සංවර්ධන ලොතරැයි මණ්ඩලය ජනාධිපති අරමුදලට රු.මිලියන 3,211ක් දායක වූ අතර මෙය 2021 වසර තුළ සිදුකළ දායකත්වයට වඩා 12%ක වැඩිවීමකි. සංවර්ධන ලොතරැයි මණ්ඩලය රු.බිලියන 19.7ක පිරිවැටුමක් අත්කරගෙන ඇති අතර මෙය පසුගිය වසරට සාපේක්ෂව 26%ක වැඩිවීමකි.

## ආයතනික සමාජ වගකීම (CSR)

සමාලෝචිත වසර තුළ ආයතනික සමාජීය වගකීම් කටයුතු වාර්ෂික වාර්තාවේ මෙහෙයුම් සමාලෝචනය යටතේ දැක්වේ.

## මූල්‍ය වාර්තාකරණය සඳහා අධ්‍යක්ෂවරුන්ගේ වගකීම

මණ්ඩලයේ කටයුතුවල තත්ත්වය පිළිබඳ සත්‍ය සහ සාධාරණ දැක්මක් ලබාදෙන පරිදි මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වගකීමට බැඳී සිටියි. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මෙම මූල්‍ය ප්‍රකාශ පිළියෙල කර ඇති බව අධ්‍යක්ෂවරුන්ගේ මතය වේ.

## විගණකවරයාගේ වාර්තාව

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ 154 ව්‍යවස්ථාවේ විධිවිධාන අනුව සහ 1997 අංක 20 දරණ සංවර්ධන ලොතරැයි මණ්ඩල පනතේ 14 (3) වගන්තිය අනුව විගණකාධිපතිවරයා සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ විගණකවරයා වන්නේය. 2022 දෙසැම්බර් 31 දිනට මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශ පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව මෙම වාර්ෂික වාර්තාවේ 42 සිට 52 දක්වා පිටු වල දැක්වේ.

## ගිණුම්කරණ ප්‍රතිපත්ති

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට (LKASs) අනුකූලව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සිය මූල්‍ය ප්‍රකාශ පිළියෙල කර ඇත. මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමේදී යොදා ගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති 63 සිට 67 දක්වා පිටුවල දක්වා ඇත. සමාලෝචිත වසර තුළ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යොදාගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවල කිසිදු සැලකියයුතු වෙනස්වීම් සිදු වී නොමැත.

## අධ්‍යක්ෂ මණ්ඩල සමාජිකයින් මණ්ඩලයේ කොන්ත්‍රාත් සමඟ බැඳීම

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා අධ්‍යක්ෂවරුන්ට මණ්ඩලයේ කිසිදු කොන්ත්‍රාත්තුවක් හෝ යෝජිත කොන්ත්‍රාත්තුවක් සමඟ සෘජු හෝ වක්‍ර බැඳියාවක් නොමැත.

## විගණන සහ කළමනාකරණ කමිටු

පාලන පද්ධතියේ උප කමිටු ලෙස විගණන සහ කළමනාකරණ කමිටුවට ආයතනයේ පාලන සහ අවදානම් කළමනාකරණ පද්ධති සමාලෝචනය අභ්‍යන්තර පාලන ක්‍රියාවලි නියාමනය සහ අභ්‍යන්තර විගණන සහ ව්‍යවස්ථාපිත විගණන කාර්යන් අධීක්ෂණය කිරීමේ සමස්ත වගකීම ඇති විගණන සහ කළමනාකරණ කමිටුවේ වාර්තාව 40 පිටුවේ දක්වා ඇත.

## නීති සහ රෙගුලාසිවලට අනුකූලතාව

අධ්‍යක්ෂවරු ඔවුන්ගේ උපරිම දැනුම සහ විශ්වාසයට අනුව මණ්ඩලයේ නීති සහ රෙගුලාසි උල්ලංඝනය කර කිසිදු කාර්යයක නියැලී නොමැති බව තහවුරු කර සිටී.

## ව්‍යවස්ථාපිත ගෙවීම්

ජනාධිපති අරමුදලට රජයේ බදු සහ සේවකයින් සම්බන්ධයෙන් සේවක අර්ථසාධක අරමුදලට සහ සේවා නියුක්තියන්ගේ භාර අරමුදල ගෙවියයුතු සියලුම ව්‍යවස්ථාපිත ගෙවීම් සහ පාරිතෝෂික නිසි වේලාවට ගෙවා ඇති බව අධ්‍යක්ෂවරු තහවුරු කරයි.

## ශේෂ පත්‍රයෙන් පසු සිදුවීම්

මූල්‍ය වසර අවසානය සහ මෙම වාර්තාවේ දිනය අතර කාලය තුළ ගැලපීම් හෝ අනාවරණය කළ යුතු කිසිදු වැදගත් කරුණක් පැන නැගී නොමැති බව අධ්‍යක්ෂවරුන්ගේ මතය වේ.


## අඛණ්ඩ පැවැත්ම

මණ්ඩලයේ සම්පත් එහි මෙහෙයුම් අඛණ්ඩව ගෙන යාම සඳහා ප්‍රමාණවත් බව අධ්‍යක්ෂවරුන්ගේ විශ්වාසය වේ.

එමනිසා මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමේදී අඛණ්ඩ පැවැත්ම යොදා ගෙන ඇත.

අපට සහාය දැක්වූ අතිගරු ජනාධිපතිතුමාටත්, ගරු අග්‍රාමාත්‍යතුමාටත්, මුදල් අමාත්‍යතුමාටත්, අභියෝග මධ්‍යයෙහි වුවද අපගේ වාර්ෂික ඉලක්කය සපුරා ගැනීම සඳහා කැපවීමෙන් කටයුතු කළ අපගේ කාර්ය මණ්ඩලයටත් අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ අවංක ස්තූතිය පුද කර සිටිමි. අපගේ ස්තූතිය හිමිවිය යුතු තවත් බොහෝ දෙනෙකු සිටින අතර අපගේ පාරිභෝගිකයින් වෙත අපගේ නිෂ්පාදන බෙදා හැරීම සඳහා මහඟු දායකත්වයක් ලබා දෙන අපගේ අලෙවි බලකායට, විශේෂයෙන් ම බෙදාහැරීමේ අලෙවි නියෝජිතයින්ට අලෙවි නියෝජිතයින්ට අලෙවි සහායකයින්ට අපගේ ස්තූතිය පුද කර සිටිමි.

අවසාන වශයෙන්, සංවර්ධන ලොතරැයි මණ්ඩලය කෙරෙහි තබා ඇති විශ්වාසය සහ බලාපොරොත්තුව වෙනුවෙන් අපගේ සියලුම ගනුදෙනුකරුවන්ට සහ අනෙකුත් පාර්ශවකරුවන්ට මාගේ අවංක ස්තූතිය පුද කර සිටිමි.



**ජෙනට් ජයවර්ධන**
(නීතිඥ)
අධ්‍යක්ෂ

# අධ්‍යක්ෂ මණ්ඩලය - 2022



වමේ සිට දකුණට

කේ. ඒ. එච්. සී. පුබුදුසිරි මෙනවිය
අධ්‍යක්ෂ
විදේශ සම්පත් දෙපාර්තමේන්තුව
මුදල් අමාත්‍යංශය
අධ්‍යක්ෂ, සංවර්ධන ලොතරැයි මණ්ඩලය
2021.06.28. දින සිට ක්‍රියාත්මක වන පරිදි

ඩබ්ලිව්. ඒ. සරත් කුමාර මහතා
භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්, මුදල් අමාත්‍යංශය
ජනාධිපති ජ්‍යෙෂ්ඨ අතිරේක ලේකම්
ලේකම්, ජනාධිපති අරමුදල
අධ්‍යක්ෂ, සංවර්ධන ලොතරැයි මණ්ඩලය
2022.08.22 දින සිට ක්‍රියාත්මක වන පරිදි

අජිත් ගුණරත්න නාරගල මහතා
සභාපති / ප්‍රධාන විධායක නිලධාරි
2021.12.16 දින සිට ක්‍රියාත්මක වන පරිදි

ජෙනට් ජයවර්ධන මහත්මිය
(නීතිඥ)
අධ්‍යක්ෂ, සංවර්ධන ලොතරැයි මණ්ඩලය
2020.01.15 දින සිට ක්‍රියාත්මක වන පරිදි

එස්. ටී. කොඩිකාර මහතා (පින්තූරයේ නොමැත)
ලේකම්,
වෙළෙඳ, වාණිජ සහ ආහාර
සුරක්ෂිතතා අමාත්‍යංශය
අධ්‍යක්ෂ, සංවර්ධන ලොතරැයි මණ්ඩලය
2022.06.28 දින සිට ක්‍රියාත්මක වන පරිදි

# වර්තමාන අධ්‍යක්ෂ මණ්ඩලය



අජිත් ගුණරත්න නාරගල මහතා
සභාපති / ප්‍රධාන විධායක නිලධාරී



ඩබ්ලිව්. ඒ. සරත් කුමාර මහතා
භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්, මුදල් අමාත්‍යංශය
ජනාධිපති ජ්‍යෙෂ්ඨ අතිරේක ලේකම්
ලේකම්, ජනාධිපති අරමුදල
අධ්‍යක්ෂ, සංවර්ධන ලොතරැයි මණ්ඩලය



කේ. ඒ. එච්. සී. පුබුදුසිරි මෙනවිය
අධ්‍යක්ෂ, විදේශ සම්පත් දෙපාර්තමේන්තුව,
මුදල් අමාත්‍යංශය
අධ්‍යක්ෂ, සංවර්ධන ලොතරැයි මණ්ඩලය



ජෙනට් ජයවර්ධන මහත්මිය
(නීතිඥ),
අධ්‍යක්ෂ, සංවර්ධන ලොතරැයි මණ්ඩලය

# සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩලයේ විස්තර

### අජිත් ගුණරත්න නාරගල මහතා
සභාපති / ප්‍රධාන විධායක නිලධාරි
සංවර්ධන ලොතරැයි මණ්ඩලය

**පත්වීම් දිනය**

2021 දෙසැම්බර් 16

**අධ්‍යාපනය, දක්ෂතාව සහ පළපුරුද්ද**

- MBA - මහත්මා ගාන්ධි විශ්වවිද්‍යාලය, ඉන්දියාව
- PGDEM - "දේවාන්ෂී" විද්‍යාලය, ඉන්දියාව
- BPA (Special) - දෘශ්‍ය හා ප්‍රසාංගික කලා විශ්ව විද්‍යාලය, ශ්‍රී ලංකාව
- Dip. in Business Management – LAVTC, ශ්‍රී ලංකාව
- රාජ්‍ය ආයතනවල දැක්ම සාක්ෂාත් කර ගැනීම සඳහා ප්‍රතිපත්ති සම්පාදනය සහ උපාය මාර්ගික සැලසුම් හරහා නායකත්වය ලබා දීමේ අද්විතීය පලපුරුද්ද.
- අලෙවිකරණය, සන්නාම ගොඩනැගීම, වෙළඳපොළ පුළුල් කිරීම පිළිබඳ පෞද්ගලික අංශයේ පරිපාලන හා නායකත්ව පලපුරුද්ද.

**වෙනත් පත්කිරීම්**

- අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
  - ස්වාධීන රූපවාහිනී සේවය, ජනමාධ්‍ය අමාත්‍යංශය
  - BCC ලංකා ලිමිටඩ්, මුදල් අමාත්‍යංශය
- විශ්වවිද්‍යාල පාලක සභා සාමාජික - රුහුණු විශ්වවිද්‍යාලය
- බාහිර කථිකාචාර්ය - කැළණිය විශ්වවිද්‍යාලය
- බාහිර කථිකාචාර්ය - දෘෂ්‍ය හා ප්‍රාසාංගික කලා විශ්වවිද්‍යාලය
- කළමනාකරණ අධ්‍යක්ෂ - ලක්ෂරි කෙයාරින් (පුද්ගලික) සමාගම

**පෙර පත්කිරීම්**

- අධ්‍යක්ෂ ජනරාල් - ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව
- මෙහෙයුම් අධ්‍යක්ෂක - ජාතික තරුණ සේවා සභාව
- අධ්‍යක්ෂක මණ්ඩල සාමාජික - ජාතික තරුණ සේවා සභාව

### ඩබ්ලිව්. ඒ. සරත් කුමාර මහතා
අධ්‍යක්ෂ, සංවර්ධන ලොතරැයි මණ්ඩලය

**පත්වීම් දිනය**

2022 අගෝස්තු 22

**අධ්‍යාපනය, දක්ෂතාව සහ පළපුරුද්ද**

- කළමනාකරණය සහ තක්සේරුකරණය පිළිබඳ විද්‍යාවේදී උපාධිය, ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය
- ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයෙන් රාජ්‍ය කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධිය
- ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ වසර 36කට වැඩි පළපුරුද්ද

**වෙනත් පත්කිරීම්**

- භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්, මුදල් අමාත්‍යංශය
- ජනාධිපති ජ්‍යෙෂ්ඨ අතිරේක ලේකම්
- ලේකම්, ජනාධිපති අරමුදල

**පෙර පත්කිරීම්**

- ආපදා කළමනාකරණ අමාත්‍යංශයේ ප්‍රධාන ගණකාධිකාරී
- ආර්ථික සංවර්ධන අමාත්‍යංශයේ ප්‍රධාන ගණකාධිකාරී
- අග්‍රාමාත්‍ය කාර්යාලයේ ප්‍රධාන මූල්‍ය නිලධාරි
- රියාද්හි ශ්‍රී ලංකා තානාපති කාර්යාලයේ අමාත්‍ය උපදේශක
- නියෝජ්‍ය සමාගම් රෙජිස්ට්‍රාර් (මුදල්)

### සිසිර තිස්ස කුමාර කොඩිකාර මහතා
අධ්‍යක්ෂ, සංවර්ධන ලොතරැයි මණ්ඩලය

**පත්වීම් දිනය**

2022 ජූනි 28

**අධ්‍යාපනය, දක්ෂතාව සහ පළපුරුද්ද**

- B.A. (ගෞරව) 2 පෙළ ඉහළ සාමාර්ථයක් සහිත භූගෝල විද්‍යා උපාධිය, කොළඹ විශ්ව විද්‍යාලය
- විමධ්‍යගත කිරීම සහ පළාත් පාලන ආයතන අධ්‍යනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව, කොළඹ විශ්ව විද්‍යාලය
- ආර්ථික විද්‍යාව පිළිබඳ වාණිජ ශාස්ත්‍රපති උපාධිය, නිව් සවුත් වේල්ස් විශ්ව විද්‍යාලය ඕස්ට්‍රේලියාව
- පරිගණක විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව, කොළඹ විශ්ව විද්‍යාලය
- නීතිවේදී උපාධිය (L.L.B), ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය

**වෙනත් පත්කිරීම්**

- ලේකම්, වෙළෙඳ වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යංශය

**පෙර පත්කිරීම්**

| | |
|---|---|
| ලේකම් | නිවාස රාජ්‍ය අමාත්‍යංශය |
| ලේකම් | ජාතික උරුමය, රංග කලා සහ ග්‍රාමීය කලා ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යංශය |
| සභාපති | ජාතික මානව සම්පත් සභාව, රාජ්‍ය සේවා, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යංශය |
| ලේකම් | ප්‍රජා පොලිස් සේවා රාජ්‍ය අමාත්‍යංශය |

### කේ. ඒ. එච්. සී. පුබුදුසිරි මෙනවිය
අධ්‍යක්ෂ, සංවර්ධන ලොතරැයි මණ්ඩලය

**පත්වීම් දිනය**

2021 ජූනි 28

**අධ්‍යාපනය, දක්ෂතාව සහ පළපුරුද්ද**

- BSc - කැලණිය විශ්ව විද්‍යාලය
- MSc (ජීව තාක්ෂණ විද්‍යාව) පේරාදෙනිය විශ්ව විද්‍යාලය
- MA (ආර්ථික විද්‍යාව) – කැලණිය විශ්ව විද්‍යාලය
- MA (ප්‍රතිපත්ති ආර්ථික විද්‍යාව) - විලියම්ස් කොලීජිය, USA
- රාජ්‍ය මූල්‍ය, ආදායම් ප්‍රතිපත්ති සහ විදේශ සංවර්ධන සහය පිළිබඳ වැඩ කිරීමේ පළපුරුද්ද

**වෙනත් පත්කිරීම්**

අධ්‍යක්ෂ, බාහිර සම්පත් දෙපාර්තමේන්තුව

### ජෙනට් ජයවර්ධන මහත්මිය
අධ්‍යක්ෂ සංවර්ධන ලොතරැයි මණ්ඩලය

**පත්වීම් දිනය**

2020 ජනවාරි 15

**අධ්‍යාපනය, දක්ෂතාව සහ පළපුරුද්ද**

- LLB - නීති පීඨය, කොළඹ විශ්ව විද්‍යාලය
- වසර 22ක පළපුරුද්ද

**වෙනත් පත්කිරීම්**

සභාපති - කුරුණෑගල වැවිලි සමාගම (2022 ඔක්තෝබර් සිට මේ දක්වා)

**පෙර පත්කිරීම්**

- නීති උපදේශක - වයඹ පළාත (2004 සිට 2010)
- NICD සභාපති - 2019 වසර

# කළමනාකරණ කණ්ඩායම



**1. ඩී. ඩී. සී. දම්මින්ද මහතා** – නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (අලෙවි) **2. ඩබ්ලිව්. කේ. ඒ. ඒ. ජයරත්න මහතා** – සාමාන්‍යාධිකාරී
**3. අජිත් ගුණරත්න නාරගල මහතා** – සභාපති/ප්‍රධාන විධායක නිලධාරී **4. ඩබ්ලිව්. ඒ. වී. සී. සෝමරත්න මෙනවිය** – නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මුදල්)
**5. ටී. කසුන් ජයසූරිය මහතා** – සහකාර සාමාන්‍යාධිකාරී (මුදල්)



**7. සී. සී. අයිලප්පෙරුම මහතා** – සහකාර සාමාන්‍යාධිකාරී (විකුණුම්) වැඩ බලන **8. එස්. එම්. ඒ. වසන්ත උදය කුමාර මහතා** – අභ්‍යන්තර විගණක
**9. ආචාර්ය අසංකා එස්. ගුණසිංහ මහත්මිය** – සහකාර සාමාන්‍යාධිකාරී (අලෙවි) **10. නිෂාන් පෙරේරා මහතා** – සහකාර සාමාන්‍යාධිකාරී (මුදල්)
**11. පී. ඩී. යු. මලින්ත මහතා** – සහකාර සාමාන්‍යාධිකාරී (ප්‍රසම්පාදන) **12. රෝහන ප්‍රසාද් රණසිංහ මහතා** – සහකාර සාමාන්‍යාධිකාරී (මානව සම්පත් හා පරිපාලන)

# කණිෂ්ඨ කළමනාකරුවන්



**1. ජී. ඒ. ආර්. එස්. රණතුංග මහතා** – කලාප කළමනාකරු **2. ඊ. ඩී. අයි. එන්. එස් අබේරත්න මහතා** – පරිපාලන නිලධාරි **3. ජේ. එම්. ඩී. ඒ. ක්‍රිෂාන්ත මහතා** – ප්‍රධාන ආරක්ෂක නිලධාරි **4. එම්. බි. එම්.එන්. කේ. බලගල්ල මහතා** – කලාප කළමනාකරු **5. අයි. ඩී. පත්ම කුමාරසිරි මහතා** – කලාප කළමනාකරු **6. එම්. කේ. ඒ. අයි. කමල්සිරි මහතා** – කලාප කළමනාකරු



**7. සී. ජේ. බී. ජයවර්ධන මහතා** – කලාප කළමනාකරු **8. එන්. වී. ඉන්දික උපුල් මහතා** – ගිණුම් නිලධාරි **9. එම්. එල්. ගෞරි කෞශල්‍යා මහත්මිය** – කලාප කළමනාකරු **10. ආර්. එම්. යූ. එස්. කුමාර මහතා** – කලාප කළමනාකරු **11. ඩී. එම්. බී. එල්. මහින්ද මහතා** – කලාප කළමනාකරු **12. ආර්. ඒ. සුනිල් රත්නායක මහතා** – කලාප කළමනාකරු



**13. ආර්. ඩී. සී. රාජපක්ෂ මහත්මිය** – ගිණුම් නිලධාරි **14. බී. ඒ. සී. ජේ. කරුණාරත්න මහතා** – ප්‍රසම්පාදන නිලධාරි **15. සී. එන්. තෙවරප්පෙරුම මහත්මිය** – මානව සම්පත් නිලධාරි **16. පී. ප්‍රසන්න ගෝකුල ප්‍රනාන්දු මහතා** – ප්‍රවාහන නිලධාරි **17. ආර්. ඒ. ඩබ්ලිව්. පී. රූපසිංහ මහත්මිය** – ගිණුම් නිලධාරි **18. යූ. පී. ඉලේපෙරුම මහතා** – පද්ධති විශ්ලේෂක **19. එම්. ඒ. එල්. එන්. ගුණසේකර මහත්මිය** – ගිණුම් නිලධාරි, **20. පී. ඩී. එස්. ප්‍රේමතිලක මහත්මිය** – අලෙවිකරණ හා ප්‍රචාරණ නිලධාරි

# මෙහෙයුම් සමාලෝචනය

## 2022 වර්ෂයේ අලෙවි කටයුතු පිළිබඳ සුවිශේෂි කරුණු

2021 වසරේ විකුණුම් හා සැසඳීමේදී, පළමු කාර්තුවේ ආරම්භයේ සිට අවසානය දක්වා විකුණුම් සිත් ඇදගන්නා වර්ධනයක් පෙන්නුම් කළේය. කෙසේවෙතත් දෙවන කාර්තුවේ සිට, රටපුරා පැවති ආර්ථික හා දේශපාලනික අර්බුදයේ ප්‍රතිඵලයක් ලෙස පහළ වැටීමේ ප්‍රවනතාවක් අපට දැකගතහැකි විය. එවැනි වාතාවරණයන් තුළ, දින ගණනාවක් හදිසි නීතිය පැනවූ අතර ඒ අනුව, ලොතරැයි දිනුම් ඇදීම් සැලසුම්කල කාලසටහනට අනුව පවත්වාගත නොහැකි විය. තවද, එම කාල සීමාව තුළ පැවති උද්ධමනය තුළ මිල ගණන් ඉහල යාම සහ ඉන්ධන හිඟය විකුණුම් ජාලයට දුෂ්කරතා ගණනාවක් ඇති කරන ලදී. මෙම වාතාවරණය හමුවේ, විශේෂයෙන් ජංගම විකුණුම්වල යෙදී සිටි අලෙවි නියෝජිතයින් ක්ෂේත්‍රයෙන් ඉවත්වීමට බලකරන ලදී. මේ අතරතුර, ලොතරැයි සඳහා ඉල්ලුමේ වේගවත් පහළ බැසීම දක්නට ලද අතර අලෙවි නියෝජිතයින්ට ප්‍රමාණවත් ආදායම් නොලැබීම හේතුවෙන් විකුණුම් ක්‍රියාවලියෙන් ඉවත් විය.

මෙම අර්බුද හේතුවෙන් මණ්ඩලයේ ලොතරැයි විකුණුම් වල විශාල පහත වැටීමක් නිරීක්ෂණය වූ නමුත් මෙම වසරේ අවසන් කාර්තුව වන විට තරමක් දුරට ප්‍රගතියක් දක්නට ලැබුනි. රු. බිලියන 25ක විකුණුම් පරිමාවක් අත්කර ගැනීමට අපි අරමුණු කරනු ලැබුවත් රු.බිලියන 19කින් සෑහීමට පත්වීමට අපට සිදුවිය. කෙසේවෙතත් මණ්ඩලය එහි පිරිවැය ඵලදායීව සහ විචක්ෂණශීලීව කළමනාකරණය කළ බැවින් රු.බිලියන 3ක ඉලක්ක ගත ලාභය ඉක්මවා යාමට අප සමත් විය.

තවද, වසර අවසානය වන විට විශේෂ ප්‍රවර්ධන වැඩසටහන් දියත් කිරීම, අලෙවි නියෝජිතයින්ගේ රැස්වීම් සහ මූල්‍ය නීති අනුව ඔවුන් අභිප්‍රේරණය කිරීම හේතුවෙන් රු.බිලියන 19 දක්වා මණ්ඩලයේ විකුණුම් වැඩි කර ගැනීමට අප සමත් විය. පසුගිය වසරට සාපේක්ෂව මෙය ඉහළම මට්ටමේදී අත්කරගත් වර්ධනයකි.

ප්‍රවර්ධන වැඩසටහන් වලින් පසු 2022 දී මෙම විකුණුම් මට්ටම අත්කර ගැනීමට මණ්ඩලයට මඟ පාදන ලදී.

## 01. ප්‍රවර්ධන වැඩසටහන්

### ලග්න වාසනා

ලග්න වාසනාව ලොතරැයිය සඳහා "සුපිරි ධන යෝගය" නමින් 2022 ජනවාරි 28 (සිකුරාදා) විශේෂ දිනුම් ඇදීමක් පවත්වන ලද අතර මෙම විශේෂ දිනුම් ඇදීම වෙනුවෙන් ලොතරැයිපත් මිලියන 5.3 ක අලෙවියක් වාර්තා කරන ලදී. පසුගිය වැඩසටහන තුළින් අත්කරගත් සාර්ථකත්වය හේතුවෙන් තවදුරටත් විශේෂ විකුණුම් වැඩසටහන් දෙකක් පෙබරවාරි සහ අප්‍රේල් යන මාස වලදී පවත්වන ලදී. ඒ අනුව මෙම දිනුම් ඇදීම් දෙක මගින් පිළිවෙලින් ලොතරැයි ටිකට් මිලියන 3.3ක් සහ මිලියන 3.5ක වාර්තාගත අලෙවියක් සිදුකරන ලදී.

තවද, වෙළෙඳපොල තුළ ලග්න වාසනාව ප්‍රධාන ලොතරැයිය ලෙස පරිවර්තනය කිරීමේ අරමුණ ඇතිව 2022 ජනවාරි සිට දෙසැම්බර් දක්වා කාලසීමාව සඳහා එක් එක් ලග්න වාසනා ලොතරැයි මිලදී ගැනීමක් සඳහා ශත 50ක අමතර දිරි දීමනාවක්ද මණ්ඩලයේ අලෙවි නියෝජිතයින්ට පිරි නමන ලදී. මෙම ක්‍රියාමාර්ග යේ ප්‍රතිඵලයක් ලෙස, ලග්න වාසනා ලොතරැයි විකුණුම් පරිමාව තුළ 17%ක ප්‍රගතියක් වාර්තා කර ඇත.

### අද කෝටිපති

2022 නොවැම්බර් 29 වන දින (අඟහරුවාදා) අද විශේෂ කෝටිපති නමින් විශේෂ දිනුම් ඇදීමක් පැවැත්වූ අතර මෙම විශේෂ දිනුම් ඇදීම මඟින් වාර්තා වූ විකුණුම් පරිමාව මිලියන 3.0ක් විය.

### කප්රුක

ආරම්භයේ සිට මිලියන 75 ක සුපිරි ජයමල්ලක් පිරිනමන කෝටිපති කප්රුක රු.මිලියන 120 ක සුවිශාල ජයමල්ලක් සහ 2021 දෙසැම්බර් මිලියන ගණනාවක් පිරිනමන වෙනත් ජය මළු සමඟ නැවත දියත් කිරීමට දක්නට ලැබුනි. කප්රුක ජයමල්ලේ සුවිශාල ජයමල්ල ප්‍රවර්ධනය කිරීමේ අරමුණින්, 2022 සැප්තැම්බර් 29 (බ්‍රහස්පතින්දා) "කප්රුක පවර් ප්ලේ" නමින් විශේෂ දිනුම් ඇදීමක් පවත්වන ලද අතර මේ තුළින් ලොතරැයි ටිකට් මිලියන 2.7 ක අලෙවියක් වාර්තා කළේය. මේ අතරම, වෙළෙඳපොල තුළ මෙම ලොතරැයිය සඳහා වඩා ඉහළ ඉල්ලුම සලකා බලමින් 2022 දෙසැම්බර් 30 (සිකුරාදා) දින විශේෂ දිනුම් ඇදීමක් පවත්වන ලද අතර මෙම දිනුම් ඇදීම තුළ විකුණුම් පරිමාව මිලියන 4.1 ක් විය.

### සුපර් බෝල්

ඉංග්‍රීසි අකුරක් සමඟ ඕනෑම අංකයක් ගලපන ලොතරැයියට ලබාදුන් රු. 40 ක ත්‍යාගය 2022 නොවැම්බර් 11 දින රු.100 දක්වා වැඩි කර ඇති අතර, එයට සමගාමීව, ලොතරැයි දිනුම් ඇදීම් ගණනාවක් සුපර් බෝල් සුපර් චාන්ස්, නමින් 2022 නොවැම්බර් 16 සිට 30 දක්වා පවත්වන ලදී. ඒ අනුව, සාමාන්‍ය ත්‍යාග සටහනට අමතරව, රු.100 සහ රු.500 වටිනාකමට මුදල් ත්‍යාග විශාල සංඛ්‍යාවක් ද දෛනික දිනුම් ඇදීම් වලදී පිරිනමන ලදී.

### සසිරි

සසිරි සන්නාමය ප්‍රවර්ධනය කිරීමේ අරමුණ ඇතිව, සසිරි ලක්ෂපති වාසනාව නමින් 2022 මාර්තු 15 (අඟහරුවාදා) දින විශේෂ දිනුම් ඇදීමක් පවත්වන ලද අතර මෙම දිනුම් ඇදීම යටතේ ලොතරැයි ටිකට් මිලියන 1.3 ක අලෙවියක් වාර්තා කරන ලදී. දෛනිකව විශාල ජයග්‍රහකයින් ගණනාවක් බිහිකරන මෙම ලොතරැයිය 2022 වසර තුළ ජයග්‍රහකයින් 1596ක් බිහි කිරීමට සමත් විය.

### වාලම්පුරි

2022 සැප්තැම්බර් 09 (සිකුරාදා) දින උතුරු හා නැගෙනහිර පළාත්වල පාරිභෝගිකයින් ඉලක්ක කරගනිමින් රු. 50 ක මිලකට වාසනාවේ සංකේතය වන වාලම්පුරි (වාසනාවේ සංකේතය) නමින් මෙම නව ලොතරැයි ටිකට්පත වෙළෙඳපොලට හඳුන්වා දෙන ලද අතර මෙම ලොතරැයියේ දිනුම් ඇදීම් මාස දෙකකට වරක් පවත්වනු ලබයි. මෙම ලොතරැයියේ පළමු දිනුම් ඇදීම 2022 ඔක්තෝබර් 28 (සිකුරාදා) දින පවත්වන ලද අතර ලොතරැයි ටිකට් මිලියන 1.1 ක අලෙවියක් මෙම දිනුම් ඇදිම යටතේ වාර්තා විය.

## 02. 2022 වසර තුළ ලබාදුන් සුපිරි ජය මළු සහ වෙනත් ත්‍යාග

සුපිරි ජයමල්ල, පළමු, දෙවැනි සහ තුන්වැනි ත්‍යාග මෙන්ම වෙනත් මුදල් ත්‍යාග ජයග්‍රහකයින් අතර රු.බිලියන 10 කට ආසන්නව බෙදා දී ඇත.

### අද කෝටිපති

වසර තුළ, අද කෝටිපති ලොතරැයිය රු. 63,138,148ක සුපිරි ජයමල්ලක් සමඟ රු. මිලියනයේ ත්‍යාග 118 සහ රුපියල් ලක්ෂයේ ත්‍යාග 1442 ක් පිරිනමන ලදී. 2022 දි පාරිභෝගිකයින් අතර බෙදා හැරි ත්‍යාගවල මුළු වටිනාකම රු. 1,456,765,648 ක් විය.

### ලග්න වාසනා

ඉහළම ජයග්‍රාහකයින් සංඛ්‍යාවක් බිහිකරන ලොතරැයිය වන ලග්න වාසනාව රු3,207,019,838 ක් වටිනා ත්‍යාග බෙදාහැර ඇති අතර එයට සුපිරි ධන යෝග 36 ක් සහ රුපියල් ලක්ෂ පහක මුදල් ත්‍යාග 518 ක් ඇතුළත් වේ.

### සුපර් බෝල්

ලොතරැයි ක්ෂේත්‍රයේ අවස්ථා බිහිකරන්නෙක් වන සුපර් බෝල් රු. 61,193,570.40 සහ රු. 50,000,000.00 ක සුපිරි ජයමලු දෙකක් සහ මිලියනයේ මුදල් ත්‍යාග 90 ක් සහ රුපියල් ලක්ෂයේ ත්‍යාග 1,041ක් සහිතව ඓතිහාසික පිරිනැමීමක් සනිටුහන් කරන ලද අතර එමනිසා ජයග්‍රහකයින් අතර බෙදාහැරි මුළු මුදල් ත්‍යාගවල වටිනාකම රු. 1,113,060,570.40 ක් විය.

### ශනිදා

ශනිදා වාසනාව 2022 වසර තුළ පාරිභෝගිකයින් අතර බෙදාහැරි මුදල් ත්‍යාගවල මුළු වටිනාකම රු. 1,441,630,211.50 ක් වාර්තා කළ අතර එයට රු. 30,277,239.00, රු. 32,604,731.40 සහ රු. 83,740,721.10 ක වටිනාකමින් යුත් සුපිරි ජයමලු තුනක් රුපියල් මිලියනයේ මුදල් ත්‍යාග 118 ක් සහ රුපියල් ලක්ෂයේ මුදල් ත්‍යාග 1,319 ක් ඇතුළත් විය.

### කප්රුක

අනෙකුත් සුපිරි ජයමලු සමඟ රුපියල් මිලියන 120 ක ඉහළම ජය මල්ලක් පිරිනමන කප්රුක ලොතරැයි ටිකට්පත 2022 වසර තුළ රුපියල් මිලියන 10 ක ජය මල්ලක් සහ රුපියල් මිලියන පහක් වටිනා ජයමලු තුනක් පිරිනමන ලදී. වසර තුළ පාරිභෝගිකයින් වෙත පිරිනමන ලද මුළු මුදල් ත්‍යාගවල වටිනාකම රුපියල් 1,350,940,060.00 ක් විය. ඉහත සඳහන් ජයමලුවලට අමතරව, රුපියල් මිලියනයේ මුදල් ත්‍යාග 119 ක් සහ රුපියල් ලක්ෂයේ මුදල් ත්‍යාග 1,373 ක් ඉහත මුදලට ඇතුළත් වේ.

### ජයෝදා

2022 වසර තුළ ජයෝදා ලොතරැයිය මගින් පිරිනමන ලද මුදල් ත්‍යාගවල මුළු වටිනාකම රු.198,018,820.00 ක් වූ අතර මෙම ප්‍රමාණය රුපියල් මිලියනයේ ත්‍යාග 26 ක්, රුපියල් ලක්ෂයේ ත්‍යාග මුදල් 14 ක් සහ රුපියල් පන්දහසේ මුදල් ත්‍යාග 221 ක් නියෝජනය කරයි.

### සංවර්ධන වාසනා

2022 වසර තුළ සංවර්ධන වාසනා ලොතරැයි ටිකට්පත මගින් පාරිභෝගිකයින්ට රු.14,596,184 ක එක් සුපිරි ජයමල්ලක් සහ රුපියල් පන්දහසේ මුදල් ත්‍යාග 41 ක් රුපියල් ලක්ෂයේ ත්‍යාග 14 ක් සහ රුපියල් පනස්දහසේ මුදල් ත්‍යාග 326 ක් පිරිනමන ලද අතර ඒ අනුව ත්‍යාග මුදල්වල මුළු වටිනාකම රු. 198,214,984.00 ක් විය.

### සසිරි

සසිරි ටිකට් පත රුපියල් සියයයේ ත්‍යාග ජයග්‍රහකයින් ඉහළම සංඛ්‍යාව බිහිකරන්නා ලෙස ලොතරැයි ක්ෂේත්‍රයේ සනිටුහන් කළ අතර මෙම සම්ප්‍රදාය ඉදිරියට ගෙන යමින්, 2022 වසර තුළ පවා ජයග්‍රාහකයින් 1,597 ක් බිහි කිරීමට එයට හැකි විය. ඒ අනුව ජයග්‍රහකයින් අතර බෙදාහැරි එවැනි ත්‍යාගවල මුළු වටිනාකම රු. 33,512,550 ක් විය.

### වාලම්පුරි

උතුරු හා නැගෙනහිර පළාත්වල පාරිභෝගිකයින් දිනා ගැනීමේ අරමුණ ඇතිව හඳුන්වා දුන් විශේෂ ලොතරැයියයක් වන වාලම්පුරි එහි පළමු දිනුම් ඇදීමේදී රු. 2,000,000 ක් වටිනා ජයමලු පහක් සහ රුපියල් ලක්ෂයේ මුදල් ත්‍යාග 55 ක් පිරිනමන ලදී. ඉහත ආකාරයෙන් පාරිභෝගිකයින් වෙත පිරිනමන ලද මුදල් ත්‍යාගවල මුළු වටිනාකම රු. 1,350,940,060 ක් විය.

## 03. 2022 වසර සඳහා නව බෙදාහැරීමේ නියෝජිතයින් සහ අලෙවි නියෝජිතයින් පත් කිරීම.

| දිස්ත්‍රික්කයේ අංකය | දිස්ත්‍රික්කය | බෙදාහැරීමේ නියෝජිතයින් | අලෙවි නියෝජිතයින් |
|---|---|---|---|
| 01 | කොළඹ | 02 | 09 |
| 02 | කලුතර | | 03 |
| 03 | මහනුවර | | 06 |
| 04 | මාතලේ | | 02 |
| 05 | නුවරඑළිය | 01 | 02 |
| 06 | ගාල්ල | | 04 |
| 07 | මාතර | 01 | 04 |
| 08 | හම්බන්තොට | | 01 |
| 09 | යාපනය | | |
| 10 | මන්නාරම | | |
| 11 | වවුනියාව | | 01 |
| 12 | මඩකලපුව | | |
| 13 | අම්පාර | | 01 |
| 14 | ත්‍රිකුණාමලය | | 03 |
| 15 | කුරුණෑගල | | 06 |
| 16 | පුත්තලම | | 01 |
| 17 | අනුරාධපුර | 01 | 03 |
| 18 | පොලොන්නරුව | | |
| 19 | බදුල්ල | | 01 |
| 20 | මොණරාගල | | 04 |
| 21 | රත්නපුර | | 03 |
| 22 | කෑගල්ල | | 05 |
| 23 | ගම්පහ | 02 | 15 |
| 24 | කිළිනොච්චි | | 06 |
| 25 | මුලතිව් | | |
| | | 07 | 80 |

# මෙහෙයුම් සමාලෝචනය

## 04. අලෙවි නියෝජිතයින්ගේ රැස්වීම්

දිවයින පුරා විසිරී සිටින අලෙවි නියෝජිතයින් දිරිමත් කිරීමේ අරමුණ ඇතිව, අලෙවි නියෝජිතයින් සඳහා සංවර්ධන අභිමන් යන තේමාව යටතේ පහත සඳහන් දිස්ත්‍රික්කවල සංවර්ධන ලොතරැයි මණ්ඩලය විසින් නව රැස්වීම් වර්ගයක් දියත් කිරීමට පියවර ගෙන ඇත.

| දිනය | දිස්ත්‍රික්කය | ස්ථානය |
|---|---|---|
| 2022 ජනවාරි 15 | අනුරාධපුර | අනුරාධපුර |
| 2022 ජනවාරි 16 | කෑගල්ල | කෑගල්ල |
| 2022 ජනවාරි 17 | පුත්තලම | පුත්තලම |
| 2022 ජනවාරි 29 | මාතලේ, මහනුවර | මහනුවර |
| 2022 පෙබරවාරි 26 | ගාල්ල | ගාල්ල |
| 2022 පෙබරවාරි 27 | මාතර | මාතර |
| 2022 මාර්තු 05 | අම්පාර, මඩකලපුව | අම්පාර |
| 2022 මාර්තු 06 | බදුල්ල | බදුල්ල |
| 2022 මාර්තු 12 | මොනරාගල | මොනරාගල |
| 2022 මාර්තු 13 | නුවරඑළිය | නුවරඑළිය |
| 2022 මාර්තු 17 | යාපනය, කිළිනොච්චි,මන්නාරම, වව්නියාව | යාපනය |
| 2022 මාර්තු 19 | ත්‍රිකුණාමලය, පොලොන්නරුව | ත්‍රිකුණාමලය |
| 2022 මාර්තු 20 | කුරුණෑගල | කුරුණෑගල |
| 2022 මාර්තු 26 | රත්නපුර | රත්නපුර |

මෙම අලෙවි නියෝජිත රැස්වීම්වලදී, අලෙවි නියෝජිතයින්ගේ සේවය ඇගයීම සඳහා සංවර්ධන ලොතරැයි මණ්ඩලය විසින් වැඩසටහනක් සංවිධානය කර ඇත. ඒ අනුව, මුදල් ත්‍යාග සහ සහතික පත් පහත සඳහන් ආකාරයෙන් පිරිනමා ඇත.

- දිවයින තුළ ඉහළම අලෙවි පරිමාවක් වාර්තාකර ඇති අලෙවි නියෝජිතයින්
- අදාළ දිස්ත්‍රික්කවල ඉහළම අලෙවි පරිමාව වාර්තාකර ඇති අය අතර පළමු දෙවැනි සහ තුන්වැනි ස්ථාන ලබාගත් අලෙවි නියෝජිතයින්.
- අදාළ මැතිවරණ කොට්ඨාශය තුළ ඉහළම අලෙවි පරිමාව වාර්තාකර ඇති අලෙවි නියෝජිතයින්.

## 05. අලෙවි නියෝජිතයින් සහ අලෙවි සහයකයින් සඳහා පවත්වන ලද විශේෂ වැඩසටහන්

- අලෙවිය වැඩි කිරීමේ අරමුණ ඇතිව, 2018 දී මූලිකව දියත් කළ අලෙවි කුටි 500 ව්‍යාපෘතිය යටතේ 2022 වසර තුළ නව අලෙවි කුටි 60ක් බෙදාහරින ලදී. ඉහත ආකාරයෙන් බෙදාහැර අලෙවි කුටියක වටිනාකම රු. 115,560 ක් වූ අතර මෙම අරමුණ සඳහා වසර තුළ රු. 6,933,600 ක් වියදම් කරන ලදී.
- එක් එක් අලෙවි කුටියක ස්ටිකර් ඇලවීම සඳහා වෙන් කරන ලද රු. 20,000ක මුදල 2022 වසර තුළ රු. 30,000 දක්වා වැඩි කරන ලදී. ඒ අනුව, අලෙවි කුටි 66 සඳහා රු. 1,420,000 ක් දරන ලදී.
- ලොතරැයි අලෙවිසැල් සකස් කිරීම සඳහා දිවයින පුරා අලෙවි නියෝජිතයින්ට අනුග්‍රහය ලබාදීම සඳහා වැඩසටහනක් සංවර්ධන ලොතරැයි මණ්ඩලය විසින් 2018 දී දියත් කරන ලදී. මෙම වැඩසටහන යටතේ, මණ්ඩලය 2022 අවසානය වන විට එවැනි අලෙවිසැල් 2 ක් සඳහා දායකත්වයන් සිදුකිරීමට සමත් වී ඇත.
- ලොතරැයි ටිකට්පත් අලෙවි කිරීම සඳහා සිල්ලර වෙළෙඳසැල් ඉලක්ක කිරීමේ ව්‍යාපාතියක් (සිල්ලර වෙළෙඳසැල් ව්‍යාපෘතිය තුළින් අලෙවිය) 2022 වසරේදී දියත් කරන ලදී. මෙම වැඩසටහන යටතේ, දිවයින පුරා 1373 දෙනෙක් අතර ලොතරැයි ටිකට්පත් බෙදාහැර ඇත. ඉන්ධන අර්බුදය හමුවේ අලෙවිය තුළ නිරීක්ෂණය වූ වේගවත් පහත වැටීම මෙම ව්‍යාපෘතියෙන් තරමක් දුරට පාලනය කරන ලදී.

  විශ්ව විද්‍යාල සඳහා තෝරාගෙන ඇති මණ්ඩලයේ අලෙවි නියෝජිතයින්ගේ ළමුන් සඳහා 2022 වසරේදී රු.565,500 ක් වෙන් කිරීමක් සිදු කරන ලදී.
- කොවිඩ් 19 ට ගොදුරු බවට පත් වූ සහ විවිධ රෝගවලට ගොදුරු වූ සහ මියගිය අලෙවි නියෝජිතයින්ට සහ අලෙවි සහයකයින්ට රු. 6,072,130 ක් ප්‍රදානය කරන ලදී.
- දිවයින පුරා විසිරී සිටින මණ්ඩලයේ අලෙවි නියෝජිතයින් අතර උයන් කුඩ 122ක් බෙදාහරින ලදී.
- එක් එක් දිස්ත්‍රික්කයේ ඉහළම අලෙවිය වාර්තාකළ දිස්ත්‍රික් අලෙවි නියෝජිතයින් දිරි ගැන්වීමේ අභිප්‍රාය ඇතිව, වරින් වර දිස්ත්‍රික්කවල කුඩා රැස්වීම් සංවර්ධනය කරන ලද අතර අලෙවි සහයකයින්ගේ අදහස් මෙම රැස්වීම්වලදී සැලකිල්ලට ගන්නා ලදී. අලෙවි කුටි අධීක්ෂණය කිරීමට සහ ත්‍යාග පිරිනමමින් ඔවුන්ගේ සේවාව අගය කිරීමට මෙම ක්‍රියාමාර්ගය හේතු විය.

## 06. සමාජ ආරක්ෂක වැඩසටහන්

- මහනුවර දළඳා පෙරහැර සඳහා රු. 2,000,000 ක අනුග්‍රහය ලබාදීම.
- රුහුණු කතරගම මහා දේවාලයේ ඇසල පෙරහැර සඳහා රු. 500,000 ක අනුග්‍රහය ලබාදීම.
- ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ රජ මහ විහාරයේ වාර්ෂික ශ්‍රී දළඳා පෙරහැර සඳහා රු. 200,000 ක අනුග්‍රහය ලබාදීම.
- බෙල්ලන්විල 72වැනි වාර්ෂික ඇසළ පෙරහැර සඳහා රු. 200,000 ක අනුග්‍රහය ලබාදීම.
- භූමි අලංකරණය කරමින් මහනුවර නගර සභාවේ සේවකයින් විසින් සිදුකරන සමාජ සේවය ඇගයීම පිණිස, 12 වැනි වරටත් ඔවුන් වෙත ටී-ෂර්ට් 100 ක් බෙදා දෙන ලදී.

## 07. විශේෂ වැඩසටහන

- 2022 දෙසැම්බර් ආයතනික සන්නාමය ගොඩ නැගීමට සහ තරුණ පරම්පරාව ආකර්ෂණය කර ගැනීම පිණිස සංවර්ධන ලොතරැයි මණ්ඩලය සඳහා නව ව්‍යාපාර ලාංඡනයක් දියත් කිරීම වාර්තා කළේය.
- තවද, සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ ජයග්‍රහකයින්ට ත්‍යාග දීමනා ලබාදීම පාරිභෝගිකයින්ගේ ජනප්‍රිය ස්ථාන බවට පත්ව ඇති අලෙවි සැල්වලදී ජයග්‍රාහී ලොතරැයි ටිකට්පත්වල අලෙවි නියෝජිතයින් සඳහා 2022 ආරම්භයේදී නව වැඩසටහනක් හඳුන්වාදෙන ලදි. මේ සමඟම, එවැනි අවස්ථාවලදී ගන්නා ලද ඡායාරූප සංවර්ධන ලොතරැයි මණ්ඩලය විසින් සිදුකරන ක්‍රියාමාර්ග පිළිබඳව පොදු ජනතාව අඛණ්ඩව දැනුවත් කිරීමට සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ Facebok පිටුවේ ප්‍රකාශයට පත් කර ඇත.
- සැලකියයුතු ලොතරැයි ටිකට් පත් ප්‍රමාණයක් මිලදී ගන්නා පාරිභෝගිකයින් වෙත දුරකථනය මගින් සිදුකරන ඇණවුම් සඳහා ඔවුන්ගේ ලොතරැයි ටිකට් ඔවුන්ගේ නිවසටම ලබාදීම සඳහා සංවර්ධන ලොතරැයි මණ්ඩලය විසින් නව ස්ථානයක් සකස් කර ඇති අතර, එය දිනකට ආසන්න වශයෙන් ටිකට්පත් 1000 ක් අලෙවි කිරීමට හේතු වී ඇත.
- වසර විස්සක කාලසීමාවක් සම්පූර්ණ කර ඇති සේවකයින් විසින් සිදුකරන ලද සේවය ඇගයීම පිණිස, 2022.12.29 දින රන්පවුම් ප්‍රදානය කරන ලදි.

# නිෂ්පාදන කළඹ පිළිබඳ දළ විශ්ලේෂණය

සංවර්ධන ලොතරැයි මණ්ඩලය ජනාධිපති අරමුදල හරහා අධ්‍යාපනය සහ ප්‍රජා ව්‍යාපාර සඳහා අරමුදල් සපයා දෙයි. සංවර්ධන ලොතරැයි මණ්ඩලයෙහි නිෂ්පාදන වර්ග දෙකක් තිබේ. මුද්‍රිත ලොතරැයි සහ ඩිජිටල් ලොතරැයි එම වර්ග දෙක වේ. ඩිජිටල් ලොතරැයිය "DLB Sweep" ජංගම යෙදවුම හරහා අලෙවි කරනු ලැබේ.

**දිනුම් ඇදීමේ ලොතරැයි** - ලොතරැයිපතේ ඇති අංක ලොතරැයිය විසින් දිනුම් අදිනු ලබන අංක සමග ගැලපීම මගින් මෙම ක්‍රීඩාව සිදුකරනු ලැබේ.

**සූරන ලොතරැයි** - පූර්වයෙන් තීරණය කරන ලද ත්‍යාග තිබේද යන්න හෙලිකර ගැනීම සඳහා ලොතරැයිපතෙහි සූරණ කොටස සූරා අදාල ත්‍යාග මුදල මතු කර ගත හැක.

**සන්නාම ලැයිස්තුව**

සඳුදා / අඟහරුවාදා / බදාදා / බ්‍රහස්පතින්දා / සිකුරාදා / සෙනසුරාදා සහ ඉරිදා

සඳුදා / අඟහරුවාදා / බදාදා / බ්‍රහස්පතින්දා / සිකුරාදා / සෙනසුරාදා සහ ඉරිදා

සඳුදා / අඟහරුවාදා / බදාදා / බ්‍රහස්පතින්දා / සිකුරාදා / සෙනසුරාදා සහ ඉරිදා

සඳුදා / අඟහරුවාදා / බදාදා / බ්‍රහස්පතින්දා / සිකුරාදා / සෙනසුරාදා සහ ඉරිදා

සඳුදා / අඟහරුවාදා / බදාදා / බ්‍රහස්පතින්දා / සිකුරාදා / සෙනසුරාදා සහ ඉරිදා

බ්‍රහස්පතින්දා / සෙනසුරාදා

සඳුදා / බදාදා

අඟහරුවාදා / සිකුරාදා හා ඉරිදා

මාස දෙකකට වරක්

## 1. අද කෝටිපති




### සන්නාම දැක්ම

වෙළෙඳපොල ප්‍රමුඛයා සහ ශ්‍රී ලංකාවේ ජනප්‍රිය ලොතරැයිය බවට පත්වීම.

### සන්නාම මෙහෙවර

අති නවීනතම තාක්ෂණය යොදා ගනිමින් නව්‍ය ත්‍යාග ව්‍යුහයන් හඳුන්වාදීම සහ ඒ මගින් මණ්ඩලයේ ලාභදායි බව වැඩි දියුණු කිරීම.

### ලොතරැයි විස්තර

දිනුම් ඇදීමේ දින : සඳුදා සිට ඉරිදා දක්වා (සතියේ දින හතම)
ලොතරැයි වර්ණ : රතු, ලා නිල්, රෝස, තද නිල්, දම්, කහ සහ කොළ

ආරම්භක ජයමල්ල : රු. 50,000,000

### ත්‍යාග ව්‍යුහය

| සංයෝජනය | ත්‍යාගය (රු.) |
|---|---|
| ඕනෑම එක් අංකයක් | රු.20.00 |
| ඕනෑම ඉංග්‍රීසි අකුරක් | රු.20.00 |
| ඕනෑම අංක දෙකක් | රු.100.00 |
| ඕනෑම අංක තුනක් | රු.2,000.00 |
| අංක හතර | රු.1,000,000.00 |
| ඉංග්‍රීසි අකුර සමග ඕනෑම අංක එකක් | රු.100.00 |
| ඉංග්‍රීසි අකුර සමග ඕනෑම අංක දෙකක් | රු.1,000.00 |
| ඉංග්‍රීසි අකුර සමග ඕනෑම අංක තුනක් | රු.100,000.00 |
| ඉංග්‍රීසි අකුර සමග අංක හතර | රු.50,000,000.00 |

## 2. ශනිදා




### සන්නාම දැක්ම

සඳුදා සිට ඉරිදා දක්වා (සතියේ දින 7) ලොතරැයි වෙළෙඳපලේ ප්‍රමුඛතම නිෂ්පාදනයක් බවට පත් වීම.

### සන්නාම මෙහෙවර

සතියේ දින හතෙහි ම පවත්වනු ලබන, අති නවීනතම තාක්ෂණය යොදා ගනිමින් නව්‍ය ත්‍යාග ව්‍යුහයන් හඳුන්වා දීම සහ එමගින් මණ්ඩලයේ ලාභදායී බව වැඩිදියුණු කිරීම.

### ලොතරැයි විස්තර

දිනුම් ඇදීමේ දින : සඳුදා සිට ඉරිදා දක්වා (සතියේ දින 7)

ලොතරැයි වර්ණ : තද නිල්, ලා නිල්, දම්, රතු, තැඹිලි, කොළ, සහ රෝස

ආරම්භක ජයමල්ල: 30,000,000

### ත්‍යාග ව්‍යුහය

| සංයෝජනය | ත්‍යාගය (රු.) |
|---|---|
| ඕනෑම ඉංග්‍රීසි අකුරක් | රු.20.00 |
| ඕනෑම එක් අංකයක් | රු.20.00 |
| ඕනෑම අංක දෙකක් | රු.100.00 |
| ඕනෑම අංක තුනක් | රු.2,000.00 |
| අංක හතර | රු.1,000,000.00 |
| ඉංග්‍රීසි අකුර සමග ඕනෑම අංක එකක් | රු.100.00 |
| ඉංග්‍රීසි අකුර සමග ඕනෑම අංක දෙකක් | රු.1,000.00 |
| ඉංග්‍රීසි අකුර සමග ඕනෑම අංක තුනක් | රු.100,000.00 |
| ඉංග්‍රීසි අකුර සමග අංක හතර | රු.30,000,000.00 |

# නිෂ්පාදන කළඹ පිළිබඳ දළ විශ්ලේෂණය

## 3. කප්රුක




- **සන්නාම දැක්ම**

ජැක්පොට් ත්‍යාගය දිනා ගැනීමේ අභිලාෂයෙන් පසුවන ජනතාවගේ සිහින සහ අපේක්ෂාවන් ඉටු කර දෙන ලොතරැයි නිෂ්පාදනය බවට පත්වීම.

- **සන්නාම මෙහෙවර**

ජැක්පොට් ත්‍යාගය දිනා ගැනීමේ අභිලාෂයෙන් පසුවන ජනතාව ප්‍රියකරන ලොතරැයි නිෂ්පාදන තෝරා ගැනීම බවට පත් වීම.

- **ලොතරැයි විස්තර**

දිනුම් ඇදීමේ දින : සඳුදා සිට ඉරිදා දක්වා (සතියේ දින 7)

ලොතරැයි වර්ණ : ලා නිල්, රෝස, කොළ, තැඹිලි, ඉන්ඩිගෝ, රතු සහ කහ

ආරම්භක ජයමල්ල : රු.120,000,000

- **ත්‍යාග ව්‍යුහය**

| සංයෝජනය | ත්‍යාගය (රු.) |
|---|---|
| ඕනෑම එක් අංකයක් | රු.20.00 |
| ඕනෑම ඉංග්‍රීසි අකුරක් | රු.20.00 |
| ඉංග්‍රීසි අකුර සමඟ ඕනෑම අංක එකක් | රු.100.00 |
| ඕනෑම අංක දෙකක් | රු.100.00 |
| ඉංග්‍රීසි අකුර සමඟ ඕනෑම අංක දෙකක් | රු.1,000.00 |
| ඕනෑම අංක තුනක් | රු.2,000.00 |
| ඉංග්‍රීසි අකුර සමඟ ඕනෑම අංක තුනක් | රු.100,000.00 |
| අංක 4 | රු.1,000,000.00 |
| අංක 4 සමඟ සුපිරි අංකය | රු.5,000,000.00 |
| ඉංග්‍රීසි අකුර සමඟ අංක 4 | රු.10,000,000.00 |
| ඉංග්‍රීසි අකුර සමඟ අංක 4 සහ සුපිරි අංකය | රු.120,000,000.00 |

## 4. ලග්න වාසනාව




- **සන්නාම දැක්ම**

ලග්න සංකේතයෙන් වාසනාව උදා වන්නේ යැයි විශ්වාස කරන ජනතාවගේ අපේක්ෂාවන් ඉටු කරන අංක එකේ ලොතරැයි නිෂ්පාදනය බවට පත්වීම.

- **සන්නාම මෙහෙවර**

ලග්න සංකේතයෙන් වාසනාව උදා වන්නේ යැයි විශ්වාස කරන ජනතාවගේ බලාපොරොත්තුව වන ලොතරැයි නිෂ්පාදනය

- **ලොතරැයි විස්තර**

දිනුම් ඇදීමේ දින : සඳුදා සිට ඉරිදා දක්වා (සතියේ දින 7)

ලොතරැයි වර්ණ : කහ, රතු, කොළ, දුඹුරු, නිල්, ලා නිල්, දම්

ආරම්භක ජයමල්ල : රු.2,000,000

- **ත්‍යාග ව්‍යුහය**

| සංයෝජනය | ත්‍යාගය (රු.) |
|---|---|
| ඕනෑම එක් අංකයක් | රු.20.00 |
| ඕනෑම ලග්න සංකේතයක් | රු.20.00 |
| ඕනෑම අංක දෙකක් | රු.100.00 |
| ඕනෑම අංක තුනක් | රු.1,000.00 |
| අංක 4 | රු.500,000.00 |
| ලග්න සංකේතය සමඟ ඕනෑම අංක එකක් | රු.60.00 |
| ලග්න සංකේතය සමඟ ඕනෑම අංක දෙකක් | රු.200.00 |
| ලග්න සංකේතය සමඟ ඕනෑම අංක තුනක් | රු.10,000.00 |
| ලග්න සංකේතය සමඟ අංක 4 | රු.2,000,000.00 |

## 5. සුපර් බෝල්




- **සන්නාම දැක්ම**

ශ්‍රී ලංකාවේ ලොතරැයි වෙළඳපොළ ප්‍රමුඛයා සහ ජනප්‍රිය ලොතරැයියක් බවට පත්වීම.

- **සන්නාම මෙහෙවර**

අති නවීනතම තාක්ෂණය යොදා ගනිමින් නව්‍ය ත්‍යාග ව්‍යුහයන් හඳුන්වා දීම සහ එමගින් මණ්ඩලයේ ලාභදායී බව වැඩිදියුණු කිරීම.

- **ලොතරැයි විස්තර**

දිනුම් ඇදීමේ දින : සඳුදා සිට ඉරිදා දක්වා (සතියේ දින 7)

ලොතරැයි වර්ණ : දම්, ලා නිල්, තැඹිලි, කොළ, රෝස, තද නිල්, සහ රතු

ආරම්භක ජයමල්ල : රු.50,000,000

- **ත්‍යාග ව්‍යුහය**

| සංයෝජනය | ත්‍යාගය (රු.) |
|---|---|
| ඕනෑම ඉංග්‍රීසි අකුරක් | රු.20.00 |
| ඕනෑම අංක එකක් | රු.20.00 |
| ඕනෑම අංක දෙකක් | රු.100.00 |
| ඕනෑම අංක තුනක් | රු.2,000.00 |
| අංක හතර | රු.1,000,000.00 |
| ඉංග්‍රීසි අකුර සමඟ ඕනෑම අංක එකක් | රු.100.00 |
| ඉංග්‍රීසි අකුර සමඟ ඕනෑම අංක දෙකක් | රු.1,000.00 |
| ඉංග්‍රීසි අකුර සමඟ ඕනෑම අංක තුනක් | රු.100,000.00 |
| ඉංග්‍රීසි අකුර සමඟ අංක හතර | රු.50,000,000.00 |

## 6. සංවර්ධන වාසනාව




- **සන්නාම දැක්ම**

සංවර්ධන ලොතරැයි මණ්ඩලයට ආදායම් සහ ලාභ උත්පාදනය කර දෙමින්, සුවිශේෂී, විශ්වාසනීය සහ ගෞරවනීය යෝජනා ක්‍රමයක් පිරිනමමින්, දිනුම් අදින දින දෙකෙහි ම ජනප්‍රියතම නිෂ්පාදනයක් බවට පත් වීම.

- **සන්නාම මෙහෙවර**

මණ්ඩලයේ ලාභදායීත්වය වැඩිදියුණු කරමින්, නවීනතම තාක්ෂණය හරහා නව්‍ය ත්‍යාග ව්‍යුහයක් පිරිනමමින්, බ්‍රහස්පතින්දා සහ සෙනසුරාදා දිනවල ශ්‍රී ලංකාවේ ජනප්‍රියතම අන්තර්ජාල නොවන ලොතරැයිය බවට පත්වීම.

- **ලොතරැයි විස්තර**

දිනුම් ඇදීමේ දින : බ්‍රහස්පතින්දා/සෙනසුරාදා

ලොතරැයි වර්ණ : නිල් සහ රතු

ආරම්භක ජයමල්ල : රු.10,000,000

- **ත්‍යාග ව්‍යුහය**

| සංයෝජනය | ත්‍යාගය (රු.) |
|---|---|
| දෛව අංකය | රු,20.00 |
| ඉංග්‍රීසි අකුර | රු.20.00 |
| ඕනෑම අංක එකක් | රු.20.00 |
| ඕනෑම අංක දෙකක් | රු.100.00 |
| ඕනෑම අංක තුනක් | රු.50,000.00 |
| දෛව අංකය සමඟ ඕනෑම අංක එකක් | රු.100.00 |
| දෛව අංකය සමඟ ඕනෑම අංක දෙකක් | රු.500.00 |
| දෛව අංකය සමඟ ඕනෑම අංක තුනක් | රු.500,000.00 |
| ඉංග්‍රීසි අකුර සමඟ ඕනෑම අංක එකක් | රු.100.00 |
| ඉංග්‍රීසි අකුර සමඟ ඕනෑම අංක දෙකක් | රු.500.00 |
| ඉංග්‍රීසි අකුර සමඟ ඕනෑම අංක තුනක් | රු.100,000.00 |
| අංක එකක්+දෛව අංකය+ඉංග්‍රීසි අකුර | රු.200.00 |
| අංක දෙකක්+දෛව අංකය+ඉංග්‍රීසි අකුර | රු.10,000.00 |
| අංක තුනක්+දෛව අංකය+ඉංග්‍රීසි අකුර | රු.10,000,000.00 |

# නිෂ්පාදන කළඹ පිළිබඳ දළ විශ්ලේෂණය

## 7. ජයෝදා




### සන්නාම දැක්ම

සංවර්ධන ලොතරැයි මණ්ඩලයට ආදායම් සහ ලාභ උත්පාදනය කර දෙමින්, සුවිශේෂී සහ විශ්වාසනීය යෝජනා ක්‍රමයක් පිරිනමමින් සඳුදා සහ බදාදා දිනවල ජනප්‍රියතම ලොතරැයි නිෂ්පාදනය බවට පත් වීම.

### සන්නාම මෙහෙවර

මණ්ඩලයේ ලාභදායීත්වය වැඩිදියුණු කරමින්, නවීනතම තාක්ෂණය හරහා නව්‍ය ත්‍යාග ව්‍යුහයන් පිරිනමමින්, සඳුදා සහ බදාදා දිනවල ශ්‍රී ලංකාවේ ජනප්‍රියතම ලොතරැයි නිෂ්පාදනය බවට පත්වීම.

### ලොතරැයි විස්තර

දිනුම් ඇදීමේ දින : සඳුදා සහ බදාදා

ලොතරැයි වර්ණ : කහ සහ තැඹිලි

ආරම්භක ජයමල්ල : රු. 20,000,000

### ත්‍යාග ව්‍යුහය

| සංයෝජනය | ත්‍යාගය (රු.) |
|---|---|
| ඕනෑම ඉංග්‍රීසි අකුරක් | රු.20.00 |
| ඕනෑම අංක එකක් | රු.20.00 |
| ඕනෑම අංක දෙකක් | රු.100.00 |
| ඕනෑම අංක තුනක් | රු.2,000.00 |
| අංක හතර | රු.1,000,000.00 |
| ඉංග්‍රීසි අකුර සමග ඕනෑම අංක එකක් | රු.40.00 |
| ඉංග්‍රීසි අකුර සමග ඕනෑම අංක දෙකක් | රු.1,000.00 |
| ඉංග්‍රීසි අකුර සමග ඕනෑම අංක තුනක් | රු.50,000.00 |
| ඉංග්‍රීසි අකුර සමග අංක හතර | රු.20,000,000.00 |

## 8. සසිරි




### සන්නාම දැක්ම

ප්‍රමුඛ පෙළේ ඩිජිටල් ලොතරැයි සන්නාමයක් බවට පත්වීම.

### සන්නාම මෙහෙවර

නව්‍ය, අධි තාක්ෂණික ලොතරැයි ක්‍රමයක් හඳුන්වා දීම මගින් මෙතෙක් ප්‍රයෝජනයට නොගත් නව වෙළඳපොලක් නිර්මාණය කිරීම සහ එමගින් මණ්ඩලයේ ලාභදායීත්වය වැඩිදියුණු කිරීම.

### ලොතරැයි විස්තර

දිනුම් ඇදීමේ දින : අඟහරුවාදා, සිකුරාදා සහ ඉරිදා

ලොතරැයි වර්ණ : දම්, ලා දුඹුරු සහ කොළ

### ත්‍යාග ව්‍යුහය

| සංයෝජනය | ත්‍යාගය (රු.) |
|---|---|
| ඕනෑම අංක එකක් | රු.20.00 |
| ඕනෑම අංක දෙකක් | රු.200.00 |
| ඕනෑම අංක තුනක් | රු.100,000.00 |

## 9. වාලම්පුරි



### සන්නාම දැක්ම

උතුරු හා නැගෙනහිර කලාපයේ වඩාත් ජනප්‍රිය ලොතරැයි නිෂ්පාදනය බවට පත්වීම සහ එම කලාපයේ වැඩිපුර ජයග්‍රහකයින් බිහි කිරීම.

### සන්නාම මෙහෙවර

කලාපය තුළ වඩා වැඩි ජයග්‍රාහී අවස්ථා බෙදාහැරීම මගින් සංස්කෘතික නිෂ්පාදනයක් ලෙස උතුරු හා නැගෙනහිර කලාපයේ ජනප්‍රිය ලොතරැයි නිෂ්පාදනය බවට පත්වීම.

### ලොතරැයි විස්තර

දිනුම් ඇදීමේ දින : මාස දෙකකට වරක්

ලොතරැයි වර්ණ : කොළ

### ත්‍යාග ව්‍යුහය

| සංයෝජනය | ත්‍යාගය (රු.) |
|---|---|
| ඕනෑම අංක එකක් | රු.50.00 |
| ඕනෑම අංක දෙකක් | රු.1,000.00 |
| ඕනෑම අංක තුනක් | රු.100,000.00 |
| ලග්න සංකේතය සමඟ ඕනෑම අංක තුනක් | රු.2,000,000.00 |

## 10. ක්ෂණික ලොතරැයිය

### හඳුන්වාදීම

ශ්‍රී ලංකාවේ ක්ෂණික ලොතරැයි පුරෝගාමියා ලෙස 1983 වර්ෂයේ දී සංවර්ධන ලොතරැයි මණ්ඩලය විසින් මුල් වරට ශ්‍රී ලංකාවට ක්ෂණික ලොතරැයියක් හඳුන්වා දෙන ලදී. වෙළඳපොළට හඳුන්වාදෙන විට එය මෙරටට නව්‍ය සංකල්පයක් විය.

### සන්නාම දැක්ම

මාර්ගගත නොවන ක්ෂණික දිනුම් ලොතරැයි වැඩසටහන හරහා ශ්‍රී ලංකාවේ වෙළඳපොළ ප්‍රමුඛයා බවට පත් වීම.

### සන්නාම මෙහෙවර

ශ්‍රී ලංකාවේ මාර්ගගත නොවන ක්ෂණික දිනුම් ලොතරැයි වෙළඳපොළ ප්‍රමුඛයා ලෙස නව්‍ය ත්‍යාග ව්‍යුහයක් හඳුන්වාදීම සහ මණ්ඩලයේ ලාභදායීත්වය වැඩිදියුණු කිරීම සඳහා නවීනතම තාක්ෂණය හරහා නව මුහුණුවරක් හඳුන්වා දීම.

### තරඟකාරී පසුබිම

සංවර්ධන ලොතරැයි මණ්ඩලය ක්ෂණික ලොතරැයි වෙළඳපොළට හඳුන්වා දීමෙන් පසු ජාතික ලොතරැයි මණ්ඩලය විසින් වෙළඳපොළට ක්ෂණික ලොතරැයි දෙකක් හඳුන්වා දෙන ලද සෙවණ සහ සමෘද්ධි එම ලොතරැයි දෙක විය.

සෙවණ ලොතරැයිය සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ ක්ෂණික සුරන ලොතරැයියේ සෘජු තරඟකරු විය. සෙවන ක්ෂණික ලොතරැයිය පැවැත්වීම සඳහා ජාතික ලොතරැයි මණ්ඩලය විසින් කළමනාකරණය කරනු ලබන වෙනමම ආයතනයක් ස්ථාපනය කරන ලදී. එම නිසා ජනතාව එය මෙරට තිබෙන ක්ෂණික ලොතරැයි ව්‍යාපාර ආයතනයක් ලෙස පිළිගත්හ.

# තිරසාරභාවය පිළිබඳ වාර්තාව

සංවර්ධන ලොතරැයි මණ්ඩලය වගකීමෙන් යුතු වර්ධනයක් සඳහා කැපවී සිටින අතර, මණ්ඩලය ස්වකීය ලොතරැයි නිෂ්පාදන සහ ත්‍යාග හරහා ශ්‍රී ලාංකිකයින්ට ක්‍රමයෙන් නියත සහ තිරසාර වටිනාකමක් නිර්මාණය කර දෙයි.

# තිරසාරභාවය පිළිබඳ වාර්තාව

පසුගිය දශක තුනක කාලය තුළදී සංවර්ධන ලොතරැයි මණ්ඩලය මූලික වශයෙන් ම තිරසාර ව්‍යාපාරික ආයතනයක් ලෙස පැවත තිබේ. ආරම්භයේ සිටම සංවර්ධන ලොතරැයි මණ්ඩලය හුදෙක් එහි ආසන්නතම පාර්ශ්වකරුවන්ගේ සුභසිද්ධියට වඩා වැඩි යමක් සැලකිල්ලට ගනිමින් තරගකාරී ව්‍යාපාර ක්‍රමෝපාය සකස් කිරීම සමාජයේ සමස්ත දිගු කාලීන අවශ්‍යතා හා සාරධර්ම සමග නොගැටෙන බව සහතික ලෙස විශ්වාස කරයි. මණ්ඩලයේ තිරසාරභාවය පිළිබඳ වාර්තාව එහි පැතිකඩ, තිරසාරභාවය සඳහා වන උපාය මාර්ග, ආර්ථික වගකීම, සමාජ වගකීම සහ පාරිසරික වගකීම යන ඒවායින් සමන්විත වේ.

සංවර්ධන ලොතරැයි මණ්ඩලය වගකීමෙන් යුතු වර්ධනයක් සඳහා කැපවී සිටින අතර එය ස්වකීය ලොතරැයි නිෂ්පාදන සහ ත්‍යාග හරහා ශ්‍රී ලාංකිකයින්ට ක්‍රමයෙන් නියත සහ තිරසාර වටිනාකමක් නිර්මාණය කර දෙයි. මෙම වාර්තාව මගින් සමාජ, පාරිසරික හා ආර්ථික වගවීම පවත්වා ගැනීම සඳහා සංවර්ධන ලොතරැයි මණ්ඩලය විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග අවධාරණය කර ඇති සංවර්ධන ලොතරැයි මණ්ඩලයෙහි සමාජ වගකීමට ව්‍යාපාරයේ, පාරිභෝගිකයින්ගේ සහ ලොතරැයි ජයග්‍රාහකයින්ගේ ආරක්ෂාව සඳහා ගෙන ඇති වගකීම් සහගත ක්‍රියාමාර්ග මෙන් ම ප්‍රජා සත්කාර වැඩසටහන් ද ඇතුළත් වේ. පාරිසරික වගකීම සාක්ෂාත් කර ගැනීම පිණිස සංවර්ධන ලොතරැයි මණ්ඩලය ස්වකීය ආයතනික ක්‍රියාකාරකම්වල පාරිසරික බලපෑම නියාමනය කරයි. ආර්ථික වගකීම, විනිවිදභාවයෙන් යුතු සහ සමබර වන පාලන ආකෘතියක් බවට පරිවර්තනය කරනු ලබයි.

## අපගේ මූලික සාරධර්ම

සංවර්ධන ලොතරැයි මණ්ඩලය අපගේ තෝරා ගෙන ඇති ව්‍යාපාරික ක්ෂේත්‍රය තුළ සුවිශේෂී පාරිභෝගික අත්දැකීමක්, කැපවීම, විශ්වාසනීයත්වය සහ උපදේශනය ලබා දීම සඳහා මණ්ඩලයට පැහැදිලි අභිලාෂයක් අඛණ්ඩව පවත්වා ගනී. මෙම අභිලාෂය සපුරාලීම සරල දෙයක් නොවන අතර එය බොහෝ දුරට අපි තිරසාර ආකාරයකට වගකීම් සහගත ව්‍යාපාරයක් බවට පත්වෙමින් සිටින බවට සැකයකින් තොරව සනාථ කිරීමට අපිට ඇති හැකියාව මත රඳා පවතියි.

අපගේ කැපවීමෙන් යුතු දැඩි ලෙස උද්යෝගිමත් සේවකයින් සම්බන්ධයෙන් සැලකූ විට, ඔවුන් අපට අති මහත් සහයෝගයක් ලබා දී ඇත. ඒ නිසාම තමන් ද එහි කොටසක් වීම ගැන ඔවුන්ට ආඩම්බර විය හැකි පරිසරයක් නිර්මාණය කිරීමට අපි මහත්සේ වෙහෙසෙන්නෙමු. අපගේ ශ්‍රම බලකායෙහි විශිෂ්ඨත්වය දිරිගැන්වීම පිණිස පුහුණුව සහ අඛණ්ඩ අධ්‍යාපනය සඳහා අවස්ථා ලබා දීම මගින් අපි අපගේ සේවක පිරිස සඳහා ආයෝජනය කරන්නේ අපගේ ව්‍යාපාරයේ සාර්ථකත්වය රඳා පවතින්නේ තම රැකියාව පිළිබඳ ඔවුන්ගේ ඇති තෘප්තිමත්භාවය මත වන බව අපි අවබෝධ කර ගෙන සිටින බැවින්ය. එමෙන්ම, අපගේ තිරසාරභාවය පිළිබඳ වැඩසටහන මගින් පාරිභෝගික අත්දැකීම් වැඩිදියුණු කිරීමට, කර්මාන්තයේ රැකියා නිර්මාණය කිරීම සහ ජනාධිපති අරමුදලට හා මහපොළ භාරකාර අරමුදලට දායකත්වය ලබා දීම තුළින් සෞඛ්‍ය රැකවරණය සහ අධ්‍යාපනය වැනි වැදගත් සේවාවන් සපයා දීමට සහාය වීම සඳහා ආදායම වැඩි කර ගැනීමට අරමුණු කරයි. සංවර්ධන ලොතරැයි මණ්ඩලය ලොතරැයි සපයා දීමේදී පාරිභෝගිකයින් කෙරෙහි වඩාත් නැඹුරුවී සිටින අතර, සේවා සපයන්නන් අධීක්ෂණය කිරීම අඛණ්ඩව සිදු කරයි.

## පාරිසරික වගකීම

පරිසරයට වන බලපෑම අවම කිරීම සඳහා අප විසින් දරන ලද ප්‍රයත්නයන් සාර්ථක වී ඇත. සංවර්ධන ලොතරැයි මණ්ඩලය සේවකයින් සඳහා පරිපූර්ණ පුහුණුව, නව්‍ය තාක්ෂණය සහ පාර්ශවකරුවන් සමග සහයෝගීතාවය හරහා එලදායී ප්‍රජා සහාය සේවාවන් සපයා දීමට දොරටුවක් විවර කර දෙයි. ඩිජිටල්කරණය හරහා මණ්ඩලය ස්වකීය ගනුදෙනුකරුවන්ගේ පහසුව උදෙසා වැඩි වැඩියෙන් යෙදවුම් සහ ඊ-සේවා හඳුන්වා දෙමින් පෘථිවිය මත කාබන් පිය සටහන අවම කිරීමට ඉලක්ක කරයි. අපි පාරිසරික බලපෑම පිළිබඳ සංවර්ධන ලොතරැයි මණ්ඩලයෙහි මෙහෙයුම් වැඩි දියුණු කිරීමට සහ ගනුදෙනුකරුවන් සහ සේවකයින් අතර හරිත දැනුවත්භාවය වැඩි කිරීමට ද අදහස් කරන්නෙමු. ඩිජිටල් තාක්ෂණය අනුව මණ්ඩලය විසින් හඳුන්වා දී ඇති දකුණු ආසියාවේ පළමු ඩිජිටල් ලොතරැයි නිෂ්පාදනය වන සසිරි ලොතරැයිය කුසලතා සම්මානය දිනා ගැනීමට සමත් විය. සසිරි ඩිජිටල් ලොතරැයිය සංවර්ධන ලොතරැයි මණ්ඩලය විසින් වැඩි දියුණු කළ හරිත මුල්පිරීමකි. ටිකට්පත් මුද්‍රණය අඩු කිරීමේ අපේක්ෂාවෙන් දැනට පවතින වෙනත් ලොතරැයි නිෂ්පාදන කරා ඩිජිටල් ලොතරැයි සංකල්පය ව්‍යාප්ත කර ඇත. මෙම වාර්තාව තුලින් අපි සෑම වර්ෂයකම මෙම ක්ෂේත්‍රයන්හි අපි අත් කර ගනිමින් සිටින ප්‍රගතිය පෙන්වා දෙන අතර ඉදිරි වර්ෂය සඳහා අපගේ අරමුණු ද ප්‍රකාශ කරන්නෙමු. මණ්ඩලය සිය ලොතරැයි නිෂ්පාදන හා ත්‍යාග තුළින් ශ්‍රී ලාංකිකයින්ගේ ජීවිතවලට ස්ථාවර හා තිරසාර වටිනාකමක් නිර්මාණය කරමින් කැපවූ සංවර්ධනයක් කෙරෙහි අවධානය යොමු කරයි.

සංවර්ධන ලොතරැයි මණ්ඩලය සමාජ, පාරිසරික සහ මූල්‍ය වගකීම් ඉටු කිරීම සඳහා වැඩපිළිවෙළ ක්‍රියාත්මක කර ඇති බව මෙම ක්‍රියාකාරකම් මගින් අවධාරණය කරයි. සංවර්ධන ලොතරැයි මණ්ඩලය ස්වකීය ආයතනික ව්‍යායාමයන්හි පාරිසරික බලපෑම් අධීක්ෂණය කරයි.

## ආයතනික සමාජ වගකීම

සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ අපට අවශ්‍ය වන්නේ අපගේ ආයතනික සමාජ වගකීම් ප්‍රතිපත්ති මත පදනම්ව වටිනා ප්‍රජා සාමාජිකයෙකු ලෙස පිළිගනු ලැබීමටයි. එබැවින්, සංවර්ධන ලොතරැයි මණ්ඩලය අර්ථවත්, දිගුකාලීන හවුල්කාරිත්වයන් හරහා ප්‍රජාවට දායක වීම සහ පාරිසරික වශයෙන් තිරසාර ලෙස ව්‍යාපාර පවත්වාගෙන යාම කෙරෙහි අවධානය යොමු කරයි. සංවර්ධන ලොතරැයි මණ්ඩලය ජනාධිපති අරමුදලට සහ මහපොළ උසස් අධ්‍යාපන භාර අරමුදලට, සත්කාරක ප්‍රජාවන්ට සහ ප්‍රාදේශීය පුණ්‍යායතනවලට අරමුදල් සපයා දෙමින් ශ්‍රී ලංකාවේ අපගේ ජනතාවගේ ජීවිත පොහොසත් කරයි. ලොතරැයි අලෙවිකරුවන් / බෙදාහරින්නන්ගේ සමස්ත දාමයට ම සහාය සපයා දෙමින් පුද්ගලයින්ගේ ව්‍යවසායකත්වය සවිබල ගැන්වීම අරමුණු කර ගත් සමාජ ව්‍යාපාර වැඩසටහන් කිහිපයක් දියත් කිරීමට ද සංවර්ධන ලොතරැයි මණ්ඩලයට හැකි විය.

අපගේ තරුණ වෘත්තිකයින් අතර වෘත්තීය පුහුණුව නගා සිටුවීමේ අපගේ වෑයම දැනුම් දෙමින් ව්‍යාපාර මට්ටම සඳහා අනුමත පුහුණු ආයතනයක් ලෙස ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින්

# තිරසාරභාවය පිළිබඳ වාර්තාව

සංවර්ධන ලොතරැයි මණ්ඩලය හඳුනාගන්නා ලදී. 2022 වසර තුළ, කොවිඩ් 19 වසංගතයේ ගොදුරු බවට පත් වූ සහ විවිධ රෝගවලින් පෙළෙන සහ මියගිය අලෙවි නියෝජිතයින්ට සහ අලෙවි සහයකයින්ට රු. 6,072,130 ක් ප්‍රදානය කරන ලදී. තවද, දිවයින පුරා විසිරී සිටින මණ්ඩලයේ අලෙවි නියෝජිතයින් අතර උයන් කුඩ 122 ක් බෙදා හැර ඇත. එක් එක් දිසත්‍රික්කය තුළ ඉහළම අලෙවිය වාර්තා කර ඇති දිස්ත්‍රික් අලෙවි නියෝජිතයන් දිරි ගැන්වීමේ අදහස ඇතිව, වරින් වර දිස්ත්‍රික්කවල කුඩා රැස්වීම් සංවිධානය කරන ලද අතර මෙවැනි රැස්වීම්වලදී අලෙවි සහයකයින්ගේ අදහස්වලට සවන් දෙන ලදී. මෙම ක්‍රියාමාර්ගය අලෙවිසැල් අධීක්ෂණය කිරීමට සහ ත්‍යාග පිරිනමමින් ඔවුන්ගේ සේවය අගය කිරීමට අපට අවස්ථාව ඇති කරන ලදී.

## වෙනත් ආයතනික සමාජ වගකීම් කටයුතු

2022 වසර තුළදී රු.565,500 ක් මුදලක් විශ්ව විද්‍යාල ප්‍රවේශය සඳහා තෝරාගත් මණ්ඩලයේ අලෙවි නියෝජිතයින්ගේ ළමුන් වෙත ශිෂ්‍යත්ව පිරිනැමීම සඳහා වියදම් කරන ලදි. ජනාධිපති අරමුදල තුළින් අපගේ සමාජයෙහි අවශ්‍ය සිසුන්ට ශිෂ්‍යත්ව බෙදාහැරීම මගින් සිසුන්ගේ ජීවිත වෙත අපි අර්ථවත් දායකත්වයක් කර ඇත යන සාධකයට අපගේ ප්‍රතිලාභීන් සජීව සාක්ෂියකි. සංවර්ධන ලොතරැයි මණ්ඩලය මහනුවර මහනගර සභාවේ සේවකයින් වෙත නගර අලංකරණය තුළ ඔවුන්ගේ සේවය ඇගයීම පිණිස ටී-ෂර්ට් 100 ක් බෙදාහරින ලදී.

2022 වසර තුළ, සංවර්ධන ලොතරැයි මණ්ඩලය රුහුණු කතරගම මහා දේවාලයේ ඇසළ පෙරහැර සඳහා රු. 500,000 ක අනුග්‍රහකත්වයක් මහනුවර ශ්‍රී දළඳා පෙරහැර සඳහා රු. 2,000,000 ක් ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ රජ මහා විහාරයේ වාර්ෂික ශ්‍රී දළඳා මහා පෙරහැර සඳහා රු. 200,000 ක් සහ බෙල්ලන්විල රජ මහා විහාරයේ වාර්ෂික ඇසළ පෙරහැර සඳහා රු. 200,000 ක් වශයෙන් අනුග්‍රාහකත්ව ලබා දුන්නේය.

## මානව සම්පත්

යහපත් ව්‍යාපාරික පිළිවෙත සංවර්ධනය කිරීමේදී සහ කල් පවත්නා පාර්භෝගික සම්බන්ධතා ගොඩනැගීමේදී අපගේ සේවකයින් වැදගත් කාර්යභාරයක් ඉටුකරන බව අපි පිළිගනිමු. අපි අපගේ සේවකයින්ව ඉතා දැඩි ලෙස අගය කරන අතර, ඔවුන් ලබා දෙන ඉතා වටිනා දායකත්වයන් පිළිබඳ අපගේ ඇගයීම පෙන්නුම් කිරීම සඳහා නව්‍ය, සහයෝගී සහ ආකර්ෂණීය සේවා ස්ථානයක් නිර්මාණය කිරීමට අපි උත්සාහ කරන්නෙමු.

## කාර්ය මණ්ඩල සංවර්ධන අරමුණු

- රැකියා සහ වෘත්තීය අවස්ථා නිර්මාණය කිරීම සහ දිරිගැන්වීම.
- ශ්‍රම බලකා සැලසුම් කිරීම සහ නිපුණතා කළමනාකරණ වැඩසටහන් ගුණාත්මක බඳවා ගැනීම් සහ රඳවා ගැනීමේ ක්‍රියාමාර්ග, නායකත්ව සහ අනුප්‍රාප්තික සැලසුම්කරණය සංවර්ධනය කිරීම සහ අඛණ්ඩ අධ්‍යාපනය දැනුම ලබා දීම අඛණ්ඩව වැඩිදියුණු කිරීම.
- අපගේ සේවකයින්ව සවිබල ගන්වනු ලබන බව සහ ඔවුන්ගේ ජයග්‍රහණ වෙනුවෙන් ඔවුන්ට දිරිගැන්වීම් ලබා දෙනු ලබන බව සහතික කිරීම.
- සමාගමේ ක්‍රමෝපායික දිශාව පිළිබඳව අපගේ කාර්ය මණ්ඩලය හොඳින් දැනුවත් කර සහ දැන සිටින බව සහතික කිරීම.

## දේශීය පුහුණු වැඩසටහන්

| පුහුණු වැඩසටහන / වැඩමුළුව | සහභාගීවූවන්ගේ නම් | තනතුර | පුහුණු කාලය | ස්ථානය |
|---|---|---|---|---|
| ජාතික දත්ත ආරක්ෂණ නීති සම්මන්ත්‍රණය 2022 | 1. වසන්ත සේනාධීර මහතා | අභ්‍යන්තර විගණක | දින 01 | ශ්‍රී ලංකා නීතිඥ සංගමය |
| | 2. මධුර හර්ෂණ මහතා | සහකාර සාමාන්‍යාධිකාරී (තොරතුරු තාක්ෂණ) | | |
| | 3. අනුරුද්ධිකා මහනාම මහත්මිය | තොරතුරු තාක්ෂණ සහකාර | | |
| | 4. මනෝජ් ශ්‍යාමක ද සිල්වා මහතා | තොරතුරු තාක්ෂණ සහකාර | | |
| | 5. ජලිත් පුංචිහේවා මහතා | කළමනාකර සහකාර | | |
| අභිප්‍රේරණ වැඩසටහන | රියදුරන් (16) | | දින 01 | නිපුණතා සංවර්ධන අරමුදල |
| පරිගණක යෙදුම | ප්‍රවාහන නිලධාරී<br>කළමනාකර සහකාර (14) | | දින 03 | නිපුණතා සංවර්ධන අරමුදල |

## නිලධාරීන් සඳහා උසස් අධ්‍යාපන වැඩසටහන්

| නිලධාරියා | තනතුර | පාඨමාලාව | කාලසීමාව |
|---|---|---|---|
| අයි.ඩී.පී. කුමාරසිරි මහතා | කලාප කළමනාකරු | ව්‍යාපාර පරිපාලනය පිළිබඳ පශ්චාත් උපාධිය | අවුරුදු 02 |

# 2022.12.31 දිනට අනුමත සේවක සංඛ්‍යාව

| තනතුර | වැටුප | අනුමත සේවක සංඛ්‍යාව | සිටින සේවක සංඛ්‍යාව | පුරප්පාඩු | අතිරික්ත | කොන්ත්‍රාත් සේවක සංඛ්‍යාව | අනුයුක්ත කිරීම් විස්තර |
|---|---|---|---|---|---|---|---|
| සභාපති/ ප්‍රධාන විධායක නිලධාරී | | 1 | 1 | | | | |
| සාමාන්‍යාධිකාරී | H.M - 2.1 | 1 | 1 | | | | |
| නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (අලෙවි) | H.M - 1.1 | 1 | 1 | | | | |
| නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මුදල්) | H.M - 1.1 | 1 | 1 | | | | |
| සහකාර සාමාන්‍යාධිකාරී (අලෙවි) | M.M-1.1 | 2 | 1 | 1 | | | |
| සහකාර සාමාන්‍යාධිකාරී (මුදල්) | M.M- 1.1 | 3 | 2 | 1 | | | |
| සහකාර සාමාන්‍යාධිකාරී (විකුණුම්) | M.M- 1.1 | 2 | 1<br>1<br>වැඩබලන | 1 | | | |
| සහකාර සාමාන්‍යාධිකාරී (මා.ස.ක./පරිපාලන) | M.M- 1.1 | 1 | 1 | | | | |
| සහකාර සාමාන්‍යාධිකාරී (ප්‍රසම්පාදනය) | M.M- 1.1 | 1 | 1 | | | | |
| සහකාර සාමාන්‍යාධිකාරී (තොරතුරු තාක්ෂණ) | M.M- 1.1 | 1 | 1 | | | | |
| අභ්‍යන්තර විගණක | M.M- 1.1 | 1 | 1 | | | | |
| පරිපාලන නිලධාරී | J.M- 1.1 | 1 | 1 | | | | |
| ප්‍රධාන ආරක්ෂක නිලධාරී | J.M- 1.1 | 1 | 1 | | | | |
| ප්‍රවාහන නිලධාරී | J.M- 1.1 | 1 | 1 | | | | |
| කලාප කළමනාකරු | J.M- 1.1 | 10 | 10 | | | | |
| ගිණුම් නිලධාරී | J.M- 1.1 | 4 | 4 | | | | |
| පද්ධති/වැඩසටහන් විශ්ලේෂක | J.M- 1.1 | 1 | 1 | | | | |
| ප්‍රසම්පාදන නිලධාරී | J.M- 1.1 | 1 | 1 | | | | |
| මානව සම්පත් නිලධාරී | J.M- 1.1 | 1 | 1 | | | | |
| අලෙවි හා ප්‍රචාරණ නිලධාරී | J.M- 1.1 | 1 | 1 | | | | |
| අලෙවි ප්‍රවර්ධන සහකාර | MA - 3 | 24 | 16 | 8 | | | |
| තත්ත්ව පාලන සහකාර | MA - 3 | 1 | 0 | 1 | | | |
| තොරතුරු තාක්ෂණ සහකාර | MA - 3 | 4 | 2 | 2 | | | |
| මාධ්‍ය හා මහජන සම්බන්ධතා සහකාර | MA-3 | 1 | 1 | | | | |
| ගිණුම් සහකාර | M.A-2.2 | 2 | 0 | 2 | | | |
| ප්‍රධාන කළමනාකරණ සහකාර | MA-1.2 | 1 | 1 | | | | |
| **කළමනාකරණ සහකාර (137 කළමනාකරණ සහකාර හා 01 – පෞද්ගලික සහකාර තනතුර)** | MA-1.2 | 138 | 125 | 11 | | 2 | |
| අලෙවි සම්බන්ධීකාරක | MA-1.1 | 5 | 3 | 2 | | | |
| රියදුරු | P.L - 3 | 43 | 40 | 1 | | 1 | 1 |
| විදුලි කාර්මික | P.L -3 | 2 | 2 | | | | |
| කාර්යාල කාර්ය සහායක | P.L -1 | 65 | 59 | 5 | | 1 | |
| ක්ෂේත්‍ර ප්‍රවර්ධක | P.L -1 | 10 | 10 | 0 | | | |
| ක්ෂේත්‍ර ජංගම රථ නිවේදක | P.L -1 | 6 | 1 | 5 | | | |
| ආරක්ෂක සහායක | P.L -1 | 3 | 15 | | *12 | | |
| **එකතුව** | | **341** | **308** | **40** | ***12** | **4** | **1** |

* තනතුරු දරන්නාට පෞද්ගලික වනසේ අනුමත කර ඇත.

# 2022.12.31 දිනට සේවක සංඛ්‍යා තත්ත්වය

## වර්ගය අනුව කාර්ය මණ්ඩලය

| | |
|---|---|
| සභාපති/ ප්‍රධාන විධායක නිලධාරී | 1 |
| සාමාන්‍යාධිකාරී | 1 |
| නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී | 2 |
| සහකාර සාමාන්‍යාධිකාරී | 7 |
| අභ්‍යන්තර විගණක | 1 |
| පරිපාලන නිලධාරී | 1 |
| ප්‍රධාන ආරක්ෂක නිලධාරී | 1 |
| කලාප කළමනාකරු | 10 |
| ගිණුම් නිලධාරී | 4 |
| පද්ධති/වැඩසටහන් විශ්ලේෂක | 1 |
| මානව සම්පත් නිලධාරී | 1 |
| ප්‍රසම්පාදන නිලධාරී | 1 |
| ප්‍රවාහන නිලධාරී | 1 |
| අලෙවි හා ප්‍රචාරණ නිලධාරී | 1 |
| ප්‍රදේශ අලෙවි ප්‍රවර්ධන සහකාර | 16 |
| තොරතුරු තාක්ෂණ සහකාර | 2 |
| මාධ්‍ය හා මහජන සම්බන්ධතා සහකාර | 1 |
| ප්‍රධාන කලමනකාරණ සහකාර | 1 |
| කලමනකාරණ සහකාර | 127 |
| අලෙවි සම්බන්ධීකාරක | 3 |
| රියදුරු | 42 |
| විදුලි කාර්මික | 2 |
| කාර්යාල කාර්ය සහායක | 60 |
| ක්ෂේත්‍ර ප්‍රවර්ධක | 10 |
| ක්ෂේත්‍ර ජංගම රථ නිවේදක | 1 |
| ආරක්ෂක සහකාර | 15 |
| එකතුව | **313** |

## වයස් කාණ්ඩය අනුව කාර්යය මණ්ඩලය

| | |
|---|---|
| 21 - 30 | 43 |
| 31 - 40 | 103 |
| 41 - 50 | 104 |
| 51 - 60 | 63 |
| එකතුව | **313** |

## ස්ත්‍රීපුරුෂභාවය අනුව කාර්ය මණ්ඩලය

| | |
|---|---|
| පුරුෂ කාර්ය මණ්ඩලය | 221 |
| ස්ත්‍රී කාර්ය මණ්ඩලය | 92 |
| එකතුව | **313** |

# ආයතනික පාලනය

ආයතනික පාලන පද්ධතිය සංවර්ධන ලොතරැයි මණ්ඩලයට තීරණ ගැනීම සඳහා වන පරිචයන් සහ මගපෙන්වීමේ ප්‍රතිපත්ති නිර්වචනය කර දෙන අතරම, මණ්ඩලයෙහි දිගු කාලීන අරමුණු සහ උපාය මාර්ගික සැලසුම් වලට මග පෙන්වයි. ආයතනික පාලන ආකෘතිය මගින් සංවර්ධන ලොතරැයි මණ්ඩලයෙහි විවිධ මට්ටම් අතර, විශේෂයෙන් ම පාලනයෙහි මට්ටම් අතර, එනම් අධ්‍යක්ෂ මණ්ඩල සහ විධායක කළමනාකරණ මට්ටම් අතර බලතල සහ වගකීම බෙදී යන ආකාරය සංක්ෂිප්තව දක්වා ඇත. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මණ්ඩලයේ ආයතනික ප්‍රතිපත්ති ස්ථාපනය කරන අතර තම ව්‍යාපාරයේ මනා ක්‍රියාකාරිත්වය සඳහා වගකිව යුතු පුද්ගලයින් වන ප්‍රධාන විධායක නිලධාරිට සහ විධායක නිලධාරීන්ට ක්‍රමෝපායික මග පෙන්වීමක් සපයා දෙයි. 1997 අංක 20 දරණ සංවර්ධන ලොතරැයි පනත මගින් සංවර්ධන ලොතරැයි මණ්ඩලය පාලනය වෙයි. මණ්ඩලයේ ව්‍යුහය පහත සඳහන් පරිදි පනතේ 3(අ) වගන්තිය යටතේ විශේෂිතව දක්වා ඇත.

(අ) පහත සඳහන් නිල බලයෙන් පත්වන සාමාජිකයින්

(I) මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාරකාර මණ්ඩලයේ සභාපති හෝ ඔහුගේ නියෝජිතයෙකු.

(ii) ජනාධිපති ලේකම් හෝ ඔහුගේ නියෝජිතයෙකු.

(iii) අමාත්‍යවරයාගේ අමාත්‍යංශයේ ලේකම් හෝ ඔහුගේ නියෝජිතයෙකු.

(ආ) අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන තවත් සාමාජිකයින් දෙදෙනෙකු.

අමාත්‍යවරයා විසින් සභාපතිවරයෙකු පත් කරනු ලැබිය යුතු අතර, එම සභාපතිවරයා මණ්ඩලයේ පරිපාලනය කිරීමේ සහ කටයුතු කළමනාකරණය කිරීමේ වගකීම පැවරෙන හා ප්‍රධාන විධායක නිලධාරී වන්නේය.

### අධ්‍යක්ෂ මණ්ඩලයේ කාර්යභාරය

රජයේ ප්‍රතිපත්තිවලට අනුකූලව අධ්‍යක්ෂ මණ්ඩලය ආයතනයේ කාර්යක්ෂම කළමනාකරණය සම්බන්ධයෙන් වගකිව යුතු වන්නේය. සියලු ව්‍යවස්ථාපිත හා අනෙකුත් කළමනාකරණ නියාමන අවශ්‍යතාවයන්ට අනුකූලව වන අතරම, සම්පත් ආරක්ෂා කිරීම, ප්‍රමාණවත් පරිදි ගිණුම් පවත්වා ගැනීම සහ නිවැරදි වාර්තා සම්පාදනය කිරීම සහතික කරමින් මෙය සාක්ෂාත් කරගත යුතුය.

එබැවින් අධ්‍යක්ෂ මණ්ඩලය පහත සඳහන් දෑ සහතික කළ යුතුය:

- සංවිධානයේ උපායමාර්ගික අරමුණු ක්‍රියාත්මකව පවතින බව සහතික කිරීම
- උපායමාර්ගික අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා නායකත්වය ලබා දීම
- ඵලදායී අභ්‍යන්තර පාලනයක් සහ අවදානම් කළමනාකරණ පද්ධතියක් ක්‍රියාත්මක වන බවට සහතික කිරීම
- ආයතන කළමනාකරණ කටයුතු ඵලදායී ලෙස අධීක්ෂණය කිරීම
- නිතිපතා වන පදනමකින් අවශ්‍ය කරනු ලබන මූල්‍ය අංශ සහ අනාවරණයන් පිළිබඳව ප්‍රමාණවත් ලෙස කොටස් හිමියන් වෙත වාර්තා කිරීම
- සම්පත් සහ වත්කම් වගකීමෙන් යුතුව භාවිතා කිරීම
- අදාළ අණ පනත්, මාර්ගෝපදේශ සහ චක්‍රලේඛ ආදිය ප්‍රකාරව ඔවුන්ගේ සියලු ක්‍රියාමාර්ග සඳහා වගකිව යුතු වීම

### අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්

අයවැය සහ අදාළ ප්‍රමිතීන්ට අනුකූලව ආයතනික මෙහෙයුම් සහ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වල ප්‍රතිඵල දැඩි ලෙස හා නිරන්තරයෙන් අධීක්ෂණය කරනු ලැබේ. අධ්‍යක්ෂ මණ්ඩලයේ අවධානය සවිස්තරාත්මකව අවශ්‍ය කරන අනෙකුත් කාරණා සමග සම්මත න්‍යාය පත්‍රයක් අනුගමනය කරනු ලැබේ. අධ්‍යක්ෂ මණ්ඩලය මසකට වරක් රැස් වන අතර අවශ්‍ය ඕනෑම අවස්ථාවක විශේෂ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් පවත්වනු ලැබේ.

### සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ කමිටු

1. කළමනාකරණ කමිටුව
2. විගණන සහ කළමනාකරණ කමිටුව
3. ටෙන්ඩර් මණ්ඩල කමිටුව
4. කාර්ය මණ්ඩල සුභසාධක කමිටුව
5. වෙළෙඳ දැන්වීම් කමිටුව
6. සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ සංස්කෘතික සහ කලා සංගමය

### කළමනාකරණය

මණ්ඩලයේ එදිනෙදා මෙහෙයුම් කටයුතු සභාපති/ප්‍රධාන විධායක නිලධාරීගේ ඉහළ කළමනාකරණ සහ ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කණ්ඩායම් වෙත පවරා තිබේ. අවදානම් සහ අවස්ථා හඳුනාගෙන නිසි කලට අවශ්‍ය පියවර ගනු ලබන බවත්, අභිමතාර්ථ ඉටුකර ගැනීම සඳහා අයවැය නියම කරනු ලබන බවත් එම කණ්ඩායම් විසින් සහතික කළ යුතු වේ.

# ආයතනික පාලනය

## 2022 වර්ෂයේ දී පවත්වන ලද අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සංඛ්‍යාව

| රැස්වීමෙහි දිනය | අධ්‍යක්ෂවරයාගේ නම | තනතුර | පැමිණීම |
|---|---|---|---|
| 25.01.2022 | අජිත් ගුණරත්න නාරගල මහතා | සභාපති / ප්‍ර.වි.නි | ✔ |
| | ජේ .එම්. හදානි ජයවර්ධන මහත්මිය | අධ්‍යක්ෂ | ✔ |
| | රවින්ද්‍ර ජේ. විමලවීර මහතා | අධ්‍යක්ෂ | ✔ |
| | කේ. ඒ. එච්. සී. පුබුදුසිරි මෙනවිය | අධ්‍යක්ෂ | ✔ |
| | ජෙනට් ජයවර්ධන මහත්මිය | අධ්‍යක්ෂ | ✔ |
| | | | |
| 18.02.2022 | අජිත් ගුණරත්න නාරගල මහතා | සභාපති / ප්‍ර.වි.නි | ✔ |
| | ජේ. එම්. හදානි ජයවර්ධන මහත්මිය | අධ්‍යක්ෂ | ✔ |
| | රවින්ද්‍ර ජේ. විමලවීර මහතා | අධ්‍යක්ෂ | ✔ |
| | කේ. ඒ. එච්. සී. පුබුදුසිරි මෙනවිය | අධ්‍යක්ෂ | ✔ |
| | ජෙනට් ජයවර්ධන මහත්මිය | අධ්‍යක්ෂ | ✔ |
| | | | |
| 25.02.2022 | අජිත් ගුණරත්න නාරගල මහතා | සභාපති / ප්‍ර.වි.නි | ✔ |
| | ජේ. එම්. හදානි ජයවර්ධන මහත්මිය | අධ්‍යක්ෂ | නොපැමිණි |
| | රවින්ද්‍ර ජේ. විමලවීර මහතා | අධ්‍යක්ෂ | ✔ |
| | කේ. ඒ. එච්. සී. පුබුදුසිරි මෙනවිය | අධ්‍යක්ෂ | ✔ |
| | ජෙනට් ජයවර්ධන මහත්මිය | අධ්‍යක්ෂ | ✔ |
| | | | |
| 03.03.2022 | අජිත් ගුණරත්න නාරගල මහතා | සභාපති / ප්‍ර.වි.නි | ✔ |
| | ජේ. එම්. හදානි ජයවර්ධන මහත්මිය | අධ්‍යක්ෂ | නොපැමිණි |
| | රවින්ද්‍ර ජේ. විමලවීර මහතා | අධ්‍යක්ෂ | ✔ |
| | කේ. ඒ. එච්. සී. පුබුදුසිරි මෙනවිය | අධ්‍යක්ෂ | ✔ |
| | ජෙනට් ජයවර්ධන මහත්මිය | අධ්‍යක්ෂ | ✔ |
| | | | |
| 23.03.2022 | අජිත් ගුණරත්න නාරගල මහතා | සභාපති / ප්‍ර.වි.නි | ✔ |
| | ජේ.එම්. හදානි ජයවර්ධන මහත්මිය | අධ්‍යක්ෂ | ✔ |
| | රවින්ද්‍ර ජේ. විමලවීර මහතා | අධ්‍යක්ෂ | ✔ |
| | කේ. ඒ. එච්. සී. පුබුදුසිරි මෙනවිය | අධ්‍යක්ෂ | ✔ |
| | ජෙනට් ජයවර්ධන මහත්මිය | අධ්‍යක්ෂ | ✔ |
| | | | |
| 11.04.2022 | අජිත් ගුණරත්න නාරගල මහතා | සභාපති / ප්‍ර.වි.නි | ✔ |
| | ජේ. එම්. හදානි ජයවර්ධන මහත්මිය | අධ්‍යක්ෂ | නොපැමිණි |
| | රවින්ද්‍ර ජේ. විමලවීර මහතා | අධ්‍යක්ෂ | ✔ |
| | කේ. ඒ. එච්. සී. පුබුදුසිරි මෙනවිය | අධ්‍යක්ෂ | ✔ |
| | ජෙනට් ජයවර්ධන මහත්මිය | අධ්‍යක්ෂ | ✔ |

| රැස්වීමෙහි දිනය | අධ්‍යක්ෂවරයාගේ නම | තනතුර | පැමිණීම |
|---|---|---|---|
| 25.04.2022 | අජිත් ගුණරත්න නාරගල මහතා | සභාපති / ප්‍ර.වි.නි | ✔ |
| | ජේ. එම්. හද්‍රානි ජයවර්ධන මහත්මිය | අධ්‍යක්ෂ | නොපැමිණි |
| | රවීන්ද්‍ර ජේ. විමලවීර මහතා | අධ්‍යක්ෂ | ✔ |
| | කේ. ඒ. එච්. සී. පුබුදුසිරි මෙනවිය | අධ්‍යක්ෂ | ✔ |
| | ජෙනට් ජයවර්ධන මහත්මිය | අධ්‍යක්ෂ | ✔ |
| | | | |
| 30.05.2022 | අජිත් ගුණරත්න නාරගල මහතා | සභාපති / ප්‍ර.වි.නි | ✔ |
| | ජේ. එම්. හද්‍රානි ජයවර්ධන මහත්මිය | අධ්‍යක්ෂ | නොපැමිණි |
| | රවීන්ද්‍ර ජේ. විමලවීර මහතා | අධ්‍යක්ෂ | ✔ |
| | කේ. ඒ. එච්. සී. පුබුදුසිරි මෙනවිය | අධ්‍යක්ෂ | ✔ |
| | ජෙනට් ජයවර්ධන මහත්මිය | අධ්‍යක්ෂ | ✔ |
| | | | |
| 27.06.2022 | අජිත් ගුණරත්න නාරගල මහතා | සභාපති / ප්‍ර.වි.නි | ✔ |
| | එස්. ටී. කොඩිකාර මහතා | අධ්‍යක්ෂ | ✔ |
| | ඩී. එන්. නානායක්කාර මහතා | අධ්‍යක්ෂ | ✔ |
| | කේ. ඒ. එච්. සී. පුබුදුසිරි මෙනවිය | අධ්‍යක්ෂ | ✔ |
| | ජෙනට් ජයවර්ධන මහත්මිය | අධ්‍යක්ෂ | ✔ |
| | | | |
| 15.08.2022 | අජිත් ගුණරත්න නාරගල මහතා | සභාපති / ප්‍ර.වි.නි | ✔ |
| | එස්. ටී. කොඩිකාර මහතා | අධ්‍යක්ෂ | ✔ |
| | ඩී. එන්. නානායක්කාර මහතා | අධ්‍යක්ෂ | නොපැමිණි |
| | කේ. ඒ. එච්. සී. පුබුදුසිරි මෙනවිය | අධ්‍යක්ෂ | ✔ |
| | ජෙනට් ජයවර්ධන මහත්මිය | අධ්‍යක්ෂ | ✔ |
| | | | |
| 06.09.2022 | අජිත් ගුණරත්න නාරගල මහතා | සභාපති / ප්‍ර.වි.නි | ✔ |
| | එස්. ටී. කොඩිකාර මහතා | අධ්‍යක්ෂ | ✔ |
| | ඩබ්ලිව්. ඒ. සරත් කුමාර මහතා | අධ්‍යක්ෂ | ✔ |
| | කේ. ඒ. එච්. සී. පුබුදුසිරි මෙනවිය | අධ්‍යක්ෂ | ✔ |
| | ජෙනට් ජයවර්ධන මහත්මිය | අධ්‍යක්ෂ | ✔ |
| | | | |
| 28.09.2022 | අජිත් ගුණරත්න නාරගල මහතා | සභාපති / ප්‍ර.වි.නි | ✔ |
| | එස්. ටී. කොඩිකාර මහතා | අධ්‍යක්ෂ | ✔ |
| | ඩබ්ලිව්. ඒ. සරත් කුමාර මහතා | අධ්‍යක්ෂ | ✔ |
| | කේ. ඒ. එච්. සී. පුබුදුසිරි මෙනවිය | අධ්‍යක්ෂ | ✔ |
| | ජෙනට් ජයවර්ධන මහත්මිය | අධ්‍යක්ෂ | ✔ |

# ආයතනික පාලනය

| රැස්වීමෙහි දිනය | අධ්‍යක්ෂවරයාගේ නම | තනතුර | පැමිණීම |
|---|---|---|---|
| 09.11.2022 | අජිත් ගුණරත්න නාරගල මහතා | සභාපති / ප්‍ර.වි.නි | ✓ |
| | එස්. ටී. කොඩිකාර මහතා | අධ්‍යක්ෂ | ✓ |
| | ඩබ්ලිව්. ඒ. සරත් කුමාර මහතා | අධ්‍යක්ෂ | ✓ |
| | කේ. ඒ. එච්. සී. පුබුදුසිරි මෙනවිය | අධ්‍යක්ෂ | ✓ |
| | ජෙනට් ජයවර්ධන මහත්මිය | අධ්‍යක්ෂ | ✓ |
| | | | |
| 12.12.2022 | අජිත් ගුණරත්න නාරගල මහතා | සභාපති / ප්‍ර.වි.නි | ✓ |
| | එස්. ටී. කොඩිකාර මහතා | අධ්‍යක්ෂ | ✓ |
| | ඩබ්ලිව්. ඒ. සරත් කුමාර මහතා | අධ්‍යක්ෂ | ✓ |
| | කේ. ඒ. එච්. සී. පුබුදුසිරි මෙනවිය | අධ්‍යක්ෂ | ✓ |
| | ජෙනට් ජයවර්ධන මහත්මිය | අධ්‍යක්ෂ | ✓ |
| | | | |
| 23.12.2022 | අජිත් ගුණරත්න නාරගල මහතා | අධ්‍යක්ෂ | ✓ |
| | එස්. ටී. කොඩිකාර මහතා | අධ්‍යක්ෂ | ✓ |
| | ඩබ්ලිව්. ඒ. සරත් කුමාර මහතා | අධ්‍යක්ෂ | ✓ |
| | කේ. ඒ. එච්. සී. පුබුදුසිරි මෙනවිය | අධ්‍යක්ෂ | ✓ |
| | ජෙනට් ජයවර්ධන මහත්මිය | අධ්‍යක්ෂ | ✓ |

## 2022 වර්ෂයේ දී පවත්වන ලද විගණන සහ කළමනාකරණ කමිටු රැස්වීම් සංඛ්‍යාව

| රැස්වීමෙහි දිනය | අධ්‍යක්ෂවරයාගේ නම | තනතුර | පැමිණීම |
|---|---|---|---|
| 29.03.2022 | රවින්ද්‍ර ජේ. විමලවීර මහතා | අධ්‍යක්ෂ | ✓ |
| | ජේ. එම්. හදානි ජයවර්ධන මහත්මිය | අධ්‍යක්ෂ | ✓ |
| | කේ. ඒ. එච්. සී. පුබුදුසිරි මෙනවිය | අධ්‍යක්ෂ | ✓ |
| | ජෙනට් ජයවර්ධන මහත්මිය | අධ්‍යක්ෂ | ✓ |
| | | | |
| 04.08.2022 | කේ. ඒ. එච්. සී. පුබුදුසිරි මෙනවිය | අධ්‍යක්ෂ | ✓ |
| | එස්. ටී. කොඩිකාර මහතා | අධ්‍යක්ෂ | ✓ |
| | ජෙනට් ජයවර්ධන මහත්මිය | අධ්‍යක්ෂ | ✓ |
| | | | |
| 11.10.2022 | ඩබ්ලිව්. ඒ. සරත් කුමාර මහතා | අධ්‍යක්ෂ | ✓ |
| | කේ. ඒ. එච්. සී. පුබුදුසිරි මෙනවිය | අධ්‍යක්ෂ | ✓ |
| | එස්. ටී. කොඩිකාර මහතා | අධ්‍යක්ෂ | ✓ |
| | ජෙනට් ජයවර්ධන මහත්මිය | අධ්‍යක්ෂ | ✓ |
| | | | |
| 27.12.2022 | ඩබ්ලිව්. ඒ. සරත් කුමාර මහතා | අධ්‍යක්ෂ | ✓ |
| | කේ. ඒ. එච්. සී. පුබුදුසිරි මෙනවිය | අධ්‍යක්ෂ | ✓ |
| | එස්. ටී. කොඩිකාර මහතා | අධ්‍යක්ෂ | ✓ |
| | ජෙනට් ජයවර්ධන මහත්මිය | අධ්‍යක්ෂ | ✓ |

# අවදානම් කළමනාකරණ වාර්තාව

එලදායී අවදානම් කළමනාකරණය සංවර්ධන ලොතරැයි මණ්ඩලයෙහි ව්‍යාපාර ක්‍රියාවලියේ ප්‍රධාන සාධකයකි. අපගේ ව්‍යාපාරයෙහි අවදානම් සහ ප්‍රතිඵල අතර උචිත සමතුලිතතාවයක් ඇති කර ගැනීමට සහ පාලිත පරිසරයක් තුළ අපගේ වර්ධන සැලසුම් ක්‍රියාත්මක කිරීමට උපකාරී වන අවදානම් කළමනාකරණ හැකියාවන් අඛණ්ඩව වැඩි දියුණු කර ගැනීමට අපි උත්සාහ කරන්නෙමු. අවදානම් කළමනාකරණය සංවර්ධන ලොතරැයි මණ්ඩලයෙහි මෙහෙයුම් ව්‍යුහයේ ප්‍රධානතම අංගයක් වේ. මුහුණ දීමට සූදානම්ව සිටින අවදානම් මට්ටම් ඇතුළත අවදානම් නිරාවරණයවීම් කළමනාකරණය කිරීම මගින් ඉපැයීම්වල සහ ප්‍රාග්ධනයෙහි අහිතකර විචලනයන් සීමා කර ගැනීමට අපි උත්සාහ කරන්නෙමු.

අවදානම් හඳුනා ගැනීම සහ අවම කිරීම සඳහා වගකීම් සහගත ප්‍රවේශයක් සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ අවදානම් කළමනාකරණ පද්ධතියට ඇතුළත් වේ. අවදානම් දැනුවත් කිරීමේ චර්යාවන්ට සහාය දෙන ශක්තිමත් අවදානම් කළමනාකරණ සංස්කෘතියක් නිර්මාණය කිරීම සහ එමගින් අවදානම් මත පදනම්ව තීරණ ගැනීමට අනුබලය දීම අපගේ ප්‍රධාන අවධානය වී තිබේ. සංවර්ධන ලොතරැයි මණ්ඩලයෙහි දිගුකාලීන තිරසාර බව සහතික කිරීම සඳහා අපි අපගේ අවදානම් උපාය මාර්ග තවදුරටත් වැඩිදියුණු කරන්නෙමු.

සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ අවදානම් කළමනාකරණය උපායමාර්ගය විශේෂිත පාර්ශ්වකරුවන්, කළමනාකරුවන් සහ අධ්‍යක්ෂ මණ්ඩල සඳහා ප්‍රතිපෝෂණ ක්‍රමවේදයක් ලෙස ක්‍රියාත්මක වේ. මණ්ඩලයේ ව්‍යාපාර, මෙහෙයුම්, පද්ධති සහ සේවාවන් සඳහා දැනුවත්භාවයෙන් යුතු තීරණ ගැනීමේ උපාය මාර්ගික කේන්ද්‍රයක් ලෙස එයට හිමි වන තත්ත්වයෙන් එය සුවිශේෂී වේ. මෙය පහත සඳහන් දෑ හරහා ව්‍යාපාර අවදානම්වලට ආමන්ත්‍රණය කිරීම සඳහා උපායමාර්ගික සහ ව්‍යාපාර සැලසුම්කරණයට, ව්‍යාපෘති කළමනාකරණයට සහ ව්‍යාපාර ක්‍රියාවලි මට්ටම්වලට ස්ථාවර ප්‍රවේශයක් සපයා දෙයි :

- ව්‍යාපාර කාර්යයන් සහ ඒකක පුරා ඇති අවදානම් පිළිබඳ පොදු අවබෝධයක් ලබා දීම
- වැඩි දියුණු වූ ප්‍රමුඛතා නියම කර ගැනීම සහ තීරණ ගැනීම සඳහා පහසුකම් සැලසීම පිණිස කළමනාකරණයට අඛණ්ඩ අවදානම් තක්සේරුවක් සපයා දීම
- සේවක දැනුවත්භාවය සහ කළමනාකරණ වගකීම් වැඩි කිරීම

සංවර්ධන ලොතරැයි මණ්ඩලය පහත සඳහන් කර ඇති පරිදි විශේෂිත අවදානම් සමූහයකට යටත් වේ.

## ත්‍යාග මුදල් ගෙවීමේ අවදානම

සෑම තොග මට්ටමකදී ම ත්‍යාගවල සම්මත ගෙවීම් අනුපාතයක් පවත්වා ගත යුතුය. අවදානම විය හැක්කේ මුදල් ප්‍රවාහයට බලපෑ හැකි සිදුවීම් ඇතිවීමේ හැකියාව නිසා වැඩි මිල අනුපාතයක් තිබිය හැකි වීමයි. ඉහත සඳහන් කළ අවදානම ආවරණය කිරීම සඳහා සංවර්ධන ලොතරැයි මණ්ඩලය මුදුණ ආයතන වලින් රක්ෂණ ආවරණයක් ද ලබා ගනී.

## ආර්ථික අවදානම

සංවර්ධන ලොතරැයි මණ්ඩලයෙහි ගනුදෙනුකරුවන්ගේ මිලදී ගැනීමේ රටාවන් රටෙහි පවතින ආර්ථික හා දේශපාලන වෙනස්කම් වල අනුබලය මත පදනම් වේ.

## මූල්‍ය අවදානම

අකාර්යක්ෂම මුදල් ප්‍රවාහ කළමනාකරණය හා මූල්‍ය තොරතුරු සම්බන්ධ අවදානම් මගින් ආයතනවල ලාභදායීත්වයට හා එලදායීතාවයට හානි ගෙන දිය හැකියි. සංවර්ධන ලොතරැයි මණ්ඩලය නිසි රක්ෂණ ආවරණයක් සහතික කිරීම සහ ආයතනය පුරා පිරිවැය පාලන උපාය මාර්ග සම්බන්ධීකරණය කිරීම වැනි සාම්ප්‍රදායික මූල්‍ය අවදානම් කළමනාකරණ පිළිවෙත් භාවිතා කරයි.

## ද්‍රවශීලතා අවදානම

ඉහළ මට්ටමේ ත්‍යාග වේලාසනින් උපයා ගැනීම මගින් ද්‍රවශීලතා අවදානම් ඇති විය හැකිය. මෙම අවදානම අවම කිරීම පිණිස සංවර්ධන ලොතරැයි මණ්ඩලය ඉහළ මුදල් වත්කම් පවත්වාගෙන යයි. සංවර්ධන ලොතරැයි මණ්ඩලය නුබුන්වත් වුවද, මණ්ඩලය ගෙවීමට බැඳී සිටින ගෙවීම් ගෙවිය යුතු අවස්ථාව වන විට ඒවා ගෙවීම සඳහා ප්‍රමාණවත් තරම් මුදල් සම්පත් පවත්වාගෙන යාමට හෝ උත්පාදනය කිරීමට නොහැකි නම්, හෝ එසේ ගෙවීමට හැක්කේ සැලකිය යුතු ලෙස අවාසිදායක තත්ත්වයන් යටතේ පමණක් නම් ද්‍රවශීලතා අවදානම් පැන නගියි.

## මෙහෙයුම් අවදානම

පද්ධති ඇණහිටීම්, පුද්ගලයින් අතින් සිදුවිය හැකි දෝෂ, සාපරාධී ක්‍රියාකාරකම් හෝ අභ්‍යන්තර පද්ධතිමය බිඳවැටීම් හේතුවෙන් සිදු විය හැකි පාඩු මෙහෙයුම් අවදානම් වලට අයත් වේ. එවැනි තත්ත්වයන් මගින් පාරිභෝගික විශ්වාසයට හා ආයතනික ප්‍රතිරූපයට හානි සිදු විය හැකිය. මෙහෙයුම් අවදානම අවම කිරීම පිණිස සංවර්ධන ලොතරැයි මණ්ඩලය නිරතුරුව ම අභ්‍යන්තර පාලනයන් වැඩි දියුණු කරයි. ආයතනික අවදානම මගින් ඇති වන තර්ජනය අවම කිරීම සඳහා සංවර්ධන ලොතරැයි මණ්ඩලයෙහි කළමනාකාරිත්වය විසින් මෙහෙයුම් ඒකක ව්‍යාපාර ක්‍රියාවලි සහ මහා පරිමාණ ඒකක පිළිබඳ නිරන්තර අවදානම් තක්සේරු කිරීම් සිදුකරනු ලබයි.

## ව්‍යාපාර අවදානම

ව්‍යාපාර අවදානම උපායමාර්ගික සහ/හෝ කීර්තිනාම හේතූන් නිසා ඇති වන පිරිවැය පදනමට සාපේක්ෂව ඇති විය හැකි ආදායම් හිඟයට අදාළ වේ. අනෙකුත් අමතර කරුණු අතර, බාහිර සාර්ව ආර්ථික පරිසරය, සංවර්ධන ලොතරැයි මණ්ඩලය විසින් තෝරාගනු ලබන උපායමාර්ගය සහ මණ්ඩලය ක්‍රියාත්මක වන වෙළඳපොළ තුළ එයට ඇති කීර්තිනාමය මණ්ඩලයෙහි ආදායම් උත්පාදන හැකියාව කෙරෙහි බලපායි.

## කීර්තිනාම අවදානම

පාර්ශවකරුවන් අතර සංවර්ධන ලොතරැයි මණ්ඩලයෙහි ප්‍රතිරූපයට හානි සිදු වීම හේතුවෙන් කීර්තිනාම අවදානම ඇති විය හැකි අතර, එමගින් ව්‍යාපාර රඳවා තබා ගැනීමට සහ උත්පාදනය කිරීමට ඇති හැකියාව අඩපණ කරයි. විශ්වාසය, පැහැදීම හෝ ව්‍යාපාරික සම්බන්ධතාවය බිඳවැටීමෙන් එවැනි හානියක් සිදුවිය හැකිය.

සංවර්ධන ලොතරැයි මණ්ඩලය දෘශ්‍ය මාධ්‍ය සහ මහජන බැඳියාව මත විශ්වාසය තබා සිටීම මගින් මණ්ඩලය සැලකිය යුතු කීර්තිනාම පාඩු අවදානමකට ලක් වෙයි. මෙම අවදානම අවම කිරීම පිණිස සංවර්ධන ලොතරැයි මණ්ඩලය මහජන බැඳියාව රඳවා ගැනීම සඳහා එලදායී අලෙවිකරණ ව්‍යාපාර ක්‍රියාත්මක කරන අතර දැඩි පද්ධතික විනිවිදභාවයක් අනුගමනය කරමින් කටයුතු කරයි.

## නීති අවදානම

සංවර්ධන ලොතරැයි මණ්ඩලයට එරෙහිව ගනු ලැබිය හැකි අනාගත නීතිමය ක්‍රියාමාර්ග වලින් ආරක්ෂා වීමට අපොහොසත් වීම නීතිමය හානි සිදුවීමේ අවදානම වැඩි කරයි. සංවර්ධන ලොතරැයි මණ්ඩලය පිළිගත් නීති වෘත්තිකයන්ගේ උපදෙස් ලබා ගෙන එවැනි ක්‍රියාමාර්ග අවම කිරීම සඳහා සුදුසු පියවර ගෙන තිබේ.

## තොරතුරු තාක්ෂණ අවදානම

තොරතුරු තාක්ෂණ පද්ධතිය මගින් ලබා ගන්නා නිශ්චිත හා කාලෝචිත තොරතුරු සංවර්ධන ලොතරැයි මණ්ඩලයෙහි මෙහෙයුම් ක්‍රියාවලියේ මූලික ම අංගයක් වේ.

# විගණන සහ කළමනාකරණ කමිටු වාර්තාව

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ මූල්‍ය වර්ෂය සඳහා වන අපගේ වාර්තාව අපි සතුටින් ඉදිරිපත් කරන්නෙමු.

## විගණන කමිටුවේ සංයුතිය

විගණන කමිටුව පහත සඳහන් විධායක නොවන අධ්‍යක්ෂවරුන් හතර දෙනා (04) ගෙන් සමන්විත වේ.

| | |
|---|---|
| ඩබ්ලිව්. ඒ. සරත් කුමාර මහතා | විගණන හා කළමනාකරණ කමිටුවේ සභාපති |
| කේ. ඒ. එච්. සී. පුබුදුසිරි මෙනවිය | විගණන හා කළමනාකරණ කමිටුවේ සාමාජික |
| ජෙනට් ජයවර්ධන මහත්මිය | විගණන හා කළමනාකරණ කමිටුවේ සාමාජික |
| එස්. ටී. කොඩිකාර මහතා | විගණන හා කළමනාකරණ කමිටුවේ සාමාජික |

සාමාන්‍යාධිකාරී, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - අලෙවි, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - මුදල්, අභ්‍යන්තර විගණක, සහකාර සාමාන්‍යාධිකාරී - මානව සම්පත් හා පරිපාලන සහ අනෙකුත් අදාළ නිලධාරීන් මෙම රැස්වීම් වලට සහභාගී වීම අනිවාර්ය වේ. විගණකාධිපති දෙපාර්තමේන්තුවේ විගණන අධිකාරී මෙම කමිටුවේ නිරීක්ෂකයෙකු ලෙස රැස්වීම්වලට සහභාගී වේ.

## විගණන කමිටුවේ කාර්ය භාරය

පාර්ශ්වකරුවන්ගේ අයිතීන් සහ මණ්ඩලය සතු වත්කම් ආරක්ෂා කර ගැනීම සඳහා සංවර්ධන ලොතරැයි මණ්ඩලය ශක්තිමත් අභ්‍යන්තර පාලන ක්‍රමවේදයක් පවත්වා ගත යුතු වේ. මුදල් අමාත්‍යාංශය සහ අදාළ බලධාරීන් විසින් නිකුත් කර ඇති මාර්ගෝපදේශද කමිටුව විසින් අනුගමනය කරනු ලබයි. 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය තුළ දී විගණන කමිටුව විසින් එහි ප්‍රධාන වගකීම් වලට අදාළව සිදුකරන ලද ක්‍රියාකාරකම් පිළිබඳව සාරාංශයක් පහත දක්වා ඇත.

## මූල්‍ය වාර්තාකරණය

වාර්ෂික මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීමට පෙර එම ප්‍රකාශනවල අනුකූලතාවය සහ සම්පූර්ණ බව පරීක්ෂා කර බැලීම සහ ඒවායෙහි අඩංගු වැදගත් මූල්‍ය වාර්තාකරණ විනිශ්චයන් සමාලෝචනය කිරීම, ගිණුම්කරණ ප්‍රතිපත්ති, සටහන් සහ පරිවයන්, විනිශ්චය කිරීම අවශ්‍ය කරන ප්‍රධාන අංශ සහ නෛතික හා නියාමන අවශ්‍යතා වලට අනුකූල වීම සමාලෝචනය කිරීම මෙයට ඇතුළත් වේ.

මූල්‍ය ප්‍රකාශන විගණනය කිරීමෙන් සොයාගත් කරුණු සමාලෝචනය කිරීමෙහි කොටසක් ලෙස විගණන කමිටුව මෙම කරුණු විගණකාධිපති දෙපාර්තමේන්තුවෙහි නියෝජිත සමග සාකච්ඡා කළේය.

## අභ්‍යන්තර විගණනය

අනුමත වාර්ෂික විගණන සැලැස්මට අනුකූලව වරින් වර සිදු කරනු ලබන අභ්‍යන්තර විගණන පිළිබඳ කාලීන විගණන වාර්තා අභ්‍යන්තර විගණක විසින් ඉදිරිපත් කරනු ලැබේ. මෙම අභ්‍යන්තර විගණන වාර්තා මගින් මණ්ඩලයේ ක්‍රියාත්මකව පවතින පද්ධති හා ක්‍රියා පටිපාටිවල ඇති අඩුපාඩු අවධාරණය කර පෙන්වා දෙන අතර, නිර්දේශ ක්‍රියාත්මක කිරීම පිළිබඳ සාකච්ඡා කිරීමෙන් අනතුරුව අවශ්‍ය අවස්ථාවන්හි දී පවතින ක්‍රමවේද හා කාර්ය පටිපාටිවල වැඩිදියුණු කිරීම් නිර්දේශ කර කළමනාකරණ හා විගණන කමිටුවට ප්‍රගතිය වාර්තා කරයි. විගණන කමිටුවට අභ්‍යන්තර විගණනයෙන් නිතිපතා වාර්තා ලැබෙන අතර, එම කාල පරිච්ඡේදය තුළ සිදු කරන ලද එක් එක් විගණනය මගින් සොයා ගත් ප්‍රධාන කරුණු පිළිබඳ සාරාංශයක් එම වාර්තාවට ඇතුළත් වේ. කළමනාකරණයෙහි අදහස් ද එහි කොටසක් වන අතර, විගණනය විසින් නිරීක්ෂණය කර ඇති තත්ත්වයන්ට හේතු වී ඇති මූලික කරුණු සහ එම තත්ත්වයන් නැවත ඇතිවීම වළක්වා ගැනීම සඳහා ගත යුතු ක්‍රියාමාර්ග ද කමිටුව විසින් සමාලෝචනය කරනු ලබයි.

## අවදානම් කළමනාකරණය සහ පාලනයන්

අභ්‍යන්තර විගණනයේ සහ රජයේ විගණනයේ සහාය ඇතිව කමිටුව විසින් මණ්ඩලයේ මෙහෙයුම් සහ මූල්‍ය පාලන සහ කාර්ය පටිපාටිවල ඵලදායීතාවය තක්සේරු කරනු ලබන අතර, ඒවාට වියදම්, ආදායම් ක්‍රියාවලිය සහ ප්‍රාග්ධන වියදම් සඳහා අවසර දීමේ සීමා, අත්සන් කිරීමේ බලධාරීන්, තොරතුරු තාක්ෂණ යෙදවුම් පාලන සහ සංවර්ධනය කිරීම්, ආයතනික ව්‍යුහය, ප්‍රතිපත්ති, රාජකාරි වෙන් කර දීම සහ කළමනාකරණය විසින් සිදු කරන සමාලෝචන ඇතුළත් වේ. මණ්ඩලයෙහි මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ද්‍රවශීලතා තත්ත්වය නිරන්තරයෙන් නිරීක්ෂණය කරන ලදී. එහිදී හඳුනාගනු ලබන අඩුපාඩු අවශ්‍ය වැඩි දියුණු කිරීම් සඳහා වන නිර්දේශ ද සහිතව අධ්‍යක්ෂ මණ්ඩලය වෙත වාර්තා කරනු ලැබේ. පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින් මණ්ඩලය වෙත නිකුත් කරනු ලබන නියෝග කෙරෙහි කමිටුව විශේෂ අවධානයක් යොමු කරයි.

## විගණන කමිටුවේ රැස්වීම් ගණන

2022 වර්ෂය සඳහා රැස්වීම් හතරක් (04) පවත්වන ලද අතර ඒ සඳහා පැමිණීම පහත සඳහන් පරිදි වේ.

| අධ්‍යක්ෂවරයාගේ නම | පැමිණීම | අවසරය මත සහභාගී නොවූ |
|---|---|---|
| ඩබ්ලිව්. ඒ. සරත් කුමාර මහතා | 02/02 | නැත |
| කේ. ඒ. එච්. සී. පුබුදුසිරි මෙනවිය | 04/04 | නැත |
| රවින්ද්‍ර ජේ. විමලවීර මහතා | 01/01 | නැත |
| ජෙනට් ජයවර්ධන මහත්මිය | 04/04 | නැත |
| එස්. ටී. කොඩිකාර මහතා | 03/03 | නැත |
| ජේ. එම්. හදානි ජයවර්ධන මහත්මිය | 01/01 | නැත |



**ඩබ්ලිව්.ඒ. සරත් කුමාර මහතා**
**සභාපති - විගණන හා කළමනාකරණ කමිටුව**

# මූල්‍ය වාර්තාව

ස්වාධීන විගණකවරුන්ගේ වාර්තාව | 42

විගණන වාර්තාව 2022 සහ කළමනාකරණය විසින් ගෙන ඇති ක්‍රියාමාර්ගය | 53

විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය | 59

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය | 60

මුදල් ප්‍රවාහ ප්‍රකාශනය | 61

හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය | 62

ගිණුම්කරණ ප්‍රතිපත්ති | 63

අංශමය වාර්තාව | 68

අවසන් ගිණුම් පිළිබඳ සටහන් | 70

දස වසරක සාරාංශය | 80

# ස්වාධීන විගණකවරුන්ගේ වාර්තාව

**ජාතික විගණන කාර්යාලය**
**தேசிய கணக்காய்வு அலுவலகம்**
**NATIONAL AUDIT OFFICE**

මගේ අංකය / எனது இல. / My No. } පීලූආර්/එෆ්/ඩීඑල්බී/එෆ්ඒ/1/22/14 — ඔබේ අංකය / உமது இல. / Your No. } — දිනය / திகதி / Date } 2023 මැයි 31 දින

සභාපති,
සංවර්ධන ලොතරැයි මණ්ඩලය

**සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව**

---

යථෝක්ත වාර්තාව සහ විගණිත මූල්‍ය ප්‍රකාශන මේ සමග එවා ඇත.

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න
විගණකාධිපති

පිටපත :- ලේකම්, මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය

# ජාතික විගණන කාර්යාලය
# தேசிய கணக்காய்வு அலுவலகம்
# NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } පීලුආර්/එන්/ඩීඑල්බී/එෆ්ඒ/01/22 ඔබේ අංකය / உமது இல. / Your No. } දිනය / திகதி / Date } 2023 මැයි 31 දින

සභාපති
සංවර්ධන ලොතරැයි මණ්ඩලය

**සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව**

---

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමග සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවට සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම් කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, මණ්ඩලයේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත**

(i) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 01 හි 69 වන ඡේදයට පටහැනි ලෙස පෙර වර්ෂයන්වලදී ජංගම වගකීම් ලෙස ඇස්තමේන්තුකර තිබූ රු.13,793,093 ක් සමාලෝචිත වර්ෂයේදී වෙනත් ආදායමක් ලෙස ගිණුම් ගතකර තිබීම නිසා සමාලෝචිත වර්ෂයේ ලාභය එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

# ස්වාධීන විගණකවරුන්ගේ වාර්තාව

(ii) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 16 හි 36 වන ඡේදය ප්‍රකාරව දේපල පිරියත හා උපකරණ ප්‍රත්‍යාගණනය කිරීමේදී දේපල පිරියත උපකරණ අයත් පන්තියම ප්‍රත්‍යාගණනය කළ යුතු වුවද කාර්යාල උපකරණ, ලී බඩු හා සවිකිරීම් යන වත්කම් පන්ති දෙකට අයත් එකතු වටිනාකම රු.56,204,125 ක්වූ වත්කම්වලින් රු.11,707,714 ක්වූ වත්කම් පමණක් ප්‍රත්‍යාගණනය කර තිබූ අතර එකතු වටිනාකම රු.44,496,411 ක් වූ වත්කම් ප්‍රත්‍යාගණනය කර නොතිබුණි.

(iii) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 16 හි 51 වන ඡේදය ප්‍රකාරව, ජංගම නොවන වත්කම් සඳහා අවශේෂ වටිනාකම සහ ප්‍රයෝජනවත් ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පිරිවැය රු.81,790,967 ක් වූ සම්පූර්ණයෙන්ම ක්ෂය කර ඇති ස්ථාවර වත්කම් තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවැතුණි. ඒ අනුව වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 08 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතුකර නොතිබුණි.

ා) **ගිණුම්කරණ අඩුපාඩු**

(i) දැනට ඉදිකිරීම් අත්හිටුවා ඇති කාර්යයක් වෙනුවෙන් සැලසුමක් සකස් කිරීමට වැයකර තිබුණු එකතුව රු.1,728,884ක් වූ වියදම සඳහා අවශ්‍ය ගිණුම්කරණ ගැලපීම් සිදු නොකර වර්ෂ 08 ක් තිස්සේ දේපල පිරියත හා උපකරණ යටතේ කෙරීගෙන යන වැඩ ලෙස ගිණුම් ගත කර තිබුණි.

(ii) මණ්ඩලයේ 2022 වර්ෂයේ ආදායම් බදු වියදම ගණනය කිරීමේදී මුල් අර්ධ වර්ෂයේ බදු අයවිය යුතු ලාභය මත සියයට 24 ක අනුපාතයක් සහ දෙවන අර්ධ වර්ෂයේ බදු අයවිය යුතු ලාභය මත සියයට 30 ක අනුපාතයක් අදාල කර ගත යුතු වුවත්, මණ්ඩලය විසින් සම්පූර්ණ වර්ෂයේ බදු අයවිය යුතු ලාභය මත සියයට 30 බදු අනුපාතයක් අදාල කර ගැනීම නිසා සමාලෝචිත වර්ෂයේ ආදායම් බදු වියදම රු.6,127,600 කින් වැඩිපුර ගිණුම්ගත කර තිබුණි. මේ නිසා සමාලෝචිත වර්ෂයේ බදු පසු ලාභය එම ප්‍රමාණයෙන් අඩුවෙන් ගණනය වී තිබුණි.

(iii) ජංගම නොවන වත්කම් තුල ඇතුලත් රු.8,095,000 ක් වටිනා කැබ් රථයක් හිටපු සභාපතිවරයකු විසින් රැගෙන යෑම නිසා භෞතිකව මණ්ඩලය සතුව නොතිබුණි.

(iv) 2017 සහ 2021 වර්ෂයන්හිදී ලොතරැයිපත් විකුණුම් ආදායම් වශයෙන් සලකා ගිණුම්ගත කර තිබුණු එකතුව රු.840,343 ක්වූ ලොතරැයිපත් නොවිකුණා ආපසු එවීම් වශයෙන් සලකා සමාලෝචිත වර්ෂයේදී අදාල බෙදාහැරීමේ නියෝජිතයන් වෙත මුදල්

ගෙවා, ආපසු එවුම් ලෙස රු.616,743 ක් හා වාහන නඩත්තු වියදම් ලෙස රු.223,600 ක් වශයෙන් ගිණුම්ගතකිරීම හේතුවෙන්, සමාලෝචිත වර්ෂයේ ලාභය රු.840,343 ක් අඩුවෙන් දක්වා තිබුණි.

**(ඇ) විගණන සාක්ෂි නොමැතිවීම**

ජංගම නොවන වත්කම්වලට අදාල පරිගණකගත මූලික ලේඛණයේ ඇතුළත් පිළිවෙලින් වටිනාකම රු.4,107,599 ක් හා රු.2,523,988 ක් වූ පරිගණක සහ කාර්යාල උපකරණ අයිතම ප්‍රමාණය, පිරිවැය හෝ ප්‍රත්‍යාගණන වටිනාකම , මිලදී ගත් දිනය ආදී තොරතුරු විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

**(ඈ) නොසැසඳූ ශේෂ**

(i) ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව, ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව සහ සීමාසහිත එක්සත් ප්‍රවෘත්තිපත්‍ර සමාගම යන ආයතන තුනට සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මණ්ඩලයේ වාර්තා අනුව ගෙවිය යුතු මුදල පිළිවෙලින් රු.13,758,998 ක්, රු.39,230,000 ක් සහ රු.12,005,909 ක් වුවද, එම ආයතන විසින් විගණනයට සෘජුවම තහවුරු කරන ලද මුදල පිළිවෙලින් රු.17,593,053 ක්, රු.45,150,000 ක් සහ රු.1,946,541 ක් විය.

(ii) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවෙන් සංවර්ධන ලොතරැයි මණ්ඩලයට අයවිය යුතු කිසිදු මුදලක් මූල්‍ය ප්‍රකාශන අනුව නොමැති වුවද ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව විසින් විගණනයට සෘජුවම කරන ලද තහවුරුව අනුව අයවිය යුතු මුදල රු.1,921,681 ක් විය.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මණ්ඩලයේ 2022 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු**

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබා දීමට බලාපොරොත්තු වන, මණ්ඩලයේ 2022 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත්, මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

# ස්වාධීන විගණකවරුන්ගේ වාර්තාව

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන්, අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර, මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතික වීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

මණ්ඩලයේ 2022 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත්, නිවැරදි කිරීම සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කළ යුතුය. තවදුරටත් නිවැරදි නොකළ වරදවා දැක්වීම් තිබේ නම්, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

## 1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, මණ්ඩලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය මණ්ඩලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

මණ්ඩලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, මණ්ඩලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ

# ස්වාධීන විගණකවරුන්ගේ වාර්තාව

මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

**2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

2.1.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා මණ්ඩලය පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (i) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ 1.2 (ආ) (i) ඡේදයේ දක්වා ඇති නිරීක්ෂණය හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මණ්ඩලයේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට මණ්ඩලය සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් ඍජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණයන් හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ මණ්ඩලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව

| | නීතිරීති / විධානයට යොමුව | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) | 1971 අංක 38 දරන මුදල් පනතේ 11 වගන්තිය | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මණ්ඩලය විසින් එකතුව රු.1,728,541,094 ක් ස්ථාවර තැන්පතුවල ආයෝජනය කර තිබූ නමුදු ඒ සඳහා මුදල් අමාත්‍යවරයාගේ එකඟතාවය ලබාගෙන නොතිබුණි. |
| (ආ) | 1997 අංක 20 දරන සංවර්ධන ලොතරැයි මණ්ඩල පනතේ 17(5) වගන්තිය | ත්‍යාගලාභීන් හිමිකම් නොපෑ, මාස 06 ක කාලසීමාව ඉකුත් වූ ත්‍යාග සඳහා මිලදීගත් භාණ්ඩ විකිණීමෙන් ලැබෙන මුදල පළමු කොට අරමුදලටද, ඉන් පසුව ජනාධිපති අරමුදලටද බැරකළ යුතු වුවත්, 2018 සහ 2020 වර්ෂයේදී ත්‍යාග වශයෙන් ලබාදීමට මිලදී ගත් එකතු වටිනාකම රු.779,750 ක්වූ යතුරු පැදි තුනක් අලෙවි කර එම මුදල් පනත ප්‍රකාරව යෙදවීමට සමාලෝචිත වර්ෂයේ මැයි 30 දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී අනුමැතිය ලබාදී තිබුණද, අදාල කටයුතු වර්තමානය වනවිටත් සිදුකර නොතිබුණි. |
| (ඇ) | 2019 දෙසැම්බර් 17 දිනැති අංක 08/2019 දරණ රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තු චක්‍රලේඛය | 2020 ජනවාරි 31 දිනට පෙර රාජ්‍ය සංස්ථා ඇතුළු රාජ්‍ය ආයතන www.promise.lk වෙබ් අඩවිය යටතේ හඳුන්වා දී ඇති විද්‍යුත් රාජ්‍ය ප්‍රසම්පාදන ක්‍රමවේදය (e – GP) යටතේ ලියාපදිංචි විය යුතු වුවත්, සංවර්ධන ලොතරැයි මණ්ඩලය මෙම ක්‍රමවේදය යටතේ ලියාපදිංචි වී නොතිබුණු බැවින්, ඒ අනුව ප්‍රසම්පාදන කටයුතු සිදු කර නොතිබුණි. |
| (ඇ) | 2008 දෙසැම්බර් 31 දිනැති අංක 42 දරණ අයවැය චක්‍රලේඛය | නිලධාරීන් 147 ක් වෙත රු.250,000 ණය සීමාව ඉක්මවා එකතුව රු.9,867,854 ක මුදලක් ආපදා ණය ලෙස ලබාදී තිබුණි. |

# ස්වාධීන විගණකවරුන්ගේ වාර්තාව

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 ( උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මණ්ඩලයේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර මණ්ඩලයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව

(i) මණ්ඩලය විසින් 2020 මැයි මාසයේදී ලොතරැයි වර්ග 07 ක් මුද්‍රණය කර සැපයීමට අදාලව ප්‍රසම්පාදන කාර්යයන් ආරම්භ කර තිබූ අතර, ලංසු ලියවිලි සඳහා නිවැරදි ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන් අනුගමනය නොකිරීම නිසා ඉන් මාස 06 කට පසුව එනම් 2020 දෙසැම්බර් මාසයේදී එම ප්‍රසම්පාදන කටයුතු අවලංගු කිරීමට සිදුවී තිබුණි. නැවත 2021 පෙබරවාරි මාසයේදී ලොතරැයි වර්ග 08 ක් මුද්‍රණය කර සැපයීම සම්බන්ධයෙන් ප්‍රසම්පාදන කාර්යයන් ආරම්භ කර තිබූ අතර, මණ්ඩලයේ අවශ්‍යතාවය අනුව ලංසු ලේඛන සකස් නොකිරීම හේතුවෙන් ඉන් මාස 11කට පසුව 2022 ජනවාරි 20 දින එම ප්‍රසම්පාදනයද අවලංගු කර තිබුණි. එසේම නැවත 2022 පෙබරවාරි මාසයේදී එම ලොතරැයි වර්ග 08 සඳහා නැවත ප්‍රසම්පාදන කාර්යයන් ආරම්භ කර තිබුණද, 2023 මාර්තු අවසානය දක්වා වර්ෂ 01 මාස 01 ක් ගතවී තිබුණු නමුත්, සැපයුම්කරුවන් තෝරාගෙන ලංසු ප්‍රදානය කිරීමට මණ්ඩලය අපොහොසත් වී තිබුණි. ඒ අනුව සංවර්ධන ලොතරැයි මණ්ඩලයට 2020 ජූලි 31 දින සිට 2023 මාර්තු 31 දින තෙක් නිවැරදි ප්‍රසම්පාදනයක් මගින් ලොතරැයිපත් මුද්‍රණය, සැපයීම සහ ගෙනවිත් භාරදීම සඳහා සැපයුම්කරුවන් තෝරාගැනීමට නොහැකි වී තිබුණි.

(ii) මණ්ඩලය විසින් 2020 ජූලි 31 දින සිට 2022 වර්ෂය අවසාන වනවිට අවස්ථා 03 කදී ප්‍රසම්පාදන කටයුතු ආරම්භකර තිබුණු නමුත්, ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව නිශ්චිත වර්ෂයක් සඳහා ලොතරැයිපත් මුද්‍රණය සඳහා මුද්‍රණකරුවන් තෝරා ගෙන, ඔවුන් වෙත ලංසු ප්‍රදානය කිරීමට අපොහොසත් වීම නිසා, 2020 ජූලි සිට 2022 ජූලි 31 දක්වා කාලපරිච්ඡේදයේදී මාස 01, මාස 02, මාස 03, මාස 04 සහ මාස 06 වැනි කෙටිකාල පරිච්ඡේදවලට ලොතරැයිපත් මුද්‍රණය කරවා ගැනීම සඳහා අවස්ථා 09 කදී පෙර සැපයුම්කරුවන් දෙදෙනා වෙතම රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.14 වගන්තියේ විධිවිධානයන්ට පටහැනිව කාල දිගු ලබා දී තිබුණි.

(iii) 2022 පෙබරවාරි මාසයේදී අමාත්‍ය මණ්ඩල ස්ථාවර ප්‍රසම්පාදන කමිටුව යටතේ ආරම්භ කර තිබුණු ලොතරැයිපත් මුද්‍රණය කිරීමේ ප්‍රධාන ප්‍රසම්පාදන ක්‍රියාවලිය අවසන් වී නොතිබීම හේතුවෙන්, 2022 ජූලි 01 දින සිට 2022 සැප්තැම්බර් 30 දින

දක්වා මාස 03ක කාලයක් සඳහා ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 190 ක්වූ ලොතරැයිපත් වර්ග 08ක් මුද්‍රණය කර ගැනීමට දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව මගින් ජාතික තරඟකාරී ක්‍රමය යටතේ ලංසු කැඳවීම මගින් ආයතන දෙකක් වෙත මාස 03 ක කාලයට පමණක් ලංසු පැවරීම සිදු කර තිබුණු අතර, මාස 1 ½, 02 සහ 03 වැනි කෙටි කාලපරිච්ඡේද මගින් 2023 අප්‍රේල් 15 දින වන විට එකතුව මාස 09 ½ ක කාලයක් ලොතරැයිපත් මුද්‍රණය කරවා ගැනීමට මෙම ආයතන දෙක වෙත කාලය දීර්ඝ කරදී තිබුණි.

**2.3. වෙනත් විගණන නිරීක්ෂණ.**

(i) මණ්ඩලය විසින් 2022 සැප්තැම්බර් 05 දිනැති අංක 2022/09/2005 දරන අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාව මගින් ලග්න වාසනාව ලොතරැයිපත අලෙවි කිරීම වෙනුවෙන් අලෙවි නියෝජිතවරුන්ට දැනට ලබාදෙන රු.3.25 ක කොමිස් මුදලට අමතරව රු.0.50 ක අතිරේක කොමිස් මුදලක් 2022 සැප්තැම්බර් මස 19 දින සිට මාස 03 ක කාලයකට ලබාදීමට තීරණය කර තිබුණි. අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියකින් 2022 දෙසැම්බර් 19 දින සිට එම දිරිදීමනාව ලබාදීම 2023 ජුනි 20 දින දක්වා දීර්ඝ කර තිබුණි. ඒ අනුව 2022 දෙසැම්බර් 31 දින දක්වා මණ්ඩලයේ අරමුදලින් ලග්න වාසනාව ලොතරැයිපත වෙනුවෙන් රු.43,092,258 ක අමතර කොමිස් මුදල් අලෙවි නියෝජිතයන් වෙත ගෙවා තිබුණි. ඒ අනුව ලග්න වාසනාව ලොතරැයිපත වෙනුවෙන් පමණක් අමතර රු.0.50 ක් ගෙවා තිබුණද සැප්තැම්බර් මාසයේ සිට දෙසැම්බර් මාසය දක්වා කාලපරිච්ඡේදයේ ලග්න වාසනාව ලොතරැයිපතේ අලවියේ වර්ධනය සියයට 18 ක් වුවද, එම කාලපරිච්ඡේදය තුළ අතිරේක කොමිස් මුදලක් නොගෙවන ලද අනෙකුත් ලොතරැයිපත් 04 හි අලවියේ වර්ධනය සියයට 16 ත් 30 ත් අතර පරාසයක පැවැති බැවින්, ලග්න වාසනාව ලොතරැයිපත වෙනුවෙන් පමණක් අමතර ශත 50 ක් ගෙවීමෙන් මණ්ඩලය අපේක්ෂා කළ එම ලොතරැයිපත් අලෙවිය ප්‍රවර්ධනය සිදුවී නොමැති බවට නිරීක්ෂණය විය.

(ii) හිටපු සභාපතිවරයෙකු විසින් 2008 අප්‍රේල් 22 දින පෞද්ගලික ආයතනයකින් රැගෙන ගොස් තිබුණු කැබ් රථයක් වෙනුවෙන් එම ආයතනය වෙත කැබ් රථයේ වටිනාකම සහ එම මුදලට අදාල නෛතික පොළිය ලෙස රු.14,923,369 ක් සහ නීතිඥ ගාස්තු ලෙස රු.245,000 ක් වශයෙන් එකතුව රු.15,168,369 ක් මණ්ඩලය විසින් ගෙවා තිබුණි. මේ සම්බන්ධයෙන් මණ්ඩලය විසින් පැවරූ නඩුව 2022 වර්ෂය අවසානය දක්වාම අවසන් වී නොතිබුණු අතර, මේ සම්බන්ධයෙන් මණ්ඩලය වෙනුවෙන් පෙනී සිටින ලද නීතිඥයන් වෙත රු.1,674,185 ක්ද මණ්ඩලය විසින් ගෙවා තිබුණි. ඒ අනුව මෙම සිදුවීම සම්බන්ධයෙන් 2022 වර්ෂය අවසානය දක්වා මණ්ඩලය දරා තිබුණු මුළු වියදම රු.16,842,554 ක් විය.

# ස්වාධීන විගණකවරුන්ගේ වාර්තාව

(iii) ලොතරැයි ත්‍යාග සඳහා ලබාදීමට සීමාසහිත ලංකා සතොස සමාගමෙන් මිලදීගෙන තිබූ වටිනාකම රු.592,500 ක් වූ ත්‍යාග වවුචර් පත් 123 ක් වර්ෂ 13 කට අධික කාලයක් කිසිදු කාර්යක් සඳහා භාවිතා නොකර පැවැතිණි.

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න

විගණකාධිපති

# විගණන වාර්තාව 2022 සහ කළමනාකරණය විසින් ගෙන ඇති ක්‍රියාමාර්ගය

| විගණකාධිපති වාර්තාවේ සඳහන් කරුණු | කළමණාකරණය විසින් ගනු ලැබූ පියවර |
|---|---|
| **1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**<br>**(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත**<br>(i) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 01 හි 69 වන ඡේදයට පටහැනි ලෙස පෙර වර්ෂයන් වලදී ජංගම වගකීම් ලෙස ඇස්තමේන්තුකර තිබූ රු.13,793,093 ක් සමාලෝචිත වර්ෂයේදී වෙනත් ආදායමක් ලෙස ගිණුම් ගත කිරීම නිසා සමාලෝචිත වර්ෂයේ ලාභය එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි. | පෙර වර්ෂවල උපචිත වියදම්හි ඇස්තමේන්තුවල (Estimate) සිදු වූ වෙනස්කම් නිවැරදි කිරීමකි. එබැවින් LKAS 8 ප්‍රමිතය අදාල කර ගෙන ඇත. මෙම ගිණුම් ප්‍රමිතය LKAS 8 මගින් පෙන්වා දී ඇති පරිදි පෙර වර්ෂවල සිදු වූ ඇස්තමේන්තු හා සම්බන්ධ නිවැරදි කිරීම් ප්‍රවර්තන වර්ෂයට අදාල කරගත යුතු බව දක්වා ඇත (Prospective recognition). |
| (ii) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 16 හි 36 වන ඡේදය ප්‍රකාරව දේපල පිරියත හා උපකරණ ප්‍රත්‍යාගණනය කිරීමේදී දේපල, පිරියත හා උපකරණ අයත් පන්තියම ප්‍රත්‍යාගණනය කළ යුතු වුවද කාර්යාල උපකරණ, ලී බඩු හා සවිකිරීම් යන වත්කම් පන්ති දෙකට අයත් එකතු වටිනාකම රු.56,204,125 ක් වූ වත්කම්වලින් රු.11,707,714ක් වූ වත්කම් පමණක් ප්‍රත්‍යාගණනය කර තිබූ අතර එකතු වටිනාකම රු.44,496,411 ක් වූ වත්කම් ප්‍රත්‍යාගණනය කර නොතිබුණි. | මණ්ඩලය අවසන් වරට 2019/2020 වර්ෂවල සම්පූර්ණ වශයෙන් වත්කම් ප්‍රත්‍යාගණනය සිදුකර ඇත. මෙම ප්‍රත්‍යාගණන අගයන් වසර 5 ක් දක්වා පවත්වා ගැනීමට හැකියාව ඇත. මේ අනුව විගණන වාර්තාවේ පෙන්වා දුන් අගයන් ද සැලකිල්ල ට ගෙන මණ්ඩලයේ සියලු වත්කම් සඳහා විධිමත් ප්‍රත්‍යාගණනයක් 2023 වර්ෂයේ සිදුකිරීමට නියමිතය. |
| (iii) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 16 හි 51 වන ඡේදය ප්‍රකාරව, ජංගම නොවන වත්කම් සදහා අවශේෂ වටිනාකම සහ ප්‍රයෝජනවත් ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පිරිවැය රු.81,790,967 ක් වූ සම්පූර්ණයෙන්ම ක්ෂය කර ඇති ස්ථාවර වත්කම් තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවැතුණි. ඒ අනුව වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 08 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතුකර නොතිබුණි. | මණ්ඩලය අවසන් වරට 2019/2020 වර්ෂවල සම්පූර්ණ වශයෙන් වත්කම් ප්‍රත්‍යාගණනය සිදුකර ඇත. මෙම ප්‍රත්‍යාගණන අගයන් වසර 5 ක් දක්වා පවත්වා ගැනීමට හැකියාව ඇත. මේ අනුව විගණන වාර්තාවේ පෙන්වා දුන් අගයන් ද සැලකිල්ලට ගෙන මණ්ඩලයේ සියලු වත්කම් සඳහා විධිමත් ප්‍රත්‍යාගණනයක් 2023 වර්ෂයේ සිදුකිරීමට නියමිතය. |
| **(ආ) ගිණුම්කරණ අඩුපාඩු**<br>(i) දැනට ඉදිකිරීම් අත්හිටුවා ඇති කාර්යයක් වෙනුවෙන් සැලසුමක් සකස් කිරීමට වැයකර තිබුණු එකතුව රු.1,728,884ක් වූ වියදම සඳහා අවශ්‍ය ගිණුම්කරණ ගැලපීම් සිදු නොකර වර්ෂ 08 ක් තිස්සේ දේපල, පිරියත හා උපකරණ යටතේ කෙරීගෙන යන වැඩ ලෙස ගිණුම් ගත කර තිබුණි. | ගිණුම්කරණ ප්‍රමිත LKAS 16 ප්‍රකාරව වත්කමක් ලෙස හඳුනාගැනීම සඳහා අදාල වත්කම ප්‍රතිලාභ ලැබෙන මට්ටමට නිමවී තිබිය යුතුය. (It is Probable that Future economic benefits associated with the item will flow to the entity) එබැවින් 2022.12.31 වන විටත් ඉහත ඉදිකිරීම් නිම වී නොතිබුනි. මේ හේතුකොටගෙන අදාල වත්කම් ප්‍රාග්ධනිත කර ක්ෂය කිරීමට කටයුතු යොදා නොතිබුනි. |
| (ii) මණ්ඩලයේ 2022 වර්ෂයේ ආදායම් බදු වියදම ගණනය කිරීමේදී මුල් අර්ධ වර්ෂයේ බදු අයවිය යුතු ලාභය මත 24% ක අනුපාතයක් සහ දෙවන අර්ධ වර්ෂයේ බදු අයවිය යුතු ලාභය මත 30% ක අනුපාතයක් අදාල කර ගත යුතු වුවත්, මණ්ඩලය විසින් සම්පූර්ණ වර්ෂයේ බදු අයවිය යුතු ලාභය මත 30% බදු අනුපාතයක් අදාල කර ගැනීම නිසා සමාලෝචිත වර්ෂයේ ආදායම් බදු වියදම රු.6,127,600 කින් වැඩිපුර ගිණුම්ගත කර තිබුණි. මේ නිසා සමාලෝචිත වර්ෂයේ බදු පසු ලාභය එම ප්‍රමාණයෙන් අඩුවෙන් ගණනය වී තිබුණි. | සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ මූල්‍ය වර්ෂය ජනවාරි 01 වන දින ආරම්භ වන බැවින් 2022 අංක 45 දරණ දේශීය ආදායම් (සංශෝධන) පනතේ 20 (3) (a) (ii) (C) සහ (D) වගන්ති හා 38 (1) වගන්ති ප්‍රකාරව 2022 වර්ෂයේ දී ආදායම් බදු ගෙවීමේදී මුල් මාස 09 සඳහා 24% ක බදු ප්‍රතිශතයක් අවසාන මාස 03 සඳහා 30% ක බදු ප්‍රතිශතයක් ගණනය කොට ආදායම් බදු ගෙවිය යුතුය. 2022 වර්ෂයේ බදු ගෙවීම සඳහා මෙම ගණනය කිරීම යොදා ගැනීමට නියමිතය. මණ්ඩලයේ ගිණුම් වර්ෂය ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා වන බැවින් ඔබ විසින් පෙන්වා දී ඇති පරිදි මුල් මාස 06 සඳහා 24% ක ප්‍රතිශතය හා අවසාන මාස 06 සඳහා 30% ක ප්‍රතිශතය අදාල නොවේ. |

# විගණන වාර්තාව 2022 සහ කළමනාකරණය විසින් ගෙන ඇති ක්‍රියාමාර්ගය

| විගණකාධිපති වාර්තාවේ සඳහන් කරුණු | කළමණාකරණය විසින් ගනු ලැබූ පියවර |
|---|---|
| | වාර්ෂික ආදායම් බද්ද ගණනය කිරීම මූල්‍ය ප්‍රකාශ පිළියෙල කරනු ලබන අවස්ථාවේදී නිශ්චිතවම ගණනය කල නොහැකි බැවින් ශ්‍රී ලංකා ගිණුම්කරන ප්‍රමිත LKAS 12 අනුව ඒ සඳහා ඇස්තමේන්තුවක් මත පදනම්ව වෙන්කිරීමක් පමණක් සිදුකරනු ලැබේ. වාර්ෂික ආදායම් බද්ද නිශ්චිතව ගණනය කර ගෙවීම් කිරීම සඳහා ඊළඟ මූල්‍ය වර්ෂයේ සැප්තැම්බර් මස 30 වන දින දක්වා කාලයක් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් ලබා දී ඇත. තවද, 2022 වර්ෂයේ ආදායම් බදු ගණනය කල යුතු ආකාරය සම්බන්ධව චක්‍රලේඛයක් (SEC/2023/E/03) 2023.05.09 වන දින නිකුත් කර ඇත.<br><br>ඒ අනුව අප විසින් 2023 සැප්තැම්බර් 30 දිනට පෙර නියමිත පරිදි මුල් මාස 09 හා අවසාන මාස 03 සඳහා ආදායම් වියදම් සලකා බලා වෙන වෙනම ගණනය කිරීමක් සිදුකර අදාල නියමිත බදු ප්‍රතිශතය අනුව ගෙවීම් සිදුකරනු ලැබේ. |
| (iii) ජංගම නොවන වත්කම් තුල ඇතුලත් රු.8,095,000 ක් වටිනා කැබ් රථයක් හිටපු සභාපතිවරයකු විසින් රැගෙන යෑම නිසා භෞතිකව මණ්ඩලය සතුව නොතිබුණි. | මෙම මෝටර් රථය මණ්ඩලය නමින් ලියාපදිංචි කර ඇත. මෙම ලියාපදිංචිය පදනම්කරගෙන අදාල වත්කම 2012 වර්ෂයේ දී ප්‍රාග්ධනීත කර ඇත.<br><br>මෙම කැබ් රථය අස්ථානගතවීම සම්බන්ධයෙන් කොළඹ දිසා අධිකරණය මගින් නඩු අංක 00DMR/04781/2021 යටතේ අධිකරණ ක්‍රියාමාර්ග ගෙන ඇත. |
| (iv) 2017 සහ 2021 වර්ෂයන්හිදී ලොතරැයිපත් විකුණුම් ආදායම් වශයෙන් සලකා ගිණුම්ගත කර තිබුණු එකතුව රු.840,343 ක් වූ ලොතරැයිපත් නොවිකුණා ආපසු එවීම් වශයෙන් සලකා සමාලෝචිත වර්ෂයේදී අදාල බෙදාහැරීමේ නියෝජිතයන් වෙත මුදල් ගෙවා, ආපසු එවුම් ලෙස රු.616,743 ක් හා වාහන නඩත්තු වියදම් ලෙස රු.223,600 ක් වශයෙන් ගිණුම්ගතකිරීම හේතුවෙන්, සමාලෝචිත වර්ෂයේ ලාභය රු.840,343 ක් අඩුවෙන් දක්වා තිබුණි. | මෙම විගණන විමසුමෙන් පෙන්වා දී ඇති පරිදි මෙම ටිකට් තොග සඳහා ගෙවීම 2022 වර්ෂයේ සිදුකර ඇත. මෙහිදී බෙදාහැරීමේ අලෙවි නියෝජිතයන් 4 දෙනෙකුට ගෙවීම් කර ඇති අතර එම ගෙවීම් හතරම විශේෂ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමක් මගින් අනුමත කර ඇත. අධ්‍යක්ෂ මණ්ඩල වාර්තා අංක 2022/08/1997 ලෙස අංකනයෙන් යුතුව එහි පිටපතක් මේ සමග අමුණා ඇත. එබැවින් අදාල ගෙවීම 2022 වර්ෂයේ දී සිදු විය.<br><br>එම මුදල තුළ ඇතුළත් රු. 223,600 ක මුදල වැරදීමකින් වාහන නඩත්තු වියදමක් වශයෙන් ගිණුම්ගත කර ඇති අතර මෙවැනි වැරදි ඉදිරියේදී සිදු නොවීමට කාර්ය මණ්ඩලයට අදාල උපදෙස් ලබා දී ඇත. |
| **(ඈ) විගණන සාක්ෂි නොමැතිවීම**<br>ජංගම නොවන වත්කම්වලට අදාල පරිගණකගත මූලික ලේඛණයේ ඇතුළත් පිළිවෙලින් වටිනාකම රු.4,107,599 ක් හා රු.2,523,988 ක් වූ පරිගණක සහ කාර්යාල උපකරණ අයිතම ප්‍රමාණය, පිරිවැය හෝ ප්‍රත්‍යාගණන වටිනාකම, මිලදී ගත් දිනය ආදී තොරතුරු විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | ස්ථාවර වත්කම්වල පවතින දෝෂ හඳුනාගැනීමට මණ්ඩලය විසින් මේ වන විට කමිටුවක් පත් කර ඇති අතර, විගණන වාර්තාවේ පෙන්වා දෙන ගිණුම් ශේෂය හඳුනාගැනීම සඳහා මෙම කමිටුව ක්‍රියාකර ඇත. මේ අනුව විගණන විමසුමේ සඳහන් රු.4,107,599/- වන පරිගණක සහ උපාංගවල ශේෂය ඉවත් කිරීමට කමිටුව මගින් නිර්දේශ වූ අතර, එම නිර්දේශය විගණන හා කළමණාකරන කමිටුව හරහා අධ්‍යක්ෂක මණ්ඩලයට යොමු කර ගිණුම් තුලින් ඉවත් කිරීමට අනුමැතිය මේ වන විට ලැබී ඇත. මෙහි පෙන්වා දී ඇති රු.2,523,988/-වන කාර්යාල උපකරණ සම්බන්ධයෙන් කමිටුවේ නිර්දේශ සකස්වෙමින් පවතී. |
| **(ඇ) නොසැසඳු ශේෂ**<br>(i) ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව, ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව සහ සීමාසහිත එක්සත් ප්‍රවෘත්තිපත්‍ර සමාගම යන ආයතන තුනට සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මණ්ඩලයේ වාර්තා අනුව ගෙවිය යුතු මුදල පිළිවෙලින් රු.13,758,998 ක්, රු.39,230,000 ක් සහ රු.12,005,909 ක් වුවද, එම ආයතන විසින් විගණනයට සෘජුවම තහවුරු කරන ලද මුදල පිළිවෙලින් රු.17,593,053 ක්, රු.45,150,000 ක් සහ රු.1,946,541 ක් විය. | අදාල මාධ්‍ය ආයතන විසින් ලබා දුන් ශේෂ පිළිබඳ විස්තර ලබා ගෙන මේ තුලින් අපගේ තොරතුරු සහ අදාල මාධ්‍ය ආයතන ලබා දුන් තොරතුරු නිසි සැසඳුමක් කර මෙම වෙනසට හේතු වූ කරුණු පෙන්වා දීමට කටයුතු කරනු ලැබේ. |

| විගණකාධිපති වාර්තාවේ සඳහන් කරුණු | කළමණාකරණය විසින් ගනු ලැබූ පියවර |
|---|---|
| (ii) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවෙන් සංවර්ධන ලොතරැයි මණ්ඩලයට අයවිය යුතු කිසිදු මුදලක් මූල්‍ය ප්‍රකාශන අනුව නොමැති වුවද ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව විසින් විගණනයට සෘජුවම කරන ලද තහවුරුව අනුව අයවිය යුතු මුදල රු.1,921,681 ක් විය. | අදාල මාධ්‍ය ආයතන විසින් ලබා දුන් ශේෂ පිළිබඳ විස්තර ලබා ගෙන මේ තුලින් අපගේ තොරතුරු සහ අදාල මාධ්‍ය ආයතන ලබා දුන් තොරතුරු නිසි සැසඳුමක් කර මෙම වෙනසට හේතු වූ කරුණු පෙන්වා දීමට කටයුතු කරනු ලැබේ. |
| **2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව**<br>2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණයන් හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ මණ්ඩලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව,<br><br>නීතිරීති / විධානයට යොමුව — නිරීක්ෂණ<br><br>(අ) 1971 අංක 38 දරන මුදල් පනතේ 11 වගන්තිය — සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මණ්ඩලය විසින් එකතුව රු.1,728,541,094 ක් ස්ථාවර තැන්පතුවල ආයෝජනය කර තිබූ නමුදු ඒ සඳහා මුදල් අමාත්‍යවරයාගේ එකඟතාවය ලබාගෙන නොතිබුණි. | මණ්ඩලයේ අරමුදල් කළමණාකරණය තුළින් සැලකිය යුතු පොලී ආදායමක් උපයන අතර එම ආදායම ජනාධිපති අරමුදලට ප්‍රේෂණය කරයි. 2022 මූල්‍ය වර්ෂය වෙනුවෙන් රු.මිලියන 273 ක පොලී ආදායමක් උපයා ඇත. කෙසේ නමුත් පෙන්වා දී ඇති අඩු පාඩු නිවැරදි කිරීමට ඉදිරියේදී පියවර ගනු ලබයි. |
| (ආ) 1997 අංක 20 දරන සංවර්ධන ලොතරැයි මණ්ඩල පනතේ 17(5) වගන්තිය — ත්‍යාගලාභීන් හිමිකම් නොපෑ, මාස 06 ක කාලසීමාව ඉකුත් වූ ත්‍යාග සඳහා මිලදීගත් භාණ්ඩ විකිණීමෙන් ලැබෙන මුදල පළමු කොට අරමුදලටද, ඉන් පසුව ජනාධිපති අරමුදලටද බැරකළ යුතු වුවත්, 2018 සහ 2020 වර්ෂයේදී ත්‍යාග වශයෙන් ලබාදීමට මිලදී ගත් එකතු වටිනාකම රු.779,750 ක්වූ යතුරු පැදි තුනක් අලෙවි කර එම මුදල් පනත ප්‍රකාරව යෙදවීමට සමාලෝචිත වර්ෂයේ මැයි 30 දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී අනුමැතිය ලබාදී තිබුණද, අදාල කටයුතු වර්තමානය වනවිටත් සිදුකර නොතිබුණි. | මෙම යතුරුපැදි 03 තක්සේරු කර විධිමත් අපහරණ ක්‍රියාවලිය ඔස්සේ එම මුදල් ජනාධිපති අරමුදලට යැවීම සඳහා සැලසුම් කරන ලදී. නමුත් ජනාධිපති කාර්යාලයෙන් මෙම යතුරුපැදි 03 ජනාධිපති කාර්යාලයේ භාවිතය සඳහා ලබාදෙන ලෙස ඉල්ලීමක් කර ඇත. ඒ අනුව ජනාධිපති කාර්යාලයේ යාන්ත්‍රික ඉංජිනේරුවරයෙකු පැමිණ මෙම යතුරුපැදි 03 පරීක්ෂා කර බලා ජනාධිපති කාර්යාලයට මිලදී ගැනීමට අවශ්‍ය කටයුතු මේ වන විට සිදුවෙමින් පවතින අතර ජුනි මාසය තුල මෙම යතුරු පැදි 03 ජනාධිපති කාර්යාලය විසින් මිලදී ගනු ඇත. මෙම යතුරුපැදි 03 ජනාධිපති කාර්යාලයට ලබාදීම සඳහා අවශ්‍ය වන Proforma ඉන්වොයිස් පත සකස්කර 2023.05.22 වන දින ජනාධිපති කාර්යාලයට යොමු කර ඇත. |
| (ඇ) 2019 දෙසැම්බර් 17 දිනැති අංක 08/2019 දරණ රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තු චක්‍රලේඛය — 2020 ජනවාරි 31 දිනට පෙර රාජ්‍ය සංස්ථා ඇතුළු රාජ්‍ය ආයතන www.promise.lk වෙබ් අඩවිය යටතේ හඳුන්වා දී ඇති විද්‍යුත් රාජ්‍ය ප්‍රසම්පාදන ක්‍රමවේදය (e - GP) යටතේ ලියාපදිංචි විය යුතු වුවත්, සංවර්ධන ලොතරැයි මණ්ඩලය මෙම ක්‍රමවේදය යටතේ ලියාපදිංචි වී නොතිබුණු බැවින්, ඒ අනුව ප්‍රසම්පාදන කටයුතු සිදු කර නොතිබුණි. | මේ වන විට මෙම ආයතනය විද්‍යුත් රාජ්‍ය ප්‍රසම්පාදන ක්‍රමවේදය (e - GP) සඳහා ලියාපදිංචියට ඉල්ලුම් කොට ඇත. එම ලියාපදිංචිය සිදු කිරීමෙන් පසුව මෙම ආයතනයට එකී විද්‍යුත් ප්‍රසම්පාදන ක්‍රමවේදය අනුගමනය කිරීමේ හැකියාව ඇත. |
| (ඈ) 2008 දෙසැම්බර් 31 දිනැති අංක 42 දරණ අයවැය චක්‍රලේඛය — නිලධාරීන් 147 ක් වෙත රු.250,000 ණය සීමාව ඉක්මවා එකතුව රු.9,867,854 ක මුදලක් ආපදා ණය ලෙස ලබාදී තිබුණි. | විගණනය මගින් 2022 වසරේ පෙන්වා දීමෙන් පසුව චක්‍රලේඛයේ සඳහන් පරිදි රු.250,000 ඉක්මවා නොයන පරිදි ආපදා ණය ලබා දීමට කටයුතු කර ඇත. ඒ අනුව 2022 අගෝස්තු මාසයෙන් පසුව කිසිදු කාර්ය මණ්ඩල සාමාජිකයෙකුට අදාල සීමාව ඉක්මවා ආපදා ණය මුදලක් ලබා දීමක් සිදු කර නොමැත. |

# විගණන වාර්තාව 2022 සහ කළමනාකරණය විසින් ගෙන ඇති ක්‍රියාමාර්ගය

<table>
<tr><th>විගණකාධිපති වාර්තාවේ සඳහන් කරුණු</th><th>කළමණාකරණය විසින් ගනු ලැබූ පියවර</th></tr>
<tr><td>2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර මණ්ඩලයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.<br><br>(i) මණ්ඩලය විසින් 2020 මැයි මාසයේදී ලොතරැයි වර්ග 07 ක් මුද්‍රණය කර සැපයීමට අදාලව ප්‍රසම්පාදන කාර්යයන් ආරම්භ කර තිබූ අතර, ලංසු ලියවිලි සඳහා නිවැරදි ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන් අනුගමනය නොකිරීම නිසා ඉන් මාස 06 කට පසුව එනම් 2020 දෙසැම්බර් මාසයේදී එම ප්‍රසම්පාදන කටයුතු අවලංගු කිරීමට සිදුවී තිබුණි. නැවත 2021 පෙබරවාරි මාසයේදී ලොතරැයි වර්ග 08 ක් මුද්‍රණය කර සැපයීම සම්බන්ධයෙන් ප්‍රසම්පාදන කාර්යයන් ආරම්භ කර තිබූ අතර, මණ්ඩලයේ අවශ්‍යතාවය අනුව ලංසු ලේඛන සකස් නොකිරීම හේතුවෙන් ඉන් මාස 11කට පසුව 2022 ජනවාරි 20 දින එම ප්‍රසම්පාදනයද අවලංගු කර තිබුණි. එසේම නැවත 2022 පෙබරවාරි මාසයේදී එම ලොතරැයි වර්ග 08 සඳහා නැවත ප්‍රසම්පාදන කාර්යයන් ආරම්භ කර තිබුණද, 2023 මාර්තු අවසානය දක්වා වර්ෂ 01 මාස 01 ක් ගතවී තිබුණු නමුත්, සැපයුම්කරුවන් තෝරාගෙන ලංසු ප්‍රදානය කිරීමට මණ්ඩලය අපොහොසත් වී තිබුණි. ඒ අනුව සංවර්ධන ලොතරැයි මණ්ඩලයට 2020 ජූලි 31 දින සිට 2023 මාර්තු 31 දින තෙක් නිවැරදි ප්‍රසම්පාදනයක් මගින් ලොතරැයිපත් මුද්‍රණය, සැපයීම සහ ගෙනවිත් භාරදීම සඳහා සැපයුම්කරුවන් තෝරාගැනීමට නොහැකි වී තිබුණි.</td><td>2020 මාර්තු මස ආරම්භකල ප්‍රසම්පාදනයට අදාලව දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව මඟින් එක් ලොතරැයි ටිකට්පත් වර්ගයක් සඳහා සැපයුම්කරුවකු තෝරා ගැනීම එක් ප්‍රසම්පාදනයක් සේ සැලකිල්ලටගෙන වෙන වෙනම ලංසු ලියවිලි නිකුත් කිරීම මඟින් ලංසු කැදවන ලදී. (මීට පෙරද වසර ගණනාවක පටන් අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව යටතේ සිදුකල ලංසු කැදවීම් වලද ඒ අයුරින්ම කටයුතු කර තිබුණි).<br><br>එම ප්‍රසම්පාදනයට අදාලව ලංසු පැවරීමේ අවසන් අදියරේදී එක් ටිකට්පත් වර්ගයක් සැපයීම එක් ප්‍රසම්පාදනයක් සේ සළකා ලංසු කැදවීම ගැටළුකාරී බව දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව විසින් මතු කිරීම මත එම ලංසු කැදවීම අවලංගු කරන ලදී.<br><br>මෙම මූලික ප්‍රසම්පාදනයට අදාලව මූලික ලංසු ලියවිලි අනුමත කිරීමද දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව විසින් සිදුකර තිබූ නමුත් මෙම අවලංගු කිරීම් ද මෙම කමිටුව විසින් සිදුකර තිබුණි. (ප්‍රසම්පාදනය ආරම්භයේදී කටයුතු කල කමිටු සාමාජිකත්වය ලංසු පැවරීමේ අදියරේ වෙනස්වී තිබුණි).<br><br>පසුව මේ සදහා අමාත්‍ය මණ්ඩලය පත්කරන ලද ස්ථාවර ප්‍රසම්පාදන කමිටුව (SCAPC) මඟින් විවෘත ලංසු කැඳවන ලද අතර එම ප්‍රසම්පාදනයට අදාලව ලැබී තිබුණේ එක් සාර්ථක ලංසු මිළ ගණනක් වන බැවින් එම ලැබී තිබූ ලංසු මිළ ගණන් මත එක් සැපයුම්කරුවකුට මණ්ඩලයේ සියළුම ලොතරැයි ටිකට්පත් සැපයීමට භාරදීමේදී ඇතිවිය හැකි අවධානම් තත්වය හා ඉහල මිළ ගණනක් පැවතීම යනාදි කරුණු රාශියක් සැලකිල්ලටගෙන එම ලංසුකරුවෙත ලංසු පැවරීම සිදු නොකල අතර මේ සදහා නැවත ලංසු කැදවීමට SCAPC තීරණය කෙරිණි.<br><br>එම තීරණය සමඟ 2022 අගෝස්තු මස නැවත මේ සදහා ලංසු කැඳවන ලද අතර ඊට අදාලව 2023.05.16 සිට 2024.05.15 දක්වා වූ කාලයට අදාලව සැපයුම්කරුවන් දෙදෙනෙකු වෙත ලංසු පැවරීම සිදුකර ඇත.<br><br>ඉහත අවස්ථා 03 ට අදාල තීරණ එම ප්‍රසම්පාදන කමිටු විසින් ලබාගෙන ඇත.</td></tr>
<tr><td>(ii) මණ්ඩලය විසින් 2020 ජූලි 31 දින සිට 2022 වර්ෂය අවසාන වනවිට අවස්ථා 03 කදී ප්‍රසම්පාදන කටයුතු ආරම්භකර තිබුණු නමුත්, ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව නිශ්චිත වර්ෂයක් සඳහා ලොතරැයිපත් මුද්‍රණය සඳහා මුද්‍රණකරුවන් තෝරා ගෙන, ඔවුන් වෙත ලංසු ප්‍රදානය කිරීමට අපොහොසත් වීම නිසා, 2020 ජූලි සිට 2022 ජූලි 31 දක්වා කාලපරිච්ඡේදයේදී මාස 01, මාස 02, මාස 03, මාස 04 සහ මාස 06 වැනි කෙටිකාල පරිච්ඡේදවලට ලොතරැයිපත් මුද්‍රණය කරවා ගැනීම සඳහා අවස්ථා 09 කදී පෙර සැපයුම්කරුවන් දෙදෙනා වෙතම රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.14 වගන්තියේ විධිවිධානයන්ට පටහැනිව කාල දිගු ලබා දී තිබුණි.</td><td>අවසන් වරට මණ්ඩලයේ පැවති මුද්‍රණ ගිවිසුම 2019.08.01 සිට 2020.07.31 යන කාල පරිච්ඡේදයට අදාල පැවති අතර 2020.03.02 දින ඉදිරි වර්ෂයට අදාල නව සැපයුම්කරුවන් තෝරා ගැනීම සඳහා වන ප්‍රසම්පාදන කටයුතු මූලිකව ආරම්භ කර තිබුණි. එහෙත් 2020.03.19 දින සිට කොරෝනා වසංගත තත්වය හේතුවෙන් රට වසා තිබීම හේතුකොටගෙන මාස 02 ක කාලයක් එම කටයුතු සිදු කිරීමට නොහැකි වූ අතර 2020.05.18 දින සිට එම ක්‍රියාවලිය නැවතත් ආරම්භ කර තිබුණි.<br><br>ඉහත සඳහන් පරිදි රට වසා තිබූ කාලය මෙන්ම මූලිකව දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව විසින් සිදුකල ලංසු කැඳවීම අවලංගු කිරීම යන කරුණු ප්‍රසම්පාදන අස්ථිත්වයට පාලනය කල නොහැකි ස්වාධීන සිද්ධින් වේ. එහෙත් මණ්ඩලයේ දෛනික ලොතරැයි මෙහෙයුම් කටයුතු සදහා ලොතරැයි ටිකට්පත සැපයීම අඛණ්ඩව සිදුකළ යුතු අනිවාර්යය කරුණක් වන අතර එසේ නොවුන හොත් අලෙවි ජාලයේ ආදායම් අහිමි වීම තුල විශාල සමාජ ගැටළු පැන නැගීම මණ්ඩලයට විශාල විකුණුම් ආදායම නොලැබීම ප්‍රමුඛ කාරණා වේ. එම තත්වය තුල ඒ වන විට පැවති මුද්‍රණ ගිවිසුම දීර්ඝ කිරීම මේ සදහා ගතහැකි විකල්පය වූ බැවින් ගිවිසුම්ගත දෙපාර්ශවයේ එකඟත්වය මත ඒ ඒ අවස්ථානුකූල ලබා ගෙන ඇති අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත පැවති එම ගිවිසුම් කාලය දීර්ඝ කර ඇත.</td></tr>
</table>

| විගණකාධිපති වාර්තාවේ සඳහන් කරුණු | කළමණාකරණය විසින් ගනු ලැබූ පියවර |
|---|---|
| (iii) 2022 පෙබරවාරි මාසයේදී අමාත්‍ය මණ්ඩල ස්ථාවර ප්‍රසම්පාදන කමිටුව යටතේ ආරම්භ කර තිබුණු ලොතරැයිපත් මුද්‍රණය කිරීමේ ප්‍රධාන ප්‍රසම්පාදන ක්‍රියාවලිය අවසන් වී නොතිබීම හේතුවෙන්, 2022 ජූලි 01 දින සිට 2022 සැප්තැම්බර් 30 දින දක්වා මාස 03 ක කාලයක් සඳහා ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 190 ක් වූ ලොතරැයිපත් වර්ග 08ක් මුද්‍රණය කර ගැනීමට දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව මගින් ජාතික තරඟකාරී ක්‍රමය යටතේ ලංසු කැඳවීම මගින් ආයතන දෙකක් වෙත මාස 03 ක කාලයකට පමණක් ලංසු පැවරීම සිදු කර තිබුණු අතර, මාස 1½, 02 සහ 03 වැනි කෙටි කාලපරිච්ඡේද මගින් 2023 අප්‍රේල් 15 දින වන විට එකතුව මාස 09½ ක කාලයක් ලොතරැයිපත් මුද්‍රණය කරවා ගැනීමට මෙම ආයතන දෙක වෙත කාලය දීර්ඝ කරදී තිබුණි. | අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද ස්ථාවර ප්‍රසම්පාදන කමිටුව (SCAPC) මගින් නැවත ලංසු කැඳවීමද සිදුකර පැවති නිසාත් අවස්ථා කීපයකදීම පැවති මුද්‍රණ ගිවිසුම දීර්ඝ කර තිබීම හා එවකට රටේ පැවති කඩදාසි මිළ ගණන් ඉහළ යාම හා විදේශ විනිමය අනුපාත වල ඉහළ යාම හේතුකොට ගෙන රේට් (rate) මිළගණන්ද සංශෝධනය වූ බැවින් මේ සදහා ප්‍රධාන වාර්ෂික ප්‍රසම්පාදනයට අදාල නව සැපයුම්කරුවකු තෝරා ගන්නා තෙක් මාස 03 ක කාලය සදහා ලංසු කැඳවා කෙටිකාලීනව සැපයුම්කරුවකු තෝරාගැනීමට අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කෙරිනි. ඒ අනුව එම ලංසු කැඳවීම එලෙස සිදුකර ඇත.<br><br>එහෙත් අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද ස්ථාවර ප්‍රසම්පාදන කමිටුව (SCAPC) මගින් ක්‍රියාත්මක ප්‍රසම්පාදනයට අදාලව සැපයුම්කරුවන් තෝරා ගන්නා තෙක් මණ්ඩලයේ දෛනික ලොතරැයි මෙහෙයුම් කටයුතු සදහා ලොතරැයි ටිකට්පත සැපයීම අඛණ්ඩව සිදුකල යුතු අනිවාර්යය කරුණක් වන අතර එසේ නොවුන හොත් අලෙවි ජාලයේ ආදායම් අහිමි වීම තුල විශාල සමාජ ගැටළු පැන නැගීම මණ්ඩලයට විශාල විකුණුම් ආදායම නොලැබීම ප්‍රමුඛ කාරණා වේ. එම තත්වය තුල ඒ වන විට පැවති මුද්‍රණ ගිවිසුම දීර්ඝ කිරීම මේ සදහා ගතහැකි විකල්ප වන අතර ගිවිසුම්ගත දෙපාර්ශවයේ එකඟත්වය මත ඒ ඒ අවස්ථානුකූලව ලබා ගෙන ඇති අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත එම ගිවිසුම් කාලය දීර්ඝ කර ඇත. |
| **2.3 වෙනත් විගණන නිරීක්ෂණ.**<br>(i) මණ්ඩලය විසින් 2022 සැප්තැම්බර් 05 දිනැති අංක 2022/09/2005 දරන අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාව මගින් ලග්න වාසනාව ලොතරැයිපත අලෙවි කිරීම වෙනුවෙන් අලෙවි නියෝජිතවරුන්ට දැනට ලබාදෙන රු.3.25 ක කොමිස් මුදලට අමතරව රු.0.50 ක අතිරේක කොමිස් මුදලක් 2022 සැප්තැම්බර් මස 19 දින සිට මාස 03 ක කාලයකට ලබාදීමට තීරණය කර තිබුණි. අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියකින් 2022 දෙසැම්බර් 19 දින සිට එම දිරි දීමනාව ලබාදීම 2023 ජුනි 20 දින දක්වා දීර්ඝ කර තිබුණි. ඒ අනුව 2022 දෙසැම්බර් 31 දින දක්වා මණ්ඩලයේ අරමුදලින් ලග්න වාසනාව ලොතරැයිපත වෙනුවෙන් රු.43,092,258 ක අමතර කොමිස් මුදල් අලෙවි නියෝජිතයන් වෙත ගෙවා තිබුණි.<br><br>ඒ අනුව ලග්න වාසනාව ලොතරැයිපත වෙනුවෙන් පමණක් අමතර ශත 50 ක් ගෙවා තිබුණද සැප්තැම්බර් මාසයේ සිට දෙසැම්බර් මාසය දක්වා කාලපරිච්ඡේදයේ ලග්න වාසනාව ලොතරැයිපතේ අලෙවියේ වර්ධනය 18% ක් වුවද, එම කාලපරිච්ඡේදය තුළ අතිරේක කොමිස් මුදලක් නොගෙවන ලද අනෙකුත් ලොතරැයිපත් 04 හි අලෙවියේ වර්ධනය 16% ත් 30% ත් අතර පරාසයක පැවැති බැවින්, ලග්න වාසනාව ලොතරැයිපත වෙනුවෙන් පමණක් අමතර ශත 50 ක් ගෙවීමෙන් මණ්ඩලය අපේක්ෂා කළ එම ලොතරැයිපත් අලෙවිය ප්‍රවර්ධනය සිදුවී නොමැති බවට නිරීක්ෂණය විය. | මෙම කාල පරිච්ඡේදය තුළ ලග්න වාසනා ලොතරැයිපතෙහි අලෙවිය වර්ධන වේගයට සාපේක්ෂව අඩුවීමට හේතුව මෙම ලොතරැයිපතට පැවති වෙළඳපල තරඟකාරීත්වයයි. එනම්, එම ලොතරැයිපතෙහි ත්‍යාග රටාවට සමඟ සෘජුව තරඟ කිරීම සඳහා හඳුන්වාදෙන නමින් ලොතරැයිපතක් වැඩි අලෙවි නියෝජිත ප්‍රතිලාභ (අලෙවි නියෝජිතයින් සදහා සාමාන්‍ය කොමිස් මුදලට අමතර ශත 50 ක අමතර දිරි දීමනාවක් ලබා දීම) සහ ත්‍යාග ප්‍රතිශතය වැඩිකර (ලග්න සංකේත 02ක් මගින් පාරිභෝගිකයින් වෙත ත්‍යාග ලබා දීම) තරඟකාරී ආයතනය වෙළඳපලට ඉදිරිපත් කිරීම නිසා ලග්නා වාසනාව ලොතරැයිපතෙහි අලෙවියට සෘජුවම බලපාන ලදී. ලග්න වාසනා ලොතරැයිපතෙහි ලක්ෂ 10 ක් පමණ පැවති දෛනික අලෙවිය දිගටම පවත්වා ගෙන යාම සඳහා මෙම අමතර ශත 50 ලබා දෙන ලදී. |

# විගණන වාර්තාව 2022 සහ කළමනාකරණය විසින් ගෙන ඇති ක්‍රියාමාර්ගය

| විගණකාධිපති වාර්තාවේ සඳහන් කරුණු | කළමණාකරණය විසින් ගනු ලැබූ පියවර |
|---|---|
| (ii) හිටපු සභාපතිවරයෙකු විසින් 2008 අප්‍රේල් 22 දින පෞද්ගලික ආයතනයකින් රැගෙන ගොස් තිබුණු කැබ් රථයක් වෙනුවෙන් එම ආයතනය වෙත කැබ් රථයේ වටිනාකම සහ එම මුදලට අදාල නෛතික පොළිය ලෙස රු.14,923,369 ක් සහ නීතිඥ ගාස්තු ලෙස රු.245,000 ක් වශයෙන් එකතුව රු.15,168,369 ක් මණ්ඩලය විසින් ගෙවා තිබුණි. මේ සම්බන්ධයෙන් මණ්ඩලය විසින් පැවරූ නඩුව 2022 වර්ෂය අවසානය දක්වාම අවසන් වී නොතිබුණු අතර, මේ සම්බන්ධයෙන් මණ්ඩලය වෙනුවෙන් පෙනී සිටින ලද නීතීඥයන් වෙත රු.1,674,185 ක්ද මණ්ඩලය විසින් ගෙවා තිබුණි. ඒ අනුව මෙම සිදුවීම සම්බන්ධයෙන් 2022 වර්ෂය අවසානය දක්වා මණ්ඩලය දරා තිබුණු මුළු වියදම රු.16,842,554 ක් විය. | මණ්ඩලයට මිලදී ගන්නා ලද WP-PB 6024 කැබ් රථයක් හිටපු සභාපතිවරයෙකු රැගෙන ගොස් තිබීම නිසා වාහනය මිලදී ගත් ආයතනයට මණ්ඩලය මුදල් නොගෙවීම නිසා එම පෞද්ගලික ආයතනය විසින් සංවර්ධන ලොතරැයි මණ්ඩලයට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගැනීම හේතුවෙන් මණ්ඩලය විසින් එම ආයතනයට රු. 15,168,367 මුදලක් ගෙවීමට සිදු විය. එම නිසා කැබ් රථයේ වටිනාකම, නෛතික පොලිය, අදාල ආයතනයෙන් දැරූ නීතිඥ ගාස්තු හා මණ්ඩලයේ නීතිඥ ගාස්තුව ලෙස රු. 1,674,185 අලාභයක් මණ්ඩලයට සිදුව ඇත. මෙම මුදල අය කර ගැනීම සඳහා අවශ්‍ය නීතිමය ක්‍රියාමාර්ග නීතිපති දෙපාර්තමේන්තුවේ මගපෙන්වීම යටතේ ගෙන ඇති අතර මෙම නඩුවට අදාල පළමු අධිකරණ දිනය 2022.05.06 දින පැවති අතර, දෙවන අධිකරණ දිනය වශයෙන් 2023.04.07 වන දින පැවැත්විණි. |
| (iii) ලොතරැයි ත්‍යාග සඳහා ලබාදීමට සීමාසහිත ලංකා ස.තො.ස සමාගමෙන් මිලදීගෙන තිබූ වටිනාකම රු.592,500 ක් වූ ත්‍යාග වවුචර් පත් 123 ක් වර්ෂ 13 කට අධික කාලයක් කිසිදු කාර්යක් සඳහා භාවිතා නොකර පැවැතිණි. | ස.තො.ස ආයතනයෙන් ලැබිය යුතු රු.5,92,500/- ක වවුචර්පත් වටිනාකම සම්බන්ධයෙන් වෙළඳ අමාත්‍යංශයේ ලේකම්තුමිය විසින් නිකුත් කරන ලද 2021/04/05 සහ 2021/08/21 දෙදින ලිපි මගින් අදාල වටිනාකම සංවර්ධන ලොතරැයි මණ්ඩලය වෙත ගෙවන ලෙසට ලංකා ස.තො.ස ආයතනය දැනුවත් කර ඇතත් ඊට ප්‍රතිචාර දක්වා නොමැත.<br><br>මෙම තත්වය යටතේ අදාල වවුචර්පත් වටිනාකම නොගෙවීම සම්බන්ධයෙන් පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ අධ්‍යක්ෂ ජෙනරාල් වෙත ලිපියක් මගින් දැනුවත් කර ඇති අතර 2022/09/09 දින ලංකා ස.තො.ස ආයතනය යොමු කර ඇති ලිපියට අනුව දින 10 තුල අදාල වටිනාකම නිරවුල් කරන ලෙස දැනුවත් කර ඇතත් ඒ සඳහා කිසිදු ක්‍රියා මාර්ගයක් ලංකා ස.තො.ස ආයතනය ගෙන නොමැත.<br><br>වෙළෙඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යංශයේ අතිරේක ලේකම්තුමා විසින් ඉහත කී වවුචර්පත් මාස 6 දක්වා නැවත සක්‍රීය කර ගැනීමට හෝ ඉහත වටිනාකමට සමාන භාණ්ඩ ලංකා ස.තො.ස ආයතනයෙන් ලබා දීමට අවශ්‍ය කටයුතු සලසා දෙන ලෙස දන්වා ඇත.<br><br>මෙම වවුචර්පත් මාස 6 දක්වා නැවත සක්‍රීය කර දීමට ලංකා ස.තො.ස. ආයතනය එකඟ වූ නමුත් 2023/02/01 දින අදාල වවුචර්පත් ලංකා ස.තො.ස. ආයතනයට ඉදිරිපත් කලද ආපසු ගෙවීම මඟහරිමින් විවිධ හේතුන් පවසා වවුචර්පත් නැවත සක්‍රිය කර ලබා දිය නොහැකි බව ප්‍රකාශ කර ඇත.<br><br>මෙම තත්වය යටතේ අදාල ගැටළුව විගණන හා කළමණාකරන කමිටුව වෙත යොමු කල අතර කමිටුවේ තීරණය වූයේ මෙම ගැටළුව අධ්‍යක්ෂ මණ්ඩලය වෙත යොමු කල යුතු බවයි. ඒ අනුව ඒකී වවුචර්පත් වටිනාකම සම්බන්ධයෙන් රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්තුමා දැනුවත් කර දෙපාර්ශවය අතර සාකච්ඡා මාර්ගයෙන් විසඳුමකට ලබා ගන්නා ලෙස අධ්‍යක්ෂ මණ්ඩලය විසින් උපදෙස් ලබා දී ඇත.<br><br>අදාල කාරණය සම්බන්ධයෙන් මැදිහත් වී දෙපාර්ශවය අතර සාකච්ඡාවක් සංවිධානය කර ලබා දෙන ලෙස රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්තුමා වෙත 2023/03/28 දින ලිපියක් මගින් ඉල්ලීමක් කර ඇත. |

# විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය

| දෙසැම්බර් 31 න් අවසන් වූ වර්ෂය සඳහා | සටහන් | 2022<br>රු. | 2021<br>රු. |
|---|---|---|---|
| **ආදායම** | 01 | 19,071,456,751 | 15,364,398,498 |
| | | | |
| ටිකට්පත් පිරිවැය | 02 | 844,240,759 | 433,523,004 |
| ත්‍යාග ගෙවීම | 03 | 9,884,078,986 | 7,865,640,218 |
| දිනුම් ඇදීමේ පිරිවැය | 04 | 751,141,022 | 542,022,297 |
| | | | |
| **දළ ලාභය** | | 7,591,995,984 | 6,523,212,978 |
| | | | |
| වෙනත් ආදායම් | 05 | 320,846,644 | 110,304,701 |
| | | | |
| බෙදාහැරීමේ පිරිවැය | 06 | 4,487,324,271 | 3,484,491,585 |
| පරිපාලන වියදම් | 07 | 605,097,921 | 536,791,467 |
| | | | |
| **මෙහෙයුම් මුදල් වලින් පසු අතිරික්තය** | | 2,820,420,437 | 2,612,234,628 |
| | | | |
| මූල්‍ය පිරිවැය | 08 | 979,196 | 936,549 |
| | | | |
| ලබා නොගත් ත්‍යාග | | 447,150,260 | 342,230,480 |
| | | | |
| **බදු පෙර ලාභය** | | 3,266,591,501 | 2,953,528,558 |
| ආදායම් බදු | 09 | 55,904,459 | 83,440,185 |
| | | | |
| **බදු පසු ලාභය** | 10 | 3,210,687,041 | 2,870,088,373 |
| | | | |
| **වෙනත් විස්තීර්ණ ආදායම්** | | | |
| සේවක ප්‍රතිලාභ සැලසුම් නැවත මිනුම් කිරීම මත ලාභ/පාඩු | 17.1 | 9,112,463 | 5,863,008 |
| ප්‍රත්‍යාගණන අතිරික්තය | | 5,853,857 | |
| | | | |
| **වර්ෂය සඳහා මුළු විස්තීර්ණ ආදායම** | | 3,225,653,361 | 2,875,951,381 |

ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල අත්‍යාවශ්‍ය කොටසක් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වගකීමට බැඳී සිටියි. මෙම මූල්‍ය ප්‍රකාශන අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද අතර ඔවුන් වෙනුවෙන් අත්සන් කරන ලදී.

**ඩබ්.ඒ.වී.සී. සෝමරත්න**
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මුදල්)

**අජිත් ගුණරත්න නාරගල**
සභාපති/ප්‍රධාන විධායක නිලධාරී

**ජෙනට් ජයවර්ධන**
අධ්‍යක්ෂ

# මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

| දෙසැම්බර් 31 දිනට | සටහන් | 2022 රු. | 2021 රු. |
|---|---|---|---|
| **වත්කම්** | | | |
| **ජංගම නොවන වත්කම්** | | | |
| දේපල, පිරියත හා උපකරණ | 11 | 1,082,575,630 | 1,138,357,289 |
| ප්‍රාග්ධන නොනිමි වැඩ | 11 | 3,228,884 | 2,778,884 |
| අස්පෘශ්‍ය වත්කම් | 11 | 9,488,402 | 17,539,784 |
| **මුළු ජංගම නොවන වත්කම්** | | 1,095,292,917 | 1,158,675,958 |
| **ජංගම වත්කම්** | | | |
| තොග | 13 | 45,970,611 | 43,102,269 |
| වෙළෙඳ ණයගැතියෝ සහ වෙනත් ලැබිය යුතු | 14 | 163,480,972 | 150,441,764 |
| පූර්ව ගෙවීම් සහ තැන්පතු | 15 | 6,223,428 | 11,141,943 |
| ස්ථාවර තැන්පතු | 12 | 1,742,324,887 | 1,142,259,436 |
| මුදල් සහ මුදල් හා සමාන දෑ | 16 | 557,240,367 | 900,006,350 |
| **මුළු ජංගම වත්කම්** | | 2,515,240,265 | 2,246,951,762 |
| **මුළු වත්කම්** | | 3,610,533,182 | 3,405,627,719 |
| | | | |
| **ස්කන්ධය සහ වගකීම්** | | | |
| දායක කළ ප්‍රාග්ධනය | | | |
| ජනාධිපති අරමුදල | | 2,200,000 | 2,200,000 |
| මහපොළ භාර අරමුදල | | 2,200,000 | 2,200,000 |
| ත්‍යාග සංචිත ගිණුම | | 725,956,289 | 448,131,648 |
| ජනාධිපති අරමුදලට ගෙවිය යුතු | | 315,791,041 | 564,219,473 |
| ප්‍රත්‍යාගණන අතිරික්තය | | 620,583,095 | 614,729,237 |
| සේවක ප්‍රතිලාභ සැලසුම් නැවත මිනුම් කිරීම මත ලාභ/පාඩු | | 11,836,354 | 2,723,891 |
| **මුළු ස්කන්ධය** | | 1,678,566,779 | 1,634,204,250 |
| **ජංගම නොවන වගකීම්** | | | |
| සේවක ප්‍රතිලාභ වගකීම් | 17 | (4,438,730) | (9,372) |
| ගෙවිය යුතු අලෙවි නියෝජිත සහ බෙදාහැරීමේ අලෙවි නියෝජිත තැන්පතු | 18 | 38,718,881 | 37,664,881 |
| **මුළු ජංගම නොවන වගකීම්** | | 34,280,151 | 37,655,509 |
| **ජංගම වගකීම්** | | | |
| වෙළෙඳ සහ වෙනත් ගෙවිය යුතු | 19 | 771,026,177 | 640,706,596 |
| ගෙවිය යුතු ත්‍යාග | 20 | 1,003,306,515 | 962,793,104 |
| ගෙවිය යුතු ණය වට්ටර් | | 123,353,560 | 130,268,260 |
| **මුළු ජංගම වගකීම්** | | 1,897,686,252 | 1,733,767,960 |
| **මුළු හිමිකම් සහ වගකීම්** | | 3,610,533,182 | 3,405,627,719 |

ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල අත්‍යාවශ්‍ය කොටසක් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වගකීමට බැඳී සිටියි. මෙම මූල්‍ය ප්‍රකාශන අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද අතර ඔවුන් වෙනුවෙන් අත්සන් කරන ලදී.

**ඩබ්.ඒ.වී.සී.සෝමරත්න**
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මුදල්)

**අජිත් ගුණරත්න නාරගල**
සභාපති/ප්‍රධාන විධායක නිලධාරී

**ජෙනට් ජයවර්ධන**
අධ්‍යක්ෂ

# මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

| දෙසැම්බර් 31 න් අවසන් වූ වර්ෂය සඳහා | සටහන් | 2022 | 2021 |
|---|---|---|---|
| | | රු. | රු. |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් තුළින් මුදල් ප්‍රවාහ** | | | |
| බදු පෙර ලාභය | | 3,266,591,501 | 2,953,528,558 |
| | | | |
| **ගැළපීම්** | | | |
| ස්ථාවර වත්කම් මත අගය ක්ෂය කිරීම | | 76,864,509 | 85,621,228 |
| ත්‍යාග සංචිත ගිණුම | | 277,824,641 | (250,426,959) |
| පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන | | 9,482,677 | 8,787,447 |
| ගෙවන ලද පාරිතෝෂික | | (1,330,145) | (2,440,010) |
| පොලී ආදායම | | (276,451,109) | (101,048,159) |
| ස්ථාවර වත්කම් විකිණීමෙන් ලැබුණු ලාභය | | (485,143) | (2,000) |
| ගෙවන ලද ආදායම් බදු | | | (653,294) |
| ජනාධිපති අරමුදලට ගෙවන ලද මුදල් | | (3,459,115,473) | (2,991,728,983) |
| **කාරක ප්‍රාග්ධනය වෙනස් වීම්වලට පෙර මෙහෙයුම් ලාභය** | | (106,618,541) | (298,362,171) |
| | | | |
| **මෙහෙයුම් වත්කම්වල වැඩිවීම/අඩුවීම** | | | |
| බඩු තොග වැඩිවීම/අඩුවීම | | (2,868,343) | (10,511,637) |
| ණය ගැතියන් වැඩිවීම/අඩුවීම | | (8,696,537) | (57,379,665) |
| තැන්පතු සහ පෙර ගෙවීම් වැඩිවීම/අඩුවීම | | 4,918,515 | (2,944,565) |
| | | | |
| **මෙහෙයුම් වගකීම්වල වැඩිවීම/අඩුවීම** | | | |
| ණය හිමියන් වැඩිවීම/අඩුවීම | | 74,565,122 | 65,157,266 |
| ගෙවියයුතු ත්‍යාග වැඩිවීම/අඩුවීම | | 40,513,411 | 384,174,247 |
| ණය වවුචර් වැඩිවීම/අඩුවීම | | (6,914,700) | 14,982,220 |
| | | | |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් තුළින් සිදු වූ ශුද්ධ මුදල් ප්‍රවාහ** | | (5,101,074) | 95,115,695 |
| | | | |
| **ආයෝජන ක්‍රියාකාරකම් තුළින් සිදු වූ මුදල් ප්‍රවාහ** | | | |
| කාර්ය මණ්ඩලයට ලබා දුන් ණය ලැබීම් | | 22,222,066 | 26,027,222 |
| කාර්ය මණ්ඩලයට ලබාදුන් ණය | | (26,564,736) | (26,548,102) |
| ස්ථාවර වත්කම් එකතු කිරීම් (දේපළ, පිරියත සහ උපකරණ) | | (7,942,228) | (30,917,973) |
| ස්ථාවර වත්කම් විකිණීමෙන් ලැබූ ලාභය | | 649,759 | 2,000 |
| පොලී ආදායම | | 276,451,109 | 101,048,159 |
| ස්ථාවර තැන්පත්වල ආයෝජන | | (603,534,878) | 192,342,087 |
| බෙදාහැරීමේ අලෙවි නියෝජිත තැන්පතු වල වැඩි වීම | | 1,054,000 | 1,274,500 |
| **ආයෝජන ක්‍රියාකාරකම් තුළින් සිදු වූ ශුද්ධ මුදල් ප්‍රවාහ** | | (337,664,908) | 263,227,892 |
| | | (342,765,983) | 358,343,587 |
| | | | |
| මුදල් සහ මුදල් හා සමාන දෑ වැඩිවීම/අඩුවීම | | (342,765,983) | 358,343,587 |
| වර්ෂය ආරම්භයේදී මුදල් සහ මුදල් හා සමාන දෑ | | 900,006,350 | 541,662,763 |
| වර්ෂය අවසානයේදී මුදල් සහ මුදල් හා සමාන දෑ | 16 | 557,240,367 | 900,006,350 |
| | | | |
| බැංකුවේ ඇති මුදල -: ලංකා බැංකුව | | 264,588,741 | 347,366,305 |
| මහජන බැංකුව | | 288,958,323 | 544,886,006 |
| සම්පත් බැංකුව | | 3,139,750 | 7,297,345 |
| හැටන් නැෂනල් බැංකුව | | 544,150 | 447,290 |
| | | | |
| අත ඇති මුදල | | 9,404 | 9,404 |
| | | 557,240,367 | 900,006,350 |

# හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය

| දෙසැම්බර් 31 න් අවසන් වූ වර්ෂය සඳහා | ජනාධිපති අරමුදල සහ මහපොළ භාර අරමුදල | ත්‍යාග සංචිත ගිණුම | රඳවාගත් ඉපැයීම් | ප්‍රත්‍යාගණන සංචිතය | සේවක ප්‍රතිලාභ සැලසුම් නැවත මිනුම් කිරීම මත ලාභ/පාඩු | එකතුව |
|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| 2021.01.01 දිනට ශේෂය | 4,400,000 | 698,558,607 | 685,860,083 | 614,729,237 | (3,139,116) | 2,000,408,811 |
| 2021 වර්ෂය තුළ | | (250,426,959) | 2,870,088,373 | | | 2,619,661,414 |
| එකතු කිරීම් | | | | | | |
| ප්‍රත්‍යාගණන සංචිතය | | | | | 5,863,008 | 5,863,008 |
| ජනාධිපති අරමුදලට විසර්ජනය කිරීම | | | (2,991,728,983) | | | (2,991,728,983) |
| **2021.12.31 දිනට ශේෂය** | **4,400,000** | **448,131,648** | **564,219,474** | **614,729,237** | **2,723,892** | **1,634,204,250** |
| | | | | | | |
| 2022 වර්ෂය තුළ එකතු කිරීම් | | 277,824,641 | 3,210,687,041 | 5,853,857 | 9,112,462 | 3,503,478,003 |
| වර්ෂය සඳහා ජනාධිපති අරමුදලට ගෙවීම් | | | (3,459,115,473) | | | (3,459,115,473) |
| **2022.12.31 දිනට ශේෂය** | **4,400,000** | **725,956,289** | **315,791,041** | **620,583,095** | **11,836,354** | **1,678,566,779** |

# ගිණුම්කරණ ප්‍රතිපත්ති

## 1. වාර්තාකරණ ආයතනය

සංවර්ධන ලොතරැයි මණ්ඩලය 1997 අංක 20 දරණ සංවර්ධන ලොතරැයි මණ්ඩල පනත යටතේ සංස්ථාගත කරන ලදී. මණ්ඩලයේ ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය අංක 356, ආචාර්ය කොල්වින් ආර් ද සිල්වා මාවත, යූනියන් පෙදෙස, කොළඹ 02 වේ. මෙම වර්ෂය තුළ දී මණ්ඩලයේ ප්‍රධානතම ක්‍රියාකාරකම වූයේ ලොතරැයි අලෙවි කිරීමයි.

## 2. සකස් කිරීමේ පදනම

### 2.1. අනුකූලතා ප්‍රකාශනය

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනය විසින් නිකුත් කරන ලද, මෙහි මින් මතු SLFRS/LKAS යනුවෙන් හඳුවන්වනු ලබන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට සහ ශ්‍රී ලංකා රජයේ මුදල් රෙගුලාසි වල සහ පරිපාලන රෙගුලාසි වල සඳහන් නියමයන්ට අනුකූලව මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කර ඇත.

### 2.2. මිනුම් කිරීමේ පදනම

පහතින් දක්වා ඇති පරිදි හැරෙන්නට මෙම මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය පදනමින් සකස් කර ඇත:

**ස්ථාවර තැන්පතු මත ආයෝජන**
- සාධාරණ වටිනාකමට

**ඉඩම් සහ ගොඩනැගිලි**
- ප්‍රත්‍යාගණනය කළ වටිනාකමට

**පාරිතෝෂිත සඳහා වෙන්කිරීම්**
- පාරිතෝෂිත සූත්‍රය සහ නිර්වචිත ප්‍රතිලාභ බැඳීමෙහි වර්තමාන වටිනාකමට

### 2.3. ක්‍රියාකාරී සහ ඉදිරිපත් කිරීමේ මුදල් ඒකකය

ශ්‍රී ලංකා රුපියල් වලින් ඉදිරිපත් කර ඇති සියලුම මූල්‍ය තොරතුරු ආසන්න රුපියලට වටයා ඇත.

### 2.4. නිකුත් කිරීම සඳහා අවසර ලබා දුන් දිනය

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වන මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීමට 2023 පෙබරවාරි 23 වැනි දින අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමැතිය දී ඇත.

### 2.5. ඇස්තමේන්තු හා විනිශ්චයන් යොදා ගැනීම

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා කළමනාකාරිත්වය විසින් ගිණුම්කරණ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමට සහ වාර්තා කරනු ලබන වත්කම්, වගකීම්, ආදායම් සහ වියදම් ප්‍රමාණයන්ට බලපාන විනිශ්චයන්, ඇස්තමේන්තු සහ උපකල්පන සිදු කළ යුතු වේ. විනිශ්චයන් සහ ඇස්තමේන්තු ඓතිහාසික අත්දැකීම් සහ පවතින වාතාවරණයන් යටතේ සාධාරණ යැයි විශ්වාස කෙරෙන අපේක්ෂාවන් ද ඇතුළු අනෙකුත් සාධක මත පදනම්ව සිදු කර ඇත. එබැවින් සැබෑ ප්‍රතිඵල මෙම විනිශ්චයන් හා ඇස්තමේන්තු වලට වඩා වෙනස් විය හැකිය.

ඇස්තමේන්තු සහ පාදක වී ඇති උපකල්පන අඛණ්ඩ පදනමකින් සමාලෝචනය කරනු ලැබේ. ඇස්තමේන්තු සංශෝධනය කරනු ලබන කාල පරිච්ඡේදය තුළ සහ එය බලපාන ඕනෑම අනාගත කාල පරිච්ඡේදයක් තුළ ගිණුම්කරණ ඇස්තමේන්තු සඳහා වන සංශෝධන හඳුනා ගනු ලැබේ.

### 2.6. ප්‍රමාණවත් බව හා සමාහරණය

මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 01 ට අනුකූලව සෑම සමාන අයිතම වර්ගයක් ම මූල්‍ය ප්‍රකාශනවල වෙන වෙනම ඉදිරිපත් කරනු ලැබේ. ස්වභාවයෙන් හෝ කාර්යයෙන් අසමාන අයිතම ද ප්‍රමාණාත්මක නම් ඒවා වෙන වෙනම ඉදිරිපත් කරනු ලැබේ. හඳුනාගන්නා ලද ප්‍රමාණයන් හිලව් කිරීම සඳහා නීත්‍යානුකූලව හිලව් කළ හැකි අයිතියක් ඇති විට සහ ශුද්ධ පදනමකින් පියවීම සඳහා හෝ එක විට වත්කම උපලබ්ධි කර වගකීම පියවීමට අභිප්‍රායයක් ඇති විට පමණක් මූල්‍ය වත්කම් සහ මූල්‍ය වගකීම් හිලව් කර ශුද්ධ අගය මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ වාර්තා කරනු ලැබේ. කිසියම් ගිණුම්කරණ ප්‍රමිතියක් හෝ අර්ථ නිරූපණයක් මගින් නියම කර හෝ අවසර දී ඇත්තේ නම් මිස, සහ ගිණුම්කරණ ප්‍රතිපත්තිවල විශේෂිත වශයෙන් අනාවරණය කර ඇති පරිදි, ආදායම සහ වියදම් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයෙහි හිලව් නොකරනු ලැබේ.

### 2.7. ආදායම් බදු

